SRI LANKA
NEXT
නීලහරිත යුගයක්
நீலப்பசுமை யுகம் • THE BLUEGREEN ERA

නීල හරිත ශ්‍රී ලංකා

ශ්‍රී ලංකාවේ හරිත ගොඩනැගිලි ප්‍රමිතීන්

රාජ්‍ය අංශයේ ඉදිකෙරෙන නව ගොඩනැගිලි සඳහා හරිත තත්ත්වය මැන බැලීමේ ක්‍රමවේදය

ප්‍රථම මුද්‍රණය
ජනවාරි 2017

LIBRARY
MINISTRY OF ENVIRONMENT

SRI LANKA
NEXT
නීලහරිත යුගයක්
நீலப்பசுமை யுகம் • THE BLUEGREEN ERA

නීල හරිත ශ්‍රී ලංකා

ශ්‍රී ලංකාවේ හරිත ගොඩනැගිලි ප්‍රමිතීන්

රාජ්‍ය අංශයේ ඉදිකෙරෙන නව ගොඩනැගිලි සඳහා හරිත තත්ත්වය මැන බැලීමේ ක්‍රමවේදය

ප්‍රථම මුද්‍රණය
ජනවාරි 2017



අතිගරු ජනාධිපතිතුමාගේ පණිවිඩය

සොබාදහම අසීමිත සම්පත් ලබාදෙන ප්‍රභවයක් ලෙස පැවති ප්‍රවාදය ඉකුත් සියවස තුළම නිශ්ප්‍රභ විය. එබැවින් පරිසරය සමග වන අපගේ නොනිමි ගනුදෙනුව විද්‍යාත්මක ක්‍රමවේදයක සිට මෙහෙයවීමට ඉතිහාසය අපට බලකොට ඇත. පෙර අප අත්නොදුටු කඳු නාය යෑම්, මහ ගංවතුර අපට සිහිකැඳවන්නේ, මිනිසාට සොබාදහම හැසිරවිය හැකි සීමාව උපරිමය කරා ලංව ඇති බවකි.

මේ සිහිකැඳවීම ගැඹුරින් වටහාගනිමින් ශ්‍රී ලංකාවේ ස්වාභාවික පරිසරය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් ඇරඹි "පුනරුදය" පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන පුළුල් ක්ෂේත්‍ර ඔස්සේ විමසිලිමත් වෙමින් පරිසර සංරක්ෂණයෙහිලා අප ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ අප වෙත ඉදිරිපත් කොට ඇත.

අද එළිදැක්වෙන හරිත ගොඩනැගිලි මාර්ගෝපදේශ සංග්‍රහය අයත් වන්නේ ඒ යටතටය.

ඉදිකිරීම් ක්ෂේත්‍රය විසින් මහා පරිමාණයෙන් භාවිතයට ගන්නා වැලි, දැව, පාෂාණ සහ ජලය තවදුරටත් අසීමිත සම්පත් නොවන බැවින් ඒවා භාවිතයේදී උපරිම කළමනාකරණයටත් විකල්ප සොයා යාමටත්, සුළං, හිරුඑළිය වැනි පුනර්ජනනීය ප්‍රභවයන් භාවිතයෙන් බලශක්තිය කළමනාකරණය කරගැනීමටත් මෙයින් මගපෙන්වනු ඇත. ආරම්භයේදී රජයේ ගොඩනැගිලි ඉදිකිරීම් වෙත සැපයෙන මෙම මාර්ගෝපදේශ විසින් පරිසර හිතකාමී හරිත ගොඩනැගිලි ක්‍රමවේදය ශ්‍රී ලාංකීය ජීවන විලාසිතාවක් බවට පත්වනු ඇතැයි යන්න අපගේ විශ්වාසයයි.

මෙම සද් අරමුණු වෙනුවෙන් කාර්යක්ෂමව වෙහෙසෙන මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය, මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ නාගරික සංවර්ධන අධිකාරිය, ජනාධිපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන "පුනරුදය" පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන ඇතුළු ආයතනවල ලොකු කුඩා සියලු නිලයන් වෙත මගේ ප්‍රශංසාව පළ කරන අතර ඔබගේ උත්සාහය මල්පල ගැන්වී හරිතවත් නුවරක නිවස්නා භාග්‍ය අප හැමට හිමිවේවායි පතමි.

මෛත්‍රීපාල සිරිසේන

2016 දෙසැම්බර් මස 15 වන දින



ගරු මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගේ පණිවිඩය

මානව ශිෂ්ඨාචාර මංපෙතේ මුල් එඬේර යුගයෙන් පසු අත්කරගත් එක් සුවිශේෂී කඩඉමක් ලෙස වාසස්ථාන ඉදිකිරීම හඳුන්වාදිය හැකි අතර පරිසරයට අනුගතව, අහිතකර පරිසර සාධක තරණය කිරීම මෙම ගොඩනැගිලිවල එක් මූලික අරමුණක් විය.

වර්තමානය වනවිට මිනිසාගේ අවශ්‍යතාවයන් ප්‍රමාණය ඉක්මවා ඉටුකරගැනීම සඳහා පුනර්ජනනීය සම්පත් සීමා රහිතව ගොඩනැගිලි සඳහා භාවිතා කිරීම තුලින් ආපසු හැරවිය නොහැකි පරිසර ගැටළු රාශියක් පැන නැගී ඇත. මෙම ගැටළුවට එක්තරා පිළියමක් වශයෙන් මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය විසින් ආරම්භ කර ඇති හරිත හා පරිසර හිතකාමී ගොඩනැගිලි මාර්ගෝපදේශ පිළියෙල කිරීම තිරසාර සංවර්ධනය සඳහා දැඩි අවශ්‍යතාවයක් වේ. ජාතික ආයතනික ව්‍යුහය සැකසීම අනුව මෙම මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයට අයත් නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදුකිරීම යුගයේ අවශ්‍යතාවයක් ලෙස දකිමි.

ගොඩනැගිලි ජීවන චක්‍රය තුල අමුද්‍රව්‍ය සැපයීම මෙන්ම ගොඩනැගිලි ඉදිකිරීම, පවත්වාගෙනයාම හා කඩාබිඳ දැමීම දක්වා වූ සමස්ත ක්‍රියාවලිය තුල බලශක්තිය, ජලය, අමුද්‍රව්‍ය භාවිතය කාර්යක්ෂම කර ගෝලීය උෂ්ණත්වය වැඩිවීම නිසා ඇතිවන බලපෑම අවම කිරීම හා ගෘහස්ත පරිසර තත්ත්වයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම පොදුවේ "හරිත ගොඩනැගිලි සංකල්පය" ලෙස හැඳින්විය හැකිය. තාපය එහා මෙහා ගමන්කළ හැකි සවිවර මැටි බිත්ති, වායුසමනය සඳහා උස් පියසි හා මැද මිදුල්, ගිනිහල්ගෙය හා වැසිකිළි කැසිකිළි වෙනම ගොඩනැගීම ආදී පරිසර හිතකාමී ලක්ෂණ සහිත පැරණි ශ්‍රී ලාංකික ගොඩනැගිලි පරිසරය හා එකගතාවයන් තුල ද්‍රව්‍ය නැවත පරිසරයට උරාගත හැකි ආකාරයට සැකසී තිබුණද, වර්තමානයේදී එවැනි ව්‍යුහවලින් ලද සේවාවන් සියල්ල මිල අධික හා පරිසර හිතකාමී නොවන ආකාරයට ලගාකර ගැනීමට පෙළඹ ඇත. මේ නිසා ගොඩනැගිලි කර්මාන්තය තිරසර නොවන මට්ටමකට ලගාවී ඇත. ආර්ථික සංවර්ධනය පිණිස ගොඩනැගිලි කර්මාන්තය සඳහා පරිසරයෙන් සම්පත් වැඩිපුර ලබාගැනීමටයාම නිසා පරිසරයේ සිදුවන බිඳවැටීම් අහිතකර විය හැක්කේ බිඳවැටුනු ආර්ථිකයක් යලි ගොඩනැගීමට හැකි වුවත් බිඳවැටුනු පරිසර පද්ධතියක් යලි ගොඩනැගීම ඉතාමත් අසීරු කරුණක් වන නිසාවෙනි.

හරිත ගොඩනැගිලි කර්මාන්තයේ පදනම අවසන් නිෂ්පාදනය ගැන පමණක් අවධානය යොමුකර එයට මිල නියම කිරීම, වටිනාකම ලබාදීම හා කාර්යක්ෂමතාවය මැනීම පමණක් නොවේ. එහිදී පරිසරයෙන් සම්පත් ගෙන නිෂ්පාදනය, පරිභෝජනය, ඉවතලීම හා පරිසර ප්‍රතිස්ථාපනය යන සක්‍රීය ක්‍රියාදාමයම වටිනාකමට ලක්කළ යුතුය. මෙම අවශ්‍යතාවයන් ඉටුකිරීම සඳහා යෝජිත හරිත හා පරිසර හිතකාමී ගොඩනැගිලි මාර්ගෝපදේශ සංග්‍රහය ඉවහල්වනු ඇතැයි සිතමි.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහය රාජ්‍ය ආයතන ගොඩනැගිලි සඳහා පළමුවෙන්ම යොදාගැනීමට සැලසුම්කර ඇත. මේ තුලින් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැක්කේ රාජ්‍ය සේවකයින් හා ආශ්‍රිත පුරවැසියන් දේශගුණික විපර්යාස මත වෙනස්වන ලෝකයේ පාරිසරික තත්ත්වයන් සමග ගැලපිය හැකි හරිත ගොඩනැගිල්ලේ සිට හරිත නගර හරහා හරිත ආර්ථිකයක් දක්වාවූ ශ්‍රේණියක් පිළිබඳ මනා දැනුවත් කිරීමක් තුලින් "සරල දිවිපෙවතක්" සඳහා වූ ආකල්ප වර්ධනය කර ක්‍රියාත්මකවීම තුලින් බව පැහැදිළිය. මේ සඳහා අවශ්‍ය ක්‍රියාකාරී සහාය ප්‍රවර්ධනය, ආයතනික හා නීතිමය කේන්ද්‍ර හරහා මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන තුලින් ලබාදීමට කටයුතු කරමි.

පාඨලී චම්පික රණවක
මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය



මහවැලි සංවර්ධන සහ පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ වර්තමාන රජයේ ප්‍රතිපත්තීන් අනුව අතිගරු ජනාධිපතිතුමාගේ පරිසරය පිළිබඳ විශේෂ වැඩසටහනක්වන “පුනරුදය” වැඩසටහනේ අන්තර්ගත හරිත ගොඩනැගිලි සංකල්පය ප්‍රධානතම ස්ථානයක් ගැනෙනු ඇත. ධරණීය සංවර්ධනය අරමුණුකොට ගෙන හරිත ගොඩනැගිලි සංකල්පය ඉදිකිරීම් කර්මාන්තයේ දැඩි අවධානයට යොමු වී තිබීම පැහැදිලිය.

හරිත ගොඩනැගිලි සංකල්පය රටක අනාගත පරපුර වෙනුවෙන් ධරණීය සංවර්ධනයත් සමගම ස්වභාවික සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් යෙදවීම සිදුවන අතර වාසස්ථාන ගොඩනැගීම තුලින් පරිසරයට සහ මානව ප්‍රජාවට වන අහිතකර බලපෑම අවම කරනු ලැබේ. ලෝක ප්‍රජාවගේ පෙලඹවීමත් සමග
ශ්‍රී ලංකාවේද හරිත ගොඩනැගිලි ඉදිකිරීමේ නව ප්‍රවනතාවයක් වර්තමානයේ දක්නට තිබේ. මෙම ප්‍රවණතාවය යථාර්තයක් කිරීම සඳහා ගොඩනැගිල්ලක් හරිත ගොඩනැගිලි නිර්මාණයේදී හඳුනාගත් ප්‍රමිතිගත මාර්ගෝපදේශ මාලාවක් අනුගමනය කළ යුතු වේ.

එසේම ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා සහ මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යතුමාගේ නායකත්වය යටතේ මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය, අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සංස්ථා, ආයතන සහ විශ්ව විද්‍යාල යනාදියෙහි විශාල සහයෝගයත් සමගින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවල ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ හරිත ගොඩනැගිලි සංකල්පය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම පියවර ගැනීම ඉතාමත් සතුටට කරුණකි.

මෙම සුවිශේෂී ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවල ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වූ හරිත හා පරිසර හිතකාමී ගොඩනැගිලි මාර්ගෝපදේශ සංග්‍රහය සැකසීමට අපට හැකිවිය. අනාගතයේදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවල ගොඩනැගිලි ඉදිකිරීම්වලදී කාර්යක්ෂම බලශක්ති භාවිතය, අවම අපද්‍රව්‍ය බැහැරවීම සහ සුවදායී වාසස්ථානයක්වීම යන අරමුණු ඉටුකර ගැනීමේ බලාපොරොත්තුව මෙම මාර්ගෝපදේශ සංග්‍රහය එළිදැක්වීමේ වැදගත් කඩඉමක් වේ.

පරිසර හිතකාමී සහ ධරණීය සංවර්ධනයට සහායවන සුබදායී ආයෝජනයක් වන ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවල ගොඩනැගිලි සඳහා වූ මෙම මාර්ගෝපදේශ සංග්‍රහය ක්‍රියාත්මක කිරීම යුගයේ අවශ්‍යතාවයක් ලෙස දකිමි.

අනුරාධ ජයරත්න
මහවැලි සංවර්ධන සහ පරිසර නියෝජ්‍ය අමාත්‍ය



ජනාධිපති ලේකම්තුමාගේ පණිවිඩය

අතිගරු ජනාධිපතිතුමාගේ සුවිශේෂී අවධානය යොමුව ඇති ජාතික වැඩසටහන් හතරක් ජනාධිපති කාර්යාලයේ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශය යටතේ ක්‍රියාත්මකවන අතර "පුනරුදය" පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ඇතුලු අමාත්‍යාංශ හා ආයතන ගණනාවක සහයෝගයෙන් ක්‍රියාත්මක කරනු ලැබේ.

දිනෙන් දින අපි අභිමුව ඇතිවන පාරිසරික ගැටළු මෙන් ම ස්වභාවික සම්පත් ක්ෂය වීමේ තත්වයන් ද සලකා බලන කල පරිසරයට අවම හානියක් සිදුකරමින් පරිසරයේ ඇති ස්වාභාවික සම්පත් තිරසර ලෙස පරිහරණය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට කාලය එළඹ ඇත . මෙහිලා ගොඩනැගිලි ඉදිකිරීමේදී දැනට පවතින ක්‍රමවේදවලින් ඉවත්ව හරිත සංකල්ප අනුගමනය කිරීම අත්‍යවශ්‍ය කාරණයකි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට ජනාධිපති කාර්යාලය මගින් හරිත ගොඩනැගිලි මාර්ගෝපදේශ සංග්‍රහයක් එළිදැක්වීම සඳහා අවශ්‍ය මූල්‍යමය දායකත්වය ලබා දීමට කටයුතු කර ඇත. ඒ අනුව සකස් කරන ලද හරිත මාර්ගෝපදේශ සංග්‍රහයේ, ගොඩනැගිලි සැලසුම් කිරීමේදී ඉදිකිරීමේදී නඩත්තු කිරීමේදී මෙන් ම කඩාබිඳදැමීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග අන්තර්ගත කොට ඇති අතර එම මාර්ගෝපදේශ ක්‍රියාවට නැංවීම තුළින් ස්වාභාවික සම්පත් ආරක්ෂා කර ගැනීමටත්, පරිසරය ආරක්ෂා කර ගැනීමටත් අපට හැකි වනු ඇත.

මෙම අවස්ථාවේ එළිදක්වන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව අනාගතයේදී පරිසර හිතකාමී ගොඩනැගිලි සංකල්පය රාජ්‍ය ආයතනවලින් ඔබ්බට ගොස් පෞද්ගලික අංශයේ ආයතනවල ද ක්‍රියාත්මකවනු දැකීම මාගේ අපේක්ෂාවයි. එය අප රට පරිසර දූෂණයෙන් තොර හරිතවත් රටක් බවට පත්කිරීමට දායකවනු නොඅනුමානය.

පී.බී. අබේකෝන්
ජනාධිපති ලේකම්



මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

පරිසර හිතකාමී හරිත ගොඩනැගිලි 2017 වර්ෂයේ සිට ඉදිකිරීම හා පවත්වාගෙනයාමට උපකාරීවන "හරිත ගොඩනැගිලි මාර්ගෝපදේශ සංග්‍රහය" එළිදක්වන අවස්ථාවේ දී මෙම පණිවිඩය නිකුත් කිරීමට ලැබීම පිළිබඳව සතුටුවෙමි.

දේශගුණ විපර්යාස හා පරිසරයට සිදුවන හානී පිළිබඳව විශාල වගකීමක් මානව වර්ගයා වෙත පැවැරී ඇත. වැඩිවන ජනගහනය හා ඒ හා සම්බන්ධ ආර්ථික ක්‍රියාකාරකම් හේතුවෙන් ගෝලීය උෂ්ණත්වය ඉතාමත් අහිතකර ලෙස වැඩිවීමේ ප්‍රවණතාවයක් දක්නට ඇති අතර ඒ හා සමගාමී අහිතකර බලපෑම් තුළින් පරිසරයට හා සියළුම ජීවීන්ගේ පැවැත්මට විශාල තර්ජනයක් එල්ල වී ඇත. පරිසරයට හානිකර තම ක්‍රියාකාරකම්වල අහිතකර ප්‍රතිඵල මේ වන විටත් මානව වර්ගයා භුක්ති විඳිමින් සිටී. එහෙයින් ආර්ථිකසංවර්ධනය පරිසර හිතකාමී තිරසාර සංවර්ධනයක් බවට පත්කර ගැනීම අතිශය වැදගත්වේ.

දුරාතීතයේ සිට මානවයා තම පැවැත්මට බාධාකළ ස්වභාවික පරිසරයේ ඇතිවූ විවිධ ගැටළු හා අපහසුතා මගහැරවීම සඳහා වාසස්ථාන ඉදිකිරීමට පෙළඹුණු අතර පසුකාලීනව එය සුවපහසුව හා ආරක්ෂාව සඳහා පමණක් නොව තම වත්කම් හා හැකියාවන් ප්‍රදර්ශනය කිරීමේ මෙවලමක් වශයෙන්ද භාවිතයට පෙළඹුණි. මෙම ක්‍රියාදාමයේදී ස්වභාවික සම්පත් අසීමිත ලෙස භාවිතා වූ අතර එමගින් බිහිවූ බොහොමයක් ගොඩනැගිලි සූර්යාලෝකය හා ස්වභාවික වාතාශ්‍රයෙන් තොර වූ අතර ඒ වෙනුවට කෘත්‍රිම ආලෝකය, වායු සමීකරණ හා කෘත්‍රිම තාප පාලන ක්‍රම ආදිය උපයෝගී කර ගැනීම හේතුවෙන් පාරිසරික, ආර්ථික මෙන්ම තාක්ෂණික ගැටළු රාශියකට මුහුණපෑමට සිදු වී ඇත.මේ හේතුවෙන් ජන ජීවිතයට සිදුවන හානිය අවම කිරීම සඳහා 2015 වර්ෂයේදී ඇතිකරගත් "පැරිස් ගිවිසුමට" අනුවඅතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කළ "නීලහරිත"සංකල්පයේ ප්‍රධාන අංගයක් ලෙස හරිත ගොඩනැගිලි ඉදිකිරීම දේශගුණ විපර්යාසයන්ට අනුහුරුවීමේ ප්‍රධාන ක්‍රමවේදයක් වශයෙන් යොදාගැනීමට තීරණය කෙරිණි.

අද වනවිට ශ්‍රී ලංකාවේද සීඝ්‍ර ජනගහන වර්ධනයත් සමග නිවාස සහ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ගල්, වැලි, බොරළු වැනි ස්වභාවික සම්පත් අසීමිත ලෙස යොදාගනු ලබයි. එබැවින් අනාගත පරපුරේ භාවිතය සඳහාද මෙම සම්පත් ආරක්ෂා කල යුතු නිසා ඒවා තිරසර ලෙස භාවිතයට යොමුවීම ඉතාමත් අත්‍යවශ්‍ය කටයුත්තක්වී ඇත.

තිරසාර සංවර්ධන ඉලක්ක ලහාකර ගැනීම උදෙසා අද වන විට නව්‍යකරණ ක්‍රමවේදවල අවශ්‍යතාවය මැනවින් පිළිබිඹුවේ. එබැවින් ඉදිරි පරපුර සඳහා මිහිතලයේ පැවැත්ම සහතික කිරීම උදෙසා ගොඩනැගිලි ක්ෂේත්‍රයේ අහිතකර බලපෑම් සමනය කිරීමත්, සම්පත් කාර්යක්ෂමව උපයෝගී කිරීමත් අරමුණු කර ගනිමින් ගෝලීය මට්ටමින් මෙම හරිත ගොඩනැගිලි හෙවත් තිරසර ගොඩනැගිලි සංකල්පය බිහී වී ඇත.

"පුනරුදය" තුන් අවුරුදු පරිසර සංරක්ෂණජාතික වැඩසටහනෙහි හදුනාගත් එක් වැඩසටහනක් ලෙස නගර හා ගොඩනැගිලි නිර්මාණයේදී හරිත සංකල්ප ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදුකිරීම යටතේ රාජ්‍ය ආයතනවල ගොඩනැගිලි, පුළුල් ලෙස පරිසර හිතකාමී හරිත ගොඩනැගිලි ලෙස 2017 වර්ෂයේ සිට ඉදිකිරීම හා පවත්වාගෙනයාමට මෙම මාර්ගෝපදේශ සංග්‍රහය රුකුලක්වනු ඇතැයි විශ්වාස කරමි. මෙම සංකල්පය ගොඩනැගිලි ක්ෂේත්‍රයට අදාළ සියළුම අංශයන්ගේ අවධානයට යොමුවිය යුතු බව මාගේ හැඟීමයි.

උදය ආර්. සෙනෙවිරත්න
මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ ලේකම්



මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

සියවස් ගණනාවක් තුල ශිෂ්ඨාචාරයේ ප්‍රගමනය සමඟ අවට පරිසරයෙන් ලබාගත් අමුද්‍රව්‍ය වලින් ඉදිකරන ලද ඉතා සරල වාසස්ථානවල සිට ලොවපුරා නිෂ්පාදිත අමුද්‍රව්‍ය යොදා මහල් සහිත ගොඩනැගිලි සංකීර්ණ වලින් සමන්විත මහානගර දක්වා ඉංජිනේරු හා අදාල අනෙකුත් විෂය දැනුම තුලින් ඉදිකිරීම් ක්ෂේත්‍රය අද්විතීය ලෙස ඉදිරියට පැමිණ ඇත. මෙයට අනුලෝමව මානවයාගේ අධික සුඛවිහරණය හේතුකොටගෙන පරිසරයෙන් සීමාව ඉක්මවා අමුද්‍රව්‍ය ලබා ගැනීම, ස්වභාවික පරිසර සේවාවන් සියල්ල මිල අධික පරිසර හිතකාමී නොවන තාක්ෂණයන්ට පැවරීම සමඟ අහිතකර ගොඩනැගිලි සහලක්ෂණ (Sick Building Syndrome) වැනි රෝග තත්ත්වයන් ඇතිකරමින් පරිසරයට සිදුවන බලපෑම්ද වැඩිවී ඇත. අඩුවැඩි වශයෙන් සියයට 30ක, 40ක හරිතාගාර වායු විමෝචනයකට වගකියන ඉදිකිරීම් ක්ෂේත්‍රය මගින් මානව පැවැත්මට අභියෝග කරන මෙවැනි තත්ත්වයක් තුල තවදුරටත් මේ මිහිතලයේ පැවැත්ම සඳහා මග පෙන්වන එක් වැදගත් කාර්යභාරයක් ලෙස හරිත හා පරිසර හිතකාමී ගොඩනැගිලි මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙලකර ක්‍රියාත්මක කිරීම පෙන්වා දියහැක.

සම්පත් හා අමුද්‍රව්‍ය භාවිතය කාර්යක්ෂම කිරීම සමඟ ගෘහස්ත පරිසර දූෂණය හා පරිසරයට සිදුකරන බලපෑම් අවමකරමින් සිදුකරන ඉදිකිරීම් සඳහා මගපෙන්වන හරිත හා පරිසර හිතකාමී ගොඩනැගිලි මාර්ගෝපදේශ සමස්තයක් වශයෙන් මෙරටට හඳුන්වා දීමට ඉවහල් වූ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ දායකත්වය අගේකොට සලකමි. මෙම මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම පරිසර සංරක්ෂණ හා සම්පත් භාවිතය කාර්යක්ෂම කිරීමට අදාල සිවිල්, විදුලි හා රසායනික ඉංජිනේරු ශිල්පක්‍රම සියල්ල සමඟ අනෙකුත් අදාල විෂයානුබද්ධ දැනුම කැටිකොට මෙම අමාත්‍යාංශය යටතේ පවතින නාගරික සංවර්ධන අධිකාරියේ මෙහෙයවීමෙන් සිදුකිරීමට බලාපොරොත්තු වෙමි.

හරිත හා පරිසර හිතකාමී ගොඩනැගිලි මාර්ගෝපදේශ තුලින් මිහිතලය ආරක්ෂාකර ගැනීම යථාර්තයක් බවට පත්කර ගැනීම සඳහා අනිවාර්යය අවශ්‍යතාවයක් වනමානව ආකල්ප වර්ධනය කිරීම පිණිස වූ සඵල දැනුවත් කිරීම තුලින් ජන සමාජයේ සියලු ස්ථර වල ජනතාව පෙලගැස්වීම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ වගකීමක් ලෙස සලකමි. මෙම මාර්ගෝපදේශ තුලින් හරිත ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට දායකත්වය ලැබෙවායි ප්‍රාර්ථනා කරමි.

ඉංජිනේරු නිහාල් රූපසිංහ

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්

- පටුන -

		පිටු අංකය
හැඳින්වීම		i
ක්‍රියාවලිය		ii
ලකුණු සාරාංශය		**1-2**
EE	**බලශක්ති කාර්යක්ෂමතාවය**	**3-13**
EE1	ආලෝකය සපයන උපකරණ කලාපකරණය	3- 4
EE2	විදුලි උප මැනුම්	5
EE3	පුනර්ජනනීය බලශක්තිය	6-7
EE4	උසස් බලශක්ති කාර්යක්ෂමතා කාර්යය සාධනය	8
EE5	විදුලි ආලෝකකරණයේ කාර්යක්ෂමතාවය	9
EE6	බලසාධක නිවැරදි කිරීම	10
EE7	බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම	11-12
EE8	තිරසාර නඩත්තුව	13
SM	**තිරසර භූමි සැලසුම්කරණය හා කළමනාකරණය**	**14-30**
SM	භූමිය තෝරාගැනීම	14-15
SM2	අතහැර දැමූ (Brown field) භූමි ප්‍රතිසංවර්ධනය	16
SM3	සංවර්ධන ඝනත්වය සහ ප්‍රජා සම්බන්ධීකරණය	17-18
SM4	පරිසර කළමනාකරණය හා පරිසර ආරක්ෂණ සැලැස්මක් සකස් කිරීම	19
SM5	භූමියේ හරිත ආවරණ ස්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම	20
SM6	ඉදිකිරීම් ක්‍රියාවලියේදී දූෂණය පාලනය කිරීම	21
SM7	ගොඩනැඟිලි ඉදිකිරීම්හි ගුණාත්මක තත්ත්වය ළඟා කර ගැනීම	22
SM8	සේවක පහසුකම්	23
SM9	පොදු ප්‍රවාහන ප්‍රවේශය සහ පෞද්ගලික වාහන භාවිතය අවම කිරීම	24-25
SM10	වාහන නැවැත්වීමේ ධාරිතාවය	26
SM11	වැසි ජල සැලසුම් - ප්‍රමාණය සහ තත්ත්ව පාලනය	27
SM12	හරිත ආවරණ සහ පියසි	28-29
SM13	ගොඩනැඟිලි භාවිතාකරන්නන් සඳහා අත්පොත	30

MR	**ගොඩනැඟිලි ද්‍රව්‍යය සහ සම්පත්**	**31-42**
MR1	ද්‍රව්‍යය නැවත භාවිතය සහ තෝරා ගැනීම	31-32
MR2	ප්‍රතිචක්‍රීකරණය කරන ලද දෑ අඩංගු ද්‍රව්‍යය	33-34
MR3	ගොඩනැඟිලි නැවත භාවිතය	35
MR4	ගොඩනැඟිලි සඳහා කලාපීය ද්‍රව්‍යය භාවිතය	36-37
MR5	තිරසර දැව	38
MR6	වැඩි හරිත අගයකින් යුත් ගොඩනැඟිලි ද්‍රව්‍යය භාවිතා කිරීම	39-40
MR7	ඉදිකිරීම් අපද්‍රව්‍යය කළමනාකරණය	41
MR8	ශීතකාරක හා පිරිසිදුකාරක	42
EQ	**ගොඩනැඟිලි ඇතුළත පරිසරයේ ගුණාත්මක භාවය**	**43-51**
EQ1	කාබන්ඩයොක්සයිඩ් (CO_2) අධීක්ෂණය හා පාලනය	43
EQ2	ගෘහස්ථ වායු දූෂක	44
EQ3	ප්‍රශස්ත උෂ්ණත්ව පාලන සැලසුම් හා පද්ධතීන් නිර්මාණය කිරීම	45
EQ4	වෙනස් වන වාතයේ සඵලතාවය	46
EQ5	දිවා ආලෝකය	47
EQ6	ලබා ගන්නා හිරු එළියේ අධික දීප්තිය පාලනය	48
EQ7	විදුයුත් ආලෝක මට්ටම	49
EQ8	අවට දර්ශන / බාහිර දර්ශන	50
EQ9	අභ්‍යන්තර ශබ්ද මට්ටම	51
WE	**ජල කාර්යක්ෂමතාවය**	**52-56**
WE1	වැසි ජලය එක්රැස් කිරීම	52
WE2	අප ජලය ප්‍රතිචක්‍රීකරණය හා කාර්යක්ෂම භාවිතය	53-54
WE3	ජල මාපකය හා කාන්දු හඳුනා ගැනීමේ පද්ධතිය	55
WE4	ජල කාර්යක්ෂම මෙවලම්	56
IN	**හරිතමය නව්‍යකරණ සොයාගැනීම**	**57-58**
IN1	හරිතමය නව්‍යකරණ සොයාගැනීම්	57-58
SC	**සමාජීය හා සංස්කෘතිමය අනුකූලතාවය**	**59**
SC1	සමාජීය හා සංස්කෘතිමය අනුකූලතාවයෙන් යුතු ගොඩනැඟිලි නිර්මාණය හා ඉදිකිරීම්	59
	හරිත ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වන ඇගයීම් පද්ධතියට අනුකූලව ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා හඳුනාගත් මාර්ගෝපදේශ සැලැස්ම	**60-70**
	පරිශීලන	**71-73**
	විද්වත් උපදේශක මණ්ඩල/ විද්වත් කමිටු සාමාජිකයන්	**74-77**

පෙරවදන

ශ්‍රී ලංකාව සර්ම කලාපීය රටක් වීම නිසාත් දරාගත හැකි මට්ටම් තුළ විවලා්‍ය වන උෂ්ණත්වය සහ වසර පුරාම ලැබෙන මෝසම් වැසි නිසාත්, අප පැරැන්නන් තම වාසස්ථානයන්හි ඇතුළත සහ පිටත පරිසරය මිනිස් වාසයට ගැලපෙන පරිදි ඉතා සරල සහ ගුණාත්මක ගෘහ නිර්මාණ සංකල්පයන් යොදා ගනිමින් සකසා ගෙන තිබුණි.

නමුදු, පසු කාලීනව විදේශ ආක්‍රමණ වලට ලක්වීම, සර්ම කලාපීය දේශගුණික තත්ත්වය සැලකිල්ලට නොගෙන ගොඩනැඟිලි නිර්මාණය වීම සහ විදේශ ගෘහ නිර්මාණ සැලසුම් වලට අනුගත වීම වැනි හේතූන් නිසා ශ්‍රී ලංකාවේ වර්තමාන ගොඩනැඟිලි පාරිසරික , සෞඛ්‍යය, ආර්ථික මෙන්ම සාමාජීය ගැටළු රැසකට මුහුණ දී සිටී.

මෙවන් තත්ත්වයන් තව දුරටත් වර්ධනය වීම වැළැක්වීම සඳහා සහ මිහිතලයේ ඉදිරි පැවැත්ම සහතික කිරීම සඳහා, සමස්ථ ගෝලීය ප්‍රශ්නයක් දක්වා වර්ධනය වී ඇති ගොඩනැඟිලි ක්ෂේත්‍රයේ අහිතකර තත්ත්වයන් අවම කර සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම ඉතා වැදගත් මෙන්ම අත්‍යාවශ්‍ය කරුණක් විය. ඒ අනුව, මෙහි ප්‍රතිඵලයක් ලෙස ගෝලීය මට්ටමින් හරිත ගොඩනැඟිලි හෙවත් තිරසර ගොඩනැඟිලි සංකල්පය බිහි වී ඇති අතර, මේ වන විට බොහෝ රටවල් එය ප්‍රායෝගිකව යෙදවීමට හා ඊට අදාළ ගොඩනැඟිලි ඇගයීමට ලක්කිරීමට පෙළඹී සිටිති.

මේ අනුව, ශ්‍රී ලංකාවේ විශාලම පිරිවැය වන බලශක්තිය ඇතුළු අනෙකුත් සම්පත් විෂයය පථයන් හතක් ඔස්සේ ප්‍රශස්තව හා කාර්යක්ෂමව භාවිතය පිළිබඳ ඇගයීමට ලක් කිරීමටත්, පළමු පියවර ලෙස සියළු රාජ්‍ය ගොඩනැඟිලි හා අර්ධ රාජ්‍ය ගොඩනැඟිලි හරිත සංකල්පය ඔස්සේ ක්‍රියාවට නැංවීමටත් ශ්‍රී ලංකා ජනපති හා පරිසර ඇමති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන්ගේ උපදෙස් හා රාජ්‍ය ආයතන කිහිපයක මග පෙන්වීම යටතේ ඊට අදාළ මාර්ගෝපදේශ සකස් කොට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත.

තිරසර හරිත සංකල්පයන් ඔස්සේ ශ්‍රී ලංකාව දිනෙන් දින ඉදිරියට පියවර තබන අතර ගොඩනැඟිලි සංචිතයන් හරිතකරණයට ලක් කිරීමෙන් එහි ප්‍රතිඵල ලබා කර ගැනීමට බලාපොරොත්තු වේ. මේ අනුව වඩාත් තාක්ෂණිකව ගොඩනැඟිල්ලක මූලික සැලසුම් අවස්ථාවේ සිට ඉදිකිරීම්, මෙහෙයවීම් හා නඩත්තුව, ප්‍රතිසංස්කරණය කිරීම සහ කඩා බිඳ දැමීම දක්වා වන ගොඩනැඟිලි ජීවන චක්‍රය තුළ සියළු අවස්ථාවන් දක්වා අවශ්‍ය මාර්ගෝපදේශ ඇතුළත් මෙම මාර්ගෝපදේශ සංග්‍රහය ක්‍රියාවට නැංවීම මගින් හා ඊට නිසි ඇගයීමක් ලබාදීම මගින් අනාගත ශ්‍රී ලංකාවේ හරිතකරණය වූ ගොඩනැඟිලි තුළින් තිරසර සංවර්ධනයක් කරා යන ගමනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනුමට හැකිවනු ඇත.

ක්‍රියාවලිය

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ "පුනරුදය" තුන් අවුරුදු පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන යටතේ හඳුනාගත් වැදගත් ක්‍රියාකාරකමක් වන්නේ ගොඩනැඟිලි නිර්මාණයේදී තිරසාර සංවර්ධන ඉලක්ක යටතේ පරිසර හිතකාමී ගොඩනැඟිලි ඉදිකිරීමට අවශ්‍ය දිරිගැන්වීම හා පසුබිම සැකසීමයි.

එහි පළමු පියවර ලෙස රාජ්‍ය ආයතන වල ගොඩනැඟිලි ඉදිකිරීම හා පවත්වාගෙන යාම සඳහා අදාළ වන හරිත ගොඩනැඟිලි මාර්ගෝපදේශ සකස් කිරීම මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා වන අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි එම අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලදි.

මෙම මාර්ගෝපදේශ සකස් කිරීම හා එයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම සාර්ථකව කරගෙන යාම සඳහා මූලික මූලධර්ම 05ක් යටතේ එනම්, ප්‍රතිපත්ති, තාක්ෂණික , ආර්ථික , නෛතික හා සමාජීය යන අංශ යටතේ පුළුල් ක්‍රියාකාරකම් 22ක් හඳුනා ගෙන එම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා කමිටු 22ක් පත්කර ගන්නා ලදි. එහිදී මූලික වශයෙන් ප්‍රධාන මාර්ගෝපදේශ 99ක් හඳුනාගෙන ඇත.

මෙම රාජ්‍ය ආයතන සඳහා වන හරිත ගොඩනැඟිලි මාර්ගෝපදේශ සංග්‍රහයේ ආරම්භය වන්නේ මුල් අවස්ථාවේදී හඳුනාගත් එම මාර්ගෝපදේශ 99 සහිත සැලැස්ම වන අතර, එය අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශයන්ට හා උපදේශයන් සඳහා යොමු කිරීමෙන් අනතුරුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය ඒ සඳහා උපදෙස් ලබා දී ඇත. ඒ යටතේ නාගරික සංවර්ධන අධිකාරියේ මුලිකත්වයෙන් අදාල අනෙකුත් ආයතනවල සහභාගීත්වයෙන් ඉතා කෙටි කාලයක් තුළ මෙම හරිත මට්ටම මැන බැලීමේ ක්‍රමවේදය සකස් වී ඇත.

මෙම මාර්ගෝපදේශ සංග්‍රහය හා ලකුණු ලබා දීමේ ක්‍රමවේදය ජාත්‍යන්තරව පිළිගත් මෙන්ම ශ්‍රී ලංකාවට අදාළ වන මූලික ක්ෂේත්‍ර 07ක් යටතේ විමර්ශනයට ලක් කර ඇත. එම ක්ෂේත්‍ර නම්,

1. බලශක්ති කාර්යක්ෂමතාවය
2. තිරසාර භූමි සැලසුම්කරණය හා කළමනාකරණය
3. අමුද්‍රව්‍යය හා සම්පත් කළමනාකරණය
4. ගොඩනැඟිලි ඇතුලත පරිසරයේ ගුණාත්මක භාවය
5. ජල කාර්යක්ෂමතාවය
6. හරිතමය නව්‍යකරණය
7. සමාජීය හා සංස්කෘතිමය අනුකූලතාවය

2017 වසරේ සිට රාජ්‍ය හා අර්ධ රාජ්‍ය නව ගොඩනැගිලි සඳහා මෙම ක්‍රමවේදය මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ නව ගොඩනැගිලි ඉදි කිරීමේදී මෙම මාර්ගෝපදේශ සංග්‍රහයට අදාල ලකුණු ලබා දීමේ පටිපාටියට අනුව හරිත ගොඩනැගිලි සඳහා වන ක්‍රමවේදයන්ට අනුගත විය යුතු අතර, ඒ තුලින් තිරසාර සංවර්ධන ඉලක්ක ලගා කර ගැනීමට තවත් පියවරක් තබනු ඇත.

ලකුණු සාරාංශය

කොටස	අංකය	අයිතමය	ලකුණු	ඉල්ලුම්කරු	UDA
1	**EE**	**බලශක්ති කාර්යක්ෂමතාවය**	**27**		
	නිර්මාණය				
	EE1	ආලෝකය සපයන උපකරණ කලාපකරණය	02		
	EE2	විදුලි උප මැනුම්	02		
	EE3	පුනර්ජනනීය බලශක්තිය	08		
	EE4	උසස් කාර්යක්ෂමතා කාර්යය සාධනය	05		
	EE5	විදුලි ආලෝකකරණයේ කාර්යක්ෂමතාවය	02		
	EE6	බලසාධක නිවැරදි කිරීම	02		
	වැඩි දියුණු කිරීම හා තත්ත්වය උසස් කිරීම				
	EE7	බලශක්ති කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම	04		
	නිරවද්‍යතාවය මැන බැලීම සහ නඩත්තුව				
	EE8	තිරසාර නඩත්තුව	02		
2	**SM**	**තිරසාර භූමි සැලසුම්කරණය හා කළමනාකරණය**	**23**		
	භූමි සැලසුම්කරණය				
	SM1	භූමිය තෝරා ගැනීම	04		
	SM2	අතහැර දැමූ භූමි(Brown field) ප්‍රතිසංවර්ධනය	03		
	SM3	සංවර්ධන ඝනත්වය සහ ප්‍රජා සම්බන්ධීකරණය	01		
	SM4	පරිසර කළමනාකරණ හා පරිසර ආරක්ෂණ සැලැස්මක් සකස් කිරීම	01		
	SM5	භූමියේ හරිත ආවරණ ස්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම	02		
	ඉදිකිරීම් කළමනාකරණය				
	SM6	ඉදිකිරීම් ක්‍රියාවලියේදී දූෂණය පාලනය කිරීම	01		
	SM7	ගොඩනැඟිලි ඉදිකිරීම්හි ගුණාත්මක තත්ත්වය ලබා කර ගැනීම	01		
	SM8	සේවක පහසුකම්	01		
	ප්‍රවාහනය				
	SM9	පොදු ප්‍රවාහන ප්‍රවේශදිරිගැන්වීම සහ පෞද්ගලික වාහන භාවිතය අවම කිරීම	02		
	SM10	වාහන නැවැත්වීමේ ධාරිතාවය	02		
	SM11	වැසිජල සැලසුම් - ප්‍රමාණ සහ තත්ත්ව පාලනය	02		
	SM12	හරිත ආවරණ සහ පියසි	02		
	SM13	ගොඩනැඟිලි භාවිතකරන්නන් සඳහා අත්පොත	01		
3	**MR**	**අමුද්‍රව්‍යය හා සම්පත් කළමනාකරණය**	**20**		
	අමුද්‍රව්‍යය ප්‍රතිචක්‍රීකරණය සහ ප්‍රති භාවිතය				
	MR1	ද්‍රව්‍යය නැවත භාවිතය සහ තෝරා ගැනීම	02		
	MR2	ප්‍රතිචක්‍රීකරණය කරන ලද දෑ අඩංගු ද්‍රව්‍යය	02		
	MR3	ගොඩනැඟිලි නැවත භාවිතය	02		
	තිරසාර සම්පත් භාවිතය				
	MR4	කලාපීය ගොඩනැඟිලි ද්‍රව්‍යය භාවිතය	03		
	MR5	තිරසාර දැව භාවිතය	03		
	අපද්‍රව්‍යය කළමනාකරණය				
	MR6	වැඩි හරිත අඟයකින් යුතු ද්‍රව්‍යය භාවිතා කිරීම	02		
	MR7	ඉදිකිරීම් අපද්‍රව්‍යය කළමනාකරණය	02		
	හරිත නිෂ්පාදන				
	MR8	ශීතකාරක හා පිරිසිදුකාරක	03		

කොටස	අංකය	අයිතමය	ලකුණු	ඉල්ලුම්කරු	UDA
4	**EQ**	**ගොඩනැගිලි ඇතුලත පරිසරයේ ගුණාත්මක භාවය**	**13**		
	අභ්‍යන්තර වාතාශ්‍රයේ ගුණාත්මක භාවය				
	EQ1	කාබන්ඩයොක්සයිඩ් මට්ටම (CO_2) අධීක්ෂණය හා පාලනය	02		
	EQ2	ගෘහස්ත වායු දූෂක	02		
	ප්‍රශස්ත උෂ්ණත්වය				
	EQ3	ප්‍රශස්ත උෂ්ණත්ව පාලන සැලසුම් හා පද්ධතීන් නිර්මාණය කිරීම	02		
	EQ4	වෙනස්වන වාතයේ සඵලතාවය	01		
	ප්‍රශස්ත දෘෂ්ඨී ආලෝක හා ශබ්ද මට්ටම				
	EQ5	දිවා ආලෝකය	02		
	EQ6	ලබා ගන්නා හිරුඑළියේ අධික දීප්තිය පාලනය කිරීම	01		
	EQ7	විද්‍යුත් ආලෝක මට්ටම	01		
	EQ8	අවට දර්ශන / බාහිර දර්ශන	01		
	EQ9	අභ්‍යන්තර ශබ්ද මට්ටම	01		
5	**WE**	**ජල කාර්යක්ෂමතාවය**	**10**		
	වැසි ජලය එක්රැස් කිරීම හා ජලය ප්‍රතිචක්‍රීකරණය				
	WE1	වැසි ජලය එක්රැස් කිරීම	02		
	WE2	අප ජලය ප්‍රතිචක්‍රීකරණය හා කාර්යක්ෂම භාවිතය	04		
	කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම				
	WE3	ජල මාපකය හා කාන්දු හඳුනා ගැනීමේ පද්ධතිය	02		
	WE4	ජල කාර්යක්ෂම මෙවලම්	02		
6	**IN**	**හරිතමය නව්‍යකරණය**	**05**		
	IN1	හරිතමය නව්‍යකරණ සොයාගැනීම්	05		
7	**SC**	**සමාජීය හා සංස්කෘතිමය අනුකූලතාවය**	**02**		
	SC1	සමාජීය හා සංස්කෘතිමය අනුකූලතාවයෙන් යුතු නිර්මාණකරණය	02		
		මුළු ලකුණු එකතුව	**100**		

හරිත තත්ත්වය වර්ගීකරණය

- ප්ලැටිනම් — 70 ට වැඩි ලකුණු
- රන් — ලකුණු 60-69
- රිදී — ලකුණු 50 – 59
- සහතික මට්ටම — ලකුණු40-49

EE බලශක්ති කාර්යක්ෂමතාවය

EE1 ආලෝකය සපයන උපකරණ කලාපකරණය — ලකුණු 02

අභිප්‍රාය

නම්‍යශීලී ආලෝක පාලනයක් ලබාදීම තුලින් භාවිතයට ගන්නා ප්‍රදේශ පමණක් ආලෝකරණයට ලක් කිරීම හරහා බලශක්තිය කළමනාකරණය කිරීම.

මෙසේ ආලෝකකරණ ප්‍රදේශ පාලනය කිරීම තුළින් භාවිතා කරන්නන්ට වඩා නම්‍යශීලී පාලනයක් ලබා දෙන අතර, එමඟින් භාවිතා කරන ප්‍රදේශය පමණක් ආලෝකකරණය සිදුවන බැවින් බලශක්ති භාවිතය මෙන්ම ඒ සඳහා පිරිවැය අඩු කිරීමට අපේක්ෂිතය.

ක්‍රමවේදය

- සියළුම තනි සහ වැසුනු අවකාශ වල ආලෝකකරණය පාලනය කළ හැකි පරිදි තනි තනිව ස්විචකරණය කළ යුතුය. මෙහිදී තනි තනිව ස්විචකරණය කළ ප්‍රදේශ සම්පූර්ණ ගොඩනැඟිල්ලේ ප්‍රමාණයෙන් අවම වශයෙන් 90%ක් විය යුතු අතර, එම තනි තනි ස්විචකරණය කළ ප්‍රදේශයක් $100m^2$ට නොවැඩි විය යුතුය. **ලකුණු 01**

- ස්වයං සංවේදී ආලෝක පාලන ක්‍රම
  හිරු එළිය ගොඩනැඟිල්ල වෙත ලැබීමේදී හා ගොඩනැඟිල්ල අවකාශ භාවිතා නොවන අවස්ථාවන්හිදී විදුලිය මගින් සිදුකරන ආලෝකකරණය පාලනය කිරීම සඳහා ස්වයං සංවේදී පාලන ආලෝකකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම. **ලකුණු 01**

ස්විච පැහැදිළිව නාමකරණය කර, ගොඩනැඟිල්ල භාවිතා කරන්නන්ට පහසුවෙන් ලභා විය හැකි ලෙස ස්ථානගත කළ යුතුය.
(ඉහත සඳහන් කරන ලද ලකුණු ලබා ගැනීමේ කඩඉම් සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් නිකුත් කරන බලශක්ති ඇගයීම් මට්ටම් වල අවසාන සංස්කරණයන් අනුව වෙනස් විය හැක).

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. තනි ස්විච මගින් පාලනය වන ආලෝක කලාප හා ඉන් ආවරණය වන ප්‍රදේශ පැහැදිළිව දක්වන සැලසුම්		
02. විදුලි පද්ධති පිළිබඳ විස්තරාත්මක සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය. එහි ස්විච හා ස්වයංක්‍රීය සංවේදක වල පිහිටීම හා එමඟින් පාලනය වන ප්‍රදේශය දක්වා තිබිය යුතුය		
03. සියළු තනි ස්විචකරණය කළ ප්‍රදේශ ඉහත අවකාශමය ප්‍රතිශත අවශ්‍යතා සපුරා ඇති බව දක්වන වාර්තාවක්		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. සියළු තනි ස්විච වලින් ආලෝකකරණය වන ප්‍රදේශ සහ එමඟින් ආවරණය වන කලාප පැහැදිළිව දක්වන "ඉදිකළ ආකාරය දක්වන සැලසුම්"		
2. ඉදිකරන ලද ආකාරය දක්වන සැලසුම්හි ස්විචවල පිහිටීම්, ස්විච ප්‍රමාණය ඉන් පාලනය වන ප්‍රදේශ හා ස්වයං සංවේදක මඟින් පාලනය වන ප්‍රදේශ දක්වා තිබිය යුතුය		
03. සියළු තනි ස්විචකරණය කළ ප්‍රදේශ ඉහතඅවකාශමය ප්‍රතිශත අවශ්‍යතා සපුරා ඇති බව දක්වන වාර්තාවක්		
4. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

EE2 විදුලි උප මැනුම් ලකුණු 02

අභිප්‍රාය

ප්‍රධාන ගොඩනැඟිලි මෙන්ම ඊට අයත් අනෙකුත් සියළු ප්‍රදේශයන්හි හා ප්‍රධාන බලශක්ති භාවිතා කරන උපකරණ වල බලශක්ති පරිභෝජනය නිරීක්ෂණයට ලක් කිරීම හා බලශක්ති අධීක්ෂණය පහසු කිරීම සඳහා උප මනුකරණය (sub- metering) දිරිගැන්වීම.

ක්‍රමවේදය

- සියළුම ගොඩනැඟිලි වල කාර් නවතා තබන ස්ථාන, වායු සමීකරණ උපකරණ, විදුලි සෝපාන පොදු ස්ථාන ආලෝකකරණය හා විදුලිබල හා බලශක්ති භාවිතය ≥100 kvaවන ඕනෑම කොටසක් සඳහා උප මනුකරණය.
    - කුලී පදනම මත ලබා දෙන ගොඩනැඟිලි කොටස් සඳහා, වෙන් කළ කුලී ප්‍රදේශ සඳහා වෙනම මීටර් ස්ථාපනය කිරීම. අවම වශයෙන් මෙම කුලී ප්‍රදේශ එක් එක් මහලේ එක් එක් අංශ හෝ වෙනත් පැහැදිළිව වෙන්කළ හැකි ප්‍රදේශ හෝ කලාප විය යුතුය.

ලකුණු 01

- ගොඩනැඟිල්ල බලශක්ති කළමනාකරණ පද්ධතියක් (Energy Management system) ස්ථාපනය කර ඇති අවස්ථාවන් වලදී සියළු උපමනු EMSට සම්බන්ධ කර තිබීම.

ලකුණු 01

(ඉහත සඳහන් කරන ලද ලකුණු ලබා ගැනීමේ කඩඉම් සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් නිකුත් කරන බලශක්ති ඇගයීම් මට්ටම් වල අවසාන සංස්කරණයන් අනුව වෙනස් විය හැක).

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. ලකුණු නිර්ණායක අනුව සැකසී ඇති විදුලි උපමනු සඳහා ස්ථාපන අවශ්‍යතා විස්තර පිරිවිතරයන්		
02. මනු සවිකිරීමට යෝජිත ස්ථාන සහ එම මනු සේවා භාවිතය පෙන්වන විදුලි සැලැස්ම හා ක්‍රමානුකූල සටහන්		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ගොඩනැඟිල්ල ඉදිකිරීමෙන් පසු ඉදිකළ ආකාරය දක්වන සැලසුමේ උපමනු වල නිශ්චිත ස්ථාන සහ ගොඩනැඟිල්ලෙහි එම උපමනු භාවිතය දක්වන ක්‍රමානුකූල සටහන		
2. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

EE3 පුනර්ජනනීය බලශක්තිය ලකුණු 08

අභිප්‍රාය

කාබන්ඩයොක්සයිඩ්(CO_2) විමෝචනය මගින් සිදුවන පාරිසරික බලපෑම අවම කිරීම සඳහා සියළුම ආකාරයේ පුනර්ජනනීය බලශක්ති භාවිතය දිරිගැන්වීම. මෙමගින් හරිත බලශක්ති භාවිතය උනන්දු කරන අතර නව ඉන්ධන භාවිතය කරන බලාගාර සඳහා ඇති අවශ්‍යතාව අඩු කිරීමට බලාපොරොත්තු වේ.

ක්‍රමවේදය

ගොඩනැඟිල්ලේ මුළු බලශක්ති අවශ්‍යතාවයෙන්, පහත සඳහන් ප්‍රතිශත හෝ ස්ථාපිත පුනර්ජනනීය බලශක්ති ජනන ප්‍රමාණය යොදා ගැනීම. (මෙයින් යොදාගත් වැඩි අගය ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලැබේ).

- ගොඩනැඟිල්ලේ පිය සටහනෙන් 20%ක් සූර්ය කෝෂ වලින් ආවරණය කිරීම හෝ ගොඩනැඟිල්ලේ විදුලිබල අවශ්‍යතාවයෙන් (Electricity Contarct Demand) 40%ක් සූර්ය කෝෂ /වෙනත් පුනර්ජනනීය බලශක්තිවලින් ලබා ගන්නා බලශක්තියෙන් සපුරා ගැනීම. **ලකුණු 02**
- ගොඩනැඟිල්ලේ පිය සටහනෙන් 40%ක් සූර්ය කෝෂ වලින් ආවරණය කිරීම හෝ ගොඩනැඟිල්ලේ විදුලිබල අවශ්‍යතාවයෙන් (Electricity Contarct Demand) 60%ක් සූර්ය කෝෂ /වෙනත් පුනර්ජනනීය බලශක්තිවලින් ලබා ගන්නා බලශක්තියෙන් සපුරා ගැනීම. **ලකුණු 04**
- ගොඩනැඟිල්ලේ පිය සටහනෙන් 60%ක් සූර්ය කෝෂ වලින් ආවරණය කිරීම හෝ ගොඩනැඟිල්ලේ විදුලිබල අවශ්‍යතාවයෙන් (Electricity Contarct Demand) 80%ක් සූර්ය කෝෂ /වෙනත් පුනර්ජනනීය බලශක්තිවලින් ලබා ගන්නා බලශක්තියෙන් සපුරා ගැනීම. **ලකුණු 06**
- ගොඩනැඟිල්ලේ පිය සටහනෙන් 80%ක් සූර්ය කෝෂ වලින් ආවරණය කිරීම හෝ ගොඩනැඟිල්ලේ විදුලිබල අවශ්‍යතාවයෙන් (Electricity Contarct Demand) 100%ක් සූර්ය කෝෂ /වෙනත් පුනර්ජනනීය බලශක්තිවලින් ලබා ගන්නා බලශක්තියෙන් සපුරා ගැනීම. **ලකුණු 08**

(ඉහත සඳහන් කරන ලද ලකුණු ලබා ගැනීමේ කඩඉම් සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් නිකුත් කරන බලශක්ති ඇගයීම් මට්ටම් වල අවසාන සංස්කරණයන් අනුව වෙනස් විය හැක).

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. පුනර්ජනනීය බලශක්ති උපකරණ සඳහා වෙන් වූ ස්ථානවල සැලැස්ම හා පැති පෙනුම		
02. භාවිතා කිරීමට යෝජනා කරන තාක්ෂණය විස්තර කළවාර්තාව. මෙහිදී පුනර්ජනනීය ක්‍රම මගින් ජනනයට බලාපොරොත්තු වන සම්පූර්ණ බලශක්තිය (kWp) වලින් දැක්විය යුතුය		
03. පුනර්ජනනීය ක්‍රම මගින් ජනනය කිරීමට බලාපොරොත්තු වන බලශක්ති ප්‍රමාණය ගොඩනැඟිල්ලේ සමස්ථ බලශක්ති පරිභෝජනයට දක්වන ප්‍රතිශතය ඇතුළත් වාර්තාව		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. පුනර්ජනනීය බලශක්ති උපකරණ ස්ථාපනය කළ ස්ථාන වල සැලැස්ම හා පැති පෙනුම දැක්වූ "ඉදිකළ ආකාරය දක්වන සැලසුම්"		
2. පුනර්ජනනීය බලශක්ති උපකරණ සඳහා නිෂ්පාදකයාගේ තාක්ෂණික පිරිවිතරය		
3. පුනර්ජනනීය බලශක්ති ජනන ක්‍රම මගින් ජනනය කරන ලද බලශක්ති ප්‍රමාණය**kWp**වලින් දක්වන ලද වාර්තාව		
4. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

EE4 උසස් බලශක්ති කාර්යක්ෂමතා කාර්යය සාධනය — ලකුණු 05

අභිප්‍රාය

බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ ගොඩනැඟිල්ලක බලශක්ති පරිභෝජනය අඩු කිරීම මඟින් කාබන්ඩයොක්සයිඩ් (CO_2) විමෝචනය අවම කිරීම.

ක්‍රමවේදය

බලශක්ති පරිභෝජනය අවම කිරීම සඳහා බලශක්ති කාර්යක්ෂමතාවය අනිවාර්යය පරිසාදන මට්ටමට වඩා වැඩි ප්‍රමාණ වලින් ළඟා කරගන්නා ගොඩනැඟිලි සඳහා මෙම ලකුණු ප්‍රදානය කෙරේ. මේ සඳහා වැඩකරන දින 200ක වසරක් සහ දිනකට පැය 08ක ගොඩනැඟිලි භාවිතයක් සිදු කරනු ලැබේ.

ගොඩනැඟිල්ලේ වර්ග මීටරයක ප්‍රමාණයක් වසරකට සිදුකරන බලශක්ති පරිභෝජනය (BEI) 150kWh/m^2 /Year - 130kWh/m^2 /Yearඅතර නම් — **ලකුණු 01**

ගොඩනැඟිල්ලේ වර්ග මීටරයක ප්‍රමාණයක් වසරකට සිදුකරන බලශක්ති පරිභෝජනය (BEI) <130kWh/m^2 /Year - 110kWh/m^2 /Yearඅතර නම් — **ලකුණු 03**

ගොඩනැඟිල්ලේ වර්ග මීටරයක ප්‍රමාණයක් වසරකට සිදුකරන බලශක්ති පරිභෝජනය (BEI) < 110kWh/m^2 /Year - 90kWh/m^2 /Yearඅතර නම් — **ලකුණු 05**

(ඉහත සඳහන් කරන ලද ලකුණු ලබා ගැනීමේ කඩඉම් සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් නිකුත් කරන බලශක්ති ඇගයීම් මට්ටම් වල අවසාන සංස්කරණයන් අනුව වෙනස් විය හැක).

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. බලශක්ති කාර්යක්ෂමතාවයේ අනිවාර්යය මට්ටම ළඟා කිරීම සඳහා සපයන ලද සෑම ලේඛනයකම පිටපත් (නැවත පරීක්ෂා කිරීම සඳහා)		
02. ගොඩනැඟිල්ලේ වර්ග මීටරයක් වසරකට භාවිතා කිරීමට යෝජිත බලශක්ති ප්‍රමාණය (BEI) ගණනයක් ඇතුළත් වාර්තාව		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ඉදිකර අවසන් කළ ගොඩනැඟිල්ල ළඟා කරගත් මට්ටම සනාථ කරන ලේඛන		
2. අත්කර ගත් BEI දක්වන, ගොඩනැඟිල්ල ඉදිකළ පසු ලබාගත් බලශක්ති කළමනාකරණ පද්ධතියේ දත්ත පිටපත්		
3. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

EE5 විදුලි ආලෝකකරණයේ කාර්යක්ෂමතාවය ලකුණු 02

අභිප්‍රාය

ගොඩනැඟිලි අභ්‍යන්තර හා බාහිර අවකාශ ආලෝකකරණයේදී සිදුවන බලශක්ති භාවිතය කාර්යක්ෂම කිරීම.

ක්‍රමවේදය

ගොඩනැඟිලි අභ්‍යන්තර අවකාශ වල භාවිතා කරන 80% ක් විදුලි ලාම්පු සම්පූර්ණ ආලෝකකරණ බලයේ ඝනත්වය (Lighting Power Density) 10W/m^2නොඉක්මවීම. **ලකුණු 01**

ගොඩනැඟිල්ල පිටත භූමිය ආලෝකකරණය සඳහා භාවිතා කරන විදුලි ලාම්පු 70W බලය ඉක්මවන අවස්ථාවේදී ඒවායේ අවම කාර්යක්ෂමතාවය 80lm/W ලෙස පවත්වා ගැනීම. **ලකුණු 01**

(ඉහත සඳහන් කරන ලද ලකුණු ලබා ගැනීමේ කඩඉම් සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් නිකුත් කරන බලශක්ති ඇගයීම් මට්ටම් වල අවසාන සංස්කරණයන් අනුව වෙනස් විය හැක).

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. ඉහත ලකුණු ලබා ගැනීමට අවකාශ හා බාහිර ප්‍රදේශ ආලෝකකරණය සඳහා සකස් කරන ලද ක්‍රමවේදය දක්වන සැලසුම් ලේඛන හා විස්තරාත්මක වාර්තාව		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. ඉහත ලකුණු ලබා ගැනීමට අවකාශ හා බාහිර ප්‍රදේශ ආලෝකකරණය සඳහා ස්ථාපනය කරන ලද ක්‍රමවේදය දක්වන සැලසුම් ලේඛන හා විස්තරාත්මක වාර්තාව		
02. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

EE6 බලසාධක නිවැරදි කිරීම ලකුණු 02

අභිප්‍රාය

ගොඩනැඟිල්ලක බලශක්තියේ උපරිම ඉල්ලුම (Maximum Energy Demand) ඉහළ යාම වැළැක්වීම.

ක්‍රමවේදය

ඇම්පියර් 60කට වැඩි ප්‍රමාණයක් තෙකලා විදුලි සැපයුමක් ලබා ගන්නා අවස්ථාවන් වලදී සැපයුම ලබා ගන්නා ස්ථානයේ බලසාධකය නිවැරදි කිරීම (Power Factor Correction) සිදු කිරීම සඳහා උපාංග සවිකළ යුතු අතර එම උපාංගයේ බලසාධක නිවැරදි කිරීමේ හැකියාව 0.98 – 1.0 අතර වීම.

(ඉහත සඳහන් කරන ලද ලකුණු ලබා ගැනීමේ කඩඉම් සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් නිකුත් කරන බලශක්ති ඇගයීම් මට්ටම් වල අවසාන සංස්කරණයන් අනුව වෙනස් විය හැක).

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. ඉහත ලකුණු ලබා ගැනීම සඳහා ස්ථාපනය කිරීමට යෝජිත බලසාධක නිවැරදි කිරීමේ උපාංග පිළිබඳ විස්තරාත්මක ලේඛන		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. ඉහත ලකුණු ලබා ගැනීම සඳහා ස්ථාපනය කරන ලද බලසාධක නිවැරදි කිරීමේ උපාංග පිළිබඳ විස්තරාත්මක ලේඛන		
02. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

EE7 බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම ලකුණු 04

අභිප්‍රාය

ගොඩනැඟිලි වල බලශක්ති සම්බන්ධ පද්ධති ස්ථාපනය සිදුකිරීමේදී එහි පූර්ණ හැකියාව තහවුරු කරන ක්‍රමවේද අනුගමනය කිරීම මගින් එම පද්ධති ස්ථාපනයේදී හා ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන වැරදි අවම කිරීම.

ක්‍රමවේදය

- ව්‍යාපෘතිය මූලික අදියරයන්හිදී, ගොඩනැඟිලිවල බලශක්ති සම්බන්ධ පද්ධති හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුමක් ඇති ස්වාධීන විශේෂඥයෙකුපත් කිරීම හෝ උපදෙස් ලබාගැනීම.

- ගොඩනැඟිලි සැලසුම් සකස් කිරීමේදී අවම වශයෙන් එක් වතාවක් ගොඩනැඟිලි බලශක්ති සැලසුම් පද්ධති පිළිබඳ සමාලෝචනයක් සිදුකිරීම සහ එය ටෙන්ඩර් පත්‍රිකා සකස් කිරීම දක්වා අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම.

- ගොඩනැඟිලිවල බලශක්ති සැලසුම් පද්ධති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ක්‍රමවේදයක් ඉදිරිපත් කිරීම.

- කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද ක්‍රමවේදයන් යෝජිත බලශක්ති පද්ධති සඳහා වන ක්‍රමවේදයන් සමග සැසඳේද යන්න තහවුරු කර ගැනීම.

- පද්ධතිවල පූර්ණ කාර්යක්ෂමතාවය ළඟා කර ගැනීම පිණිස ක්‍රමවේදයන් සකස් කිරීම මගින් (System manuals) අනාගතයේදී පද්ධති ක්‍රියාකරුවන් හට උපරිම කාර්යක්ෂමතාවයෙන් බලශක්ති පද්ධති ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යාමට හැකියාව ලබා දීම.

(ඉහත සඳහන් කරන ලද ලකුණු ලබා ගැනීමේ කඩඉම් සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් නිකුත් කරන බලශක්ති ඇගයීම් මට්ටම් වල අවසාන සංස්කරණයන් අනුව වෙනස් විය හැක).

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. මූලික සැලසුම් නිර්මාණයේදී බලශක්ති සම්බන්ධ පද්ධති සහ එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ සුදුසුකම්ලත් පුද්ගලයෙකු මගින් ලබාගත් උපදේශක සේවාව තහවුරු කිරීමේ ලිපිලේඛන ලබාදීම		
02. යෝජිත බලශක්ති සම්බන්ධ පද්ධති සහ එහි ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා වූ වාර්තාව සහ අදාළ ලේඛන ලබාදීම		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. විවෘත ගොඩනැඟිල්ල බලශක්ති හා පද්ධති කාර්යය සාදනය පිළිබඳව නිර්දේශ ඇතුළත් අවසන් වාර්තාව		
2. පද්ධති අත්පොත පිටපතක්		
3. කළමනාකරණ කාර්යය මණ්ඩලය ගොඩනැඟිලි කළමනාකරණ පුහුණුව ලැබූ බවට ලිඛිත සාක්ෂි		
4. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

EE8 තිරසාර නඩත්තුව ලකුණු 02

අභිප්‍රාය

ගොඩනැඟිල්ලේ බලශක්ති පද්ධති නිසි ආකාරයට නඩත්තුව මගින් බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.

ක්‍රමවේදය

- ගොඩනැඟිල්ලේ නඩත්තු කණ්ඩායමෙන් අවම 50%ක් හෝ ගොඩනැඟිල්ල නිම කිරීමට මාස 03කට පෙර සේවයට යෙදවීම සහ ඔවුන් ගොඩනැඟිල්ලේ බලශක්ති භාවිතා කරන උපකරණ / උපාංග පරීක්ෂා කිරීමට සම්බන්ධ වීම. **ලකුණු 01**

- නඩත්තු වැඩ සඳහා විශේෂ කාර්යාලයක් ගොඩනැඟිල්ලේ වෙන්කිරීම සහ නඩත්තුවට අවශ්‍ය උපාංග සපයා තිබීම. **ලකුණු 01**

(ඉහත සඳහන් කරන ලද ලකුණු ලබා ගැනීමේ කඩඉම් සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් නිකුත් කරන බලශක්ති ඇගයීම් මට්ටම් වල අවසාන සංස්කරණයන් අනුව වෙනස් විය හැක).

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. ගොඩනැඟිල්ලෙහි නඩත්තු කාමරයක් හඳුනා ගැනීම සහ බිම් සැලැස්ම ඉදිරිපත් කිරීම		
02. අවම වශයෙන් 50%ක ගොඩනැඟිලි නඩත්තු කණ්ඩායමක් ප්‍රායෝගික නිම වීමට පෙර පවත්වා ගෙන යාම හා ඒ සඳහා අවශ්‍ය සේවකයින් හඳුනා ගැනීම		
03. අවුරුදු 3ක් අවම වශයෙන් පහසුකම් නඩත්තු කිරීම සහ ඒ සඳහා වියදම් (වළක්වා ගත හැකි නඩත්තු වියදම්ද ඇතුළුව) ලේඛනගත කිරීම සඳහා කැපවීම		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන(CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. නඩත්තු කණ්ඩායම 50%ක් කටයුතු කිරීම. මාස 1 සිට 3 දක්වා කාලයක් ගොඩනැඟිල්ල ප්‍රායෝගික නිම වීමට පෙර හා ඉන් අනතුරුව පූර්ණ පරීක්ෂණ බලශක්ති හා පද්ධති සම්බන්ධයෙන් සිදු කිරීම		
2. නඩත්තු මෙවලම් හා උපකරණ, සහ බඩු තොග ගබඩා භාණ්ඩ පිළිබඳ විස්තර ලැයිස්තුගත කිරීම		
3. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

SM තිරසර භූමි සැලසුම්කරණය හා කළමනාකරණය

අනිවාර්යයෙන්ම අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

ඉදිකරන ගොඩනැඟිල්ල ශ්‍රී ලංකාවේ ගොඩනැඟිලි රෙගුලාසි සියල්ලට අනුගත විය යුතුය. එසේම ඉදිකරන භූමිය අනුව අදාළ වන පළාත් පාලන ආයතන වල අනුමැතිය ලබාගත යුතුය.

SM1 භූමියතෝරාගැනීම

ලකුණු 04

අභිප්‍රාය

නොගැලපෙන භූමිවල ඉදිකිරීම් අවම කිරීම සහ ගොඩනැඟිල්ලක් ඉදිකිරීමෙන් වන පාරිසරික බලපෑම අවම කිරීම.

ගොඩනැඟිලි සඳහා භූමියක් තෝරාගන්නා විට, පාරිසරික පද්ධතීන් වශයෙන් අඩු වටිනාකමක් ඇති භූමියක් තෝරා ගැනීම. එසේ කළ නොහැකි නම්, ගොඩනැඟිල්ලේ පාද සටහන අවම වන ලෙස (මහල් ගොඩනැඟිලි) තෝරාගෙන පරිසර බලපෑම අවම කිරීමට කටයුතු යෙදීම.

ක්‍රමවේදය

පහත සඳහන් සාධක සහිත ස්ථාන පිරවීම ගොඩනැඟිලි ඉදිකිරීම දෘඩ භූ දර්ශන, මාර්ග හෝ වාහන නැවතුම් ඉදිකිරීමෙන් වැළකීම.

- ඉදිකිරීමේ භූමිය වැදගත් පාරිසරික සේවාවක් හෝ ආර්ථික සේවාව ඉටුකරන කෘෂිකාර්මික ඉඩමක් හෝ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රක්ෂිත වනාන්තර.

- ප්‍රකාශයට පත්කර ඇති අදාල වනජීවී ප්‍රදේශ හෝ ප්‍රේරණ කලාප තුළ.
- තෙත්බිමක් නම්, එහි සිට මීටර් 30ක් තුළ හෝ ප්‍රකාශයට පත්කළ හෝ හඳුනාගෙන ඇති තෙත්බිමක් නම් එම කොන්දේසිවලට අදාළව.
- අධික ලෙසතර්ජනයට ලක් වී ඇති ජීව විශේෂ සහිත ස්ථාන. (ජාතික රතු දත්ත ලැයිස්තුවේ අවසන් සංස්කරණය හෝ වෙනත් පිළිගත හැකි ලේඛනයක් පරිශීලනය කර දත්ත ලබා ගත යුතුය).
- ලක්ෂීය ආවේණික ජීව විශේෂ සහිත හෝ ඉතාමත් සුළු ස්ථාන ගණනක විසිරීඇති ආවේණික ජීව විශේෂ සහිත භූමි.
- අති දුර්ලභ හා දුර්ලභ පරිසර පද්ධතීන්.

ලකුණු 02

- ස්වභාවික ආපදා අවධානම් කලාපයක භූමියක් නොවීම. එවැනි භූමියක ඉදිකිරීම් සිදුකරන්නේ නම් අදාළ ආයතන වලින් ඉදිකිරීමේ සුදුසුතාවය පිළිබඳ අනුමැතිය ලබාතිබීම.

ලකුණු 02

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. භූමියේ පිහිටීම දක්වන සැලසුම්		
02. අනුමත මිනින්දෝරු සැලසුම		
03. යෝජිත ගොඩනැඟිල්ලේ පිය සටහන ලකුණු කරන ලද භූමි සැලැස්ම - ගොඩනැඟිල්ලේ පිහිටීම, මායිම් වලට ඇති දුර, අසල ඇති ස්වභාවික වැව්, ගංඟා, ජල පහරවල්, මුහුදු ආදියට ඇති දුර හා සම්බන්ධතාවය දක්වා තිබිය යුතුය		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. ගොඩනැඟිල්ල ඉදිකිරීමෙන් පසු සකසන ලද ඉදිකල ආකාරය දක්වන ගොඩනැඟිල්ලේ පිය සටහන ලකුණු කරන ලද භූමි සැලැස්ම - ගොඩනැඟිල්ලේ පිහිටීම මායිම් වලට ඇති දුර අසල ඇති ස්වභාවික වැව්, ගංහා, ජල පහරවල්, මුහුදු ආදියට ඇති දුර හා සම්බන්ධතාවය දක්වා තිබිය යුතුය		
02. මූලික සැලසුම් ඇගයීමෙන් පසු සිදු කරන ලද වෙනස්කම් හෝ එකතු කිරීම් දක්වන ලේඛන		
04. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

SM2 අතහැර දැමූ භූමි ප්‍රතිසංවර්ධනය ලකුණු 03

අභිප්‍රාය

ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා නිකලැල් භූමි භාවිතයට ගැනීම අඩු කිරීම සඳහා දැනට අතහැර දමා ඇති ගොඩනැඟිලි ඉදිකිරීමට නුසුදුසු භූමි සංවර්ධනය කොට ගොඩනැඟිලි සඳහා යොදා ගැනීම. මෙවැනි භූමි සඳහා උදාහරණ ලෙස පැරණි කර්මාන්ත සංකීර්ණ පැවති භූමියේ පැරණි කසල රඳවා තිබූ ස්ථාන, පතල් සඳහා යොදාගත් ස්ථාන දැක්විය හැක.

ක්‍රමවේදය

භූමිය මිලදී ගන්නා අවස්ථාවේදී හානි වී තිබූ භූමිය ප්‍රතිසංවර්ධනය කිරීම හා පූර්ණ ඉදිකිරීමට පෙර එම භූමිය භාවිතයට ගත හැකි ලෙස සකස් කර ගැනීමට ප්‍රතිකර්ම යෙදීම. මෙය භූමිය තුළ ඇති පස් සාම්පල පරීක්ෂා කිරීම මගින් කළ හැක.

ලබා ගත හැකි ලකුණු

- සංවර්ධනය සඳහා යොදාගත් භූමි ප්‍රමාණයෙන් 10% - 50%ක් අතර ප්‍රතිසංවර්ධනය කළ භූමියක් නම් **ලකුණු 1**
- සංවර්ධනය සඳහා යොදාගත් භූමි ප්‍රමාණයෙන් 51% - 69%ක් අතර ප්‍රතිසංවර්ධනය කළ භූමියක් නම් **ලකුණු 2**
- සංවර්ධනය සඳහා යොදාගත් භූමි ප්‍රමාණයෙන් 70%ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ප්‍රතිසංවර්ධනය කළ භූමියක් නම් **ලකුණු 3**

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ඉඩමේ මුල් භාවිතය පිළිබඳව කෙටි වාර්තාවක් සහ ඉඩමේ දූෂණ මට්ටම සඳහා සිදු කළ පරීක්ෂණයේ සහතික කළ වාර්තාවක්		
2. දූෂිත පස ඉවත් කිරීම ආදී වූ අනෙකුත් යෝජිත ක්‍රියාමාර්ග ඇතුළත් පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක්		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. නිර්දූෂණ ක්‍රියාවලිය සිදුකළ ආකාරය වාර්තා කිරීම		
2. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

අභිප්‍රාය

දැනට යටිතල පහසුකම් සහිත ප්‍රදේශවල ගොඩනැඟිලි ඉදිකිරීමට ප්‍රමුඛතාවයක් දීම මගින් හරිත භූමි සහ තර්ජනයට පත්වී ඇති පාරිසරික පද්ධතීන් ආරක්ෂා කිරීම. සංවර්ධන ඝනත්වය වැඩිකිරීම සහ ප්‍රතිසංවර්ධනය මගින් පුද්ගලික රථවාහන භාවිතයට ඇති අවශ්‍යතාව අවම කිරීම.

ක්‍රමවේදය

- සංවර්ධන ඝනත්වය

නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම හෝ පෙර සංවර්ධනය කරන ලද භූමියක පවතින ගොඩනැඟිල්ලක් නවීකරණය. අඩුම වශයෙන් 40%ක පමණ භූමි ප්‍රමාණයක් සංවර්ධනය වී ඇති ස්ථානයක් තෝරා ගැනීම.

හෝ

- ප්‍රජා සම්බන්ධතාවය

නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම හෝ පෙර සංවර්ධනය කරන ලද භූමියක පවතින ගොඩනැඟිල්ලක් නවීකරණයේදී සාපේක්ෂ ඝනත්වය අක්කරයකට ඒකක 10ක්වූ සාමූහික කලාපයක සිට හෝ නේවාසික කලාපයක සිට කිලෝමීටර් 01ක් දුරින් ගොඩනැඟිල්ල පිහිටා ඇති නම් සහ එහි සිට කිලෝමීටර් 01ක දුර ප්‍රමාණයක් තුළ අවම වශයෙන් පහසුකම් 10ක් පවතී නම් සහ එම පහසුකම් වලට යාම සඳහා පදික මාර්ග පහසුකම් ඇති නම්

ඉහත සඳහන් වන "සේවා ස්ථානයන්" සඳහා උදා :

බැංකු
වැඩකරන ස්ථාන
වෙළෙඳසැල්
දිවා සුරැකුම්
පොලිස් ස්ථාන
ගිනි නිවීම් ස්ථාන
සුපිරි වෙළෙඳසැල්
හාඩ්වෙයාර්
ලොන්ඩරි
පුස්තකාල
වෛද්‍ය / දන්ත
පාසැල්
උද්‍යාන
ෆාමසි
තැපැල් කන්තෝරු
අවන්හල්

ලකුණු 01

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. මුළු භූමි ප්‍රදේශ ගණනය කිරීම සහ ඝනත්වය ගණනය කිරීම		
2. ගෙබිම් සැලසුම් මගින්, මූලික සේවා ප්‍රදේශ , ආවරණය වූ අඩි පාර, පදික මාර්ග හා පාලම් වැනි අනෙකුත් එකිනෙක සම්බන්ධ කරන දෑ සහ පොළොව යට පිහිටි සම්බන්ධකම් පෙන්නුම් කළ යුතුය		
3. ප්‍රධාන ගොඩනැඟිලි ප්‍රවේශය වටා කිලෝමීටර 1ක අරයකින් යුතු කවයක් ඇඳ එය තුළ ඇති ඉහත සඳහන් සේවා ස්ථාන ගණන පෙන්නුම් කළ යුතුය		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. අවසාන ඝනත්වය ගණනය කිරීම		
2. ඉදිකරන ලද ආකාරය දැක්වෙන සැලසුම් භූමි සිතියම මගින් පහත දැ පෙන්නුම් කළ යුතුය. පවතින සියළුම සේවා පිහිටි ස්ථාන, ආවරණය වූ පදික තීරු, මගී ප්‍රවේශ සහ අනෙකුත් එකිනෙක සම්බන්ධීකරණය කරනු ලබන දැ සහ යටි බිම් සම්බන්ධකම්		
3. සේවා වර්ග වෙන්කොට දැක්වීම සඳහා වර්ණ සුවියක් සැපයිය යුතුය		
4. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

SM4 පරිසර කළමනාකරණය හා පරිසර ආරක්ෂණ සැලැස්මක් සකස් කිරීම ලකුණු 01

අභිප්‍රාය

ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීම හා සංවර්ධන කටයුත්තේදී ව්‍යාපෘතියෙන් සිදුවන පාරිසරික හානි හා බලපෑම් අවම කිරීම සඳහා කළමනාකරණ හා ආරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට යොමු කිරීම.

ක්‍රමවේදය

ව්‍යාපෘතිය ඉදිකරන සහ ගොඩනැඟිල්ල භාවිතා කරන කාලය තුළ අදාළ පරිශ්‍රයේ පරිසර කළමනාකරණය සම්බන්ධයෙන් අනුගමනය කිරීමට යෝජිත මාර්ගෝපදේශ ඇතුළත් පරිසර කළමනාකරණ සැලැස්මක් හා පරිසර ආරක්ෂණ සැලැස්මක් ඉදිරිපත් කිරීම. (ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු ISO 14001 සහතිකය ලබා ඇති අයෙක් නම් සහ එම තත්ත්වයන්ට අනුගතව ව්‍යාපෘතියේ වැඩකටයුතු සිදුකරන්නේ නම් ලබාදෙන ලකුණු දෙගුණ වේ). **ලකුණු 01**

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ව්‍යාපෘතියට අදාළව සකස් කරන ලද පරිසර කළමනාකරණ හා ආරක්ෂණ සැලැස්ම විස්තරාත්මකව දක්වන වාර්තාව		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. සැලසුම් ඇගයීම සඳහා යොමු කරන ලද ව්‍යාපෘතියට අදාළව සකස් කරන ලද පරිසර කළමනාකරණ හා ආරක්ෂණ සැලැස්ම ස්ථාපනය කරන ලද ආකාරය විස්තරාත්මකව දක්වන වාර්තාව		
2. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

SM5 භූමියේ හරිත ආවරණ ස්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම ලකුණු 02

අභිප්‍රාය

සංවර්ධන කටයුත්තේදී විවෘත භූමි ලෙස පවත්වා ගන්නා ප්‍රදේශ වැඩි කිරීම හා එම ප්‍රදේශවල හරිත ආවරණ වැඩි කිරීම. එම හරිත ආවරණ වලින් වැඩි ප්‍රමාණයක් දේශීය ශාක වලින් ලබා ගැනීමට උනන්දු කරවීම.

ක්‍රමවේදය

නාගරික සංවර්ධන අධිකාරිය හෝ අදාළ පළාත් පාලන ආයතනය විසින් ප්‍රකාශිත විවෘත භූමි ප්‍රමාණයට අදාළ වන ලෙස නිර්ණය කරන ලද විවෘත භූමි ලෙස පවත්වා ගන්නා ප්‍රදේශයෙන් 70%ක් ශාක ආවරණයක් වීම සහ එම ප්‍රමාණයෙන් 40%ක් දේශීය හෝ අනුවර්තික ශාක වීම. මෙහිදී භූමිය මත ඉහත ශාක ආවරණ භාවිතා කිරීමට අපහසු වන අවස්ථා වල ගොඩනැඟිල්ලේ පිටත ආවරණයේ බිත්ති මත සහ වහල මත වැනි ස්ථාන වල ශාක වගා කිරීමෙන් ඉහත ප්‍රමාණ ලභා කර ගැනීම.

ලකුණු 02

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. භූමිය තුළ යෝජිත ගොඩනැඟිල්ලේ පිය සටහන සහිතව භූ දර්ශන මහා සැලැස්ම. මෙහිදී මෙම ගොඩනැඟිල්ල භූමියේ මායිම් වලට දක්වන දුර ප්‍රමාණයන් හා යෝජිත මෘදු හා දෘඩ භූ දර්ශන දක්වා තිබීම		
2. දේශීය හෝ අනුවර්තී වෘක්ෂලතා ආවරණ ප්‍රතිශතය පෙන්නුම් කරන භූ දර්ශන සැලසුම		
3. භූ දර්ශන සැලසුමට යෝජිත ශාක, ඒවායේ ලක්ෂණ සහිත නම් ලැයිස්තුව		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. භූමිය තුළ ඉදිකළ ගොඩනැඟිල්ලේ පිය සටහන සහිතව ඉදිකල ආකාරය දක්වන භූ දර්ශන මහා සැලැස්ම. මෙහිදී ඉදිකළ ගොඩනැඟිල්ල භූමියේ මායිම් වලට දක්වන දුර ප්‍රමාණයන් හා ඉදිකළ මෘදු හා දෘඩ භූ දර්ශන දක්වා තිබීම		
2. යොදාගත් දේශීය හෝ අනුවර්තී වෘක්ෂලතා ආවරණ ප්‍රතිශතය පෙන්නුම් කරන භූ දර්ශන සැලසුම		
3. භූ දර්ශන සැලසුමට යොදාගත් ශාක, ඒවායේ ලක්ෂණ සහිත නම් ලැයිස්තුව		
4. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

SM6 ඉදිකිරීම් ක්‍රියාවලියේදී දූෂණය පාලනය කිරීම ලකුණු 01

අභිප්‍රාය

පාංශු බාදනය, ඇල මාර්ගයන්හි ඇතිවන අවසාදිත තත්ත්වය සහ වායුගෝලයේ දූවිලි අංශු පාලනය කිරීම මගින් ඉදිකිරීම් කටයුතු අතරතුර සිදුවන දූෂණය අවම කිරීම.

මේ සඳහා මුල් නිර්මාණ සැලසුම් අදියරේදීම, නිසිලෙස සැකසූ අවසාදිත කළමනාකරණ සැලැස්මක් සියළුම උපදේශකවරුන් සහ හිමිකරු විසින් අනුගමනය කළ යුතු අතර, ප්‍රසම්පාදන අදියරේදීම එය සැලකිල්ලට ගත යුතුය.

ක්‍රමවේදය

CIDA ආයතනය මගින් දක්වා ඇති ඉංජිනේරු ක්‍රියාමාර්ගයන්ට අනුකූල "අවසාදිත සහ බාදන" පාලනය කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සහ එමගින් පහත අවශ්‍යතා සම්පූර්ණ කිරීම.

- ගොඩනැඟිලි ඉදිකිරීමේ කාල පරිච්ඡේදයේදී වැසි ජල ගලායාම මගින් සිදුවන පාංශු බාදනය හා ජල මාර්ගවල රොන්මඩ තැන්පත්වීම , ඉදිකිරීමේ කාල පරිච්ඡේදයේදී දූවිලි විසිරීම සහ ශබ්ද දූෂණය අවම කිරීම වැනි ක්‍රියාකාරකම් මෙහිදී සිදුකළ යුතුය. **ලකුණු 01**

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. අවසාදිත සහ බාදන පාලනය කිරීමේ සැලැස්ම		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. සුදුසුකම්ලත් තැනැත්තෙක් මගින් සහතික කරන ලද ඡායාරූප සහිත වැඩබිම් වාර්තා ඇතුළත් අවසාදිත හා බාදන පාලනය කිරීමේ වාර්තාව		
2. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

SM7 ගොඩනැඟිලි ඉදිකිරීම්හි ගුණාත්මක තත්ත්වය ළඟා කර ගැනීම ලකුණු 01

අභිප්‍රාය

ගොඩනැඟිලි ඉදිකිරීම් වැඩ සඳහා ඇති CIDA ආයතනය විසින් ප්‍රකාශිත තත්ත්ව තක්සේරු පද්ධතිය දායක කරගනිමින් ඉදිකිරීම් කටයුතු වලදී එහි ගුණාත්මක තත්ත්වය ළඟා කර ගැනීම.

ක්‍රමවේදය

- ඉදිකිරීම් කටයුතු සඳහා CIDA ආයතනයෙන් ප්‍රකාශිත එක් එක් ගොඩනැඟිලි ඉදිකිරීම් අංග සඳහා වන පිරිවිතර වල සඳහන් ගුණාත්මක තත්ත්වය ලබා ගත යුතුය.
- ගොඩනැඟිලි ඉදිකිරීමේ ගුණාත්මක තත්ත්ව තක්සේරුව පිළිබඳ සියළුම උපදේශකවරුන් සහ ගොඩනැඟිලි අයිතිකරු මෙන්ම සියලුම කොන්ත්‍රාත්කරුවන් සහ උප කොන්ත්‍රාත්කරුවන් ද දැනුවත් විය යුතුය.
- ඉදිකිරීම් සහතික ලත් පුද්ගලයෙකු මගින් අධීක්ෂණය වන අතරතුර සියළුම කොන්ත්‍රාත්කරුවන් සහ උප කොන්ත්‍රාත්කරුවන් ඉහත CIDA ප්‍රකාශනයට අනුගත විය යුතුය.

ලකුණු 01

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. CIDAප්‍රකාශනයට අනුකූලව අදාළ තත්ත්වය ළඟා කරගැනීම සඳහා යෝජිත සැලැස්ම දක්වන වාර්තාවක්		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. CIDA ප්‍රකාශනයට අනුකූලව ගොඩනැඟිල්ල අදාළ තත්ත්වය ළඟා කරගත් බවට ව්‍යාපෘති ඉංජිනේරු සහ ව්‍යාපෘති වාස්තු විද්‍යාඥ මගින් ලත් සහතිකය		
2. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

අභිප්‍රාය

වැඩබිම් සේවකයන් මගින් උත්පාදනය වන කසල සහ අනෙකුත් ඉවතලන ද්‍රව්‍ය පාලනය කිරීම මගින් ඉදිකිරීම් ක්‍රියාවලියේදී සිදුවන දූෂණය අවම කිරීම.

ක්‍රමවේදය

- ව්‍යාපෘතිය හා සම්බන්ධ ඉදිකිරීම් වල යෙදෙන සියළුම සේවකයන් සඳහා වැඩබිම් පහසුකම් සැලැස්මක් ඇති කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
  - එම සැලැස්ම මගින් පහත සඳහන් අරමුණු අත්පත් කර ගත යුතුය.
  * ඉදිකිරීම් කම්කරුවන් සඳහා විධිමත් නවාතැන්, එම භූමියේම හෝ ඒ ආසන්නයේ තාවකාලිකව බද්දට ගන්නා ලද ස්ථානවල සැපයීම.
  * පූතික ටැංකි (septic tank) ඇති කිරීම මගින් වැසි වතුර කාණු වලින් ඇතිවන දූෂණය වළක්වා ගැනීම.
  * කසල නිසිලෙස බැහැරකිරීම සහ විවෘත දහනය නැති කිරීම මගින් අවට ප්‍රදේශය දූෂණය වීම වැළැක්වීම.
  * වැඩබිම තුළ සේවකයන් සඳහා සෞඛ්‍ය සහ සනීපාරක්ෂක මෙන්ම වැඩබිමේ සිදුවන අනතුරු වලින් ආරක්ෂා වීම සඳහා පහසුකම් සැපයීම.
  * වැඩබිමෙහි මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා ජලය එක්රැස් නොවීමට කටයුතු කිරීම

ලකුණු 02

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. සියලුම සේවක මණ්ඩලය සහ සේවකයන්ගේ පහසුකම් , සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් ලබාදෙන ස්ථාන දැක්වෙන වැඩබිම් සැලැස්ම		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. සුදුසුකම්ලත් තැනැත්තෙකුගෙන් සහතික කළ ඡායාරූප සහ වැඩබිම් වාර්තා ඇතුළත් සම්පූර්ණ වාර්තාවක්		
2. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

SM9 පොදු ප්‍රවාහන ප්‍රවේශ දිරිගැන්වීම සහ පෞද්ගලික වාහන භාවිතය අවම කිරීම ලකුණු 02

අභිප්‍රාය

ගොඩනැඟිලි ඉදිකිරීම නිසා ඇතිවන මෝටර් වාහන භාවිතය වැඩිවීම සහ එයට අදාළ පරිසර දූෂණය අවම කිරීම. මේ සඳහා මූලික නිර්මාණ අදියරේදීම ගොඩනැඟිල්ලට පහසුවෙන් පොදු ප්‍රවාහන ක්‍රම මගින් ලභා වීමට ඇති හැකියාව ගැන අවධානය යොමු කිරීම.

ක්‍රමවේදය

- ව්‍යාපෘතිය තෝරාගත් භූමියේ සිට මීටර් 250ක් ඇතුළත දැනට පවතින හෝ සැලසුම් කළ එක් බස් නැවතුමක්හෝ අවම වශයෙන් තිබීම හා
  - ප්‍රවාහනය නිසා සිදුවන පරිසර දූෂණය හා ඉඩම් සංවර්ධන බලපෑම් අවම කිරීම සඳහා ප්‍රධාන ප්‍රවාහන ධාරාවලට ප්‍රවේශවීමේ අවම දුර සහිතව හා අවම හෝ බෙදාගැනීමේ පදනම මත යාබද ගොඩනැඟිලි සමග හුවමාරු කරගත හැකි පරිදි සැලසුම් කිරීම හා වෙන වෙනම වාහන සඳහා බිත්ති යොදා වෙන් කිරීම් සිදු නොකරමින් වාහන නැවතුම් පහසුකම් සහිතව ගොඩනැඟිලි ඉදිකිරීම. **ලකුණු 01**

- හරිත වාහන භාවිතය දිරිගැන්වීම සඳහා. (උදා : දෙමුහුන් හෝ විදුලි වාහන)
  - හරිත රථ සඳහා සුදුසු වාහන ගාල්කිරීමේ ස්ථාන ලබාදීම.
  - ව්‍යාපෘති සංකල්ප නිර්මාණ අදියරේදී (concept design stage) හරිත වාහන සඳහා අවශ්‍ය වන නැවැත්වීමේ ස්ථාන වෙන්කිරීම සහ හරිත භාවිතය තවදුරටත් දිරිගැන්වීම සඳහා එම ස්ථාන විදුලි සෝපාන ඇති ස්ථානයන්ට ආසන්නයෙන් ස්ථාන ගත කිරීම.
  - විදුලි වාහන සඳහා බැටරි ප්‍රතිආරෝපන මධ්‍යස්ථාන (Charging centers) පරිශ්‍රය තුළ ලබා දීම.

ලකුණු 01

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. භූමිය සහ ගොඩනැඟිල්ලේ දිශානතිය, දැනට පවතින සහ සැලසුම් කර ඇති පොදු ප්‍රවාහන පහසුකම් දක්වන ලද වැඩබිම් සැලැස්ම. (ගූගල් සිතියමක දැක්වීම ප්‍රමාණවත් වේ).		
2. ගණනය කරන ලද අවම වාහන ගාල් කිරීමේ ස්ථාන ගණන		
3. පූර්ණකාලීන පදිංචිකරුවන්ගෙන් 5%ක් සඳහා වෙනුකරනු ලබන වාහන ගාල් කිරීමේ ස්ථාන දැක්වෙන ඉදිකරන ලද ආකාරය දැක්විය සැලසුම්		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ඡායාරූප මගින් තහවුරු කරන ලද සලකුණු කළ ප්‍රවාහන පද්ධති පහසුකම් ඇතුළත් ඉදිකරන ලද ආකාරය දැක්වෙන සැලසුම්		
2. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

SM10 වාහන නැවැත්වීමේ ධාරිතාවය ලකුණු 02

අභිප්‍රාය

තනි පුද්ගලයන් භාවිතා කරන පෞද්ගලික වාහන මගින් සිදුවන දූෂණය අවම කිරීමත් නාගරික දූෂණය සහ රථවාහන තදබදය අවම කර ගැනීමත් සඳහා පොදු ප්‍රවාහන සහ මෝටර් රථ සංචිත (carpool) දිරිගැන්වීම. මේ සඳහා ව්‍යාපෘති සංකල්ප නිර්මාණ අදියරේදීම අවශ්‍යතාවය අනුව පමණක් අවම රථ ගාල් ප්‍රමාණයක් ලබා දීමට කටයුතු කිරීමට යොමු කිරීම.

ක්‍රමවේදය

රථ ගාල් ප්‍රමාණය ඉක්මවා ලබා දීම වැළැක්වීම සඳහා

- සපයා ඇති මුළු වාහන නැවැත්වීමේ අවකාශයෙන් 2%ක් මෝටර් රථ සංචිත (carpool) සහ වෑන් රථ සංචිත (vanpool) සඳහා ලබා දීම. **ලකුණු 01**

- සපයා ඇති මුළු වාහන නැවැත්වීමේ අවකාශයෙන් 5%ක් මෝටර් රථ සංචිත (carpool) සහ වෑන් රථ සංචිත (vanpool) සඳහා ලබා දීම. **ලකුණු 02**

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. මෝටර් රථ සංචිත සහ වෑන් රථ සංචිත සඳහා සුදුසු ස්ථාන දක්වන සැලසුම හා අදාළ ලකුණු ලබා ගැනීම සඳහා ප්‍රතිශත ගණනය කිරීම		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. මෝටර් රථ සංචිත සහ වෑන් රථ සංචිත සඳහා වෙන්කළ ස්ථාන සුදුසු ස්ථාන දක්වන සැලසුම හා අදාළ ලකුණු ලබා ගැනීම සඳහා ප්‍රතිශත ගණනය කිරීම		
2. සපයා ඇති වාහන ගාල් කිරීමේ ස්ථාන සම්පූර්ණයෙන් ගණනය කළ සුදුසුකම්ලත් තැනැත්තෙකු සහතික කරන ලද වාර්තාව		
3. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

අභිප්‍රාය

ගොඩනැඟිලි ඉදිකිරීම නිසා වැසි ජලය පොළොවට උරා ගැනීම අඩුවීමෙන් ඇතිවන බලපෑම් අවම කිරීම සහ වැසි ජල අතිරික්තය කළමනාකරණය කිරීම. මේ සඳහා මූලික නිර්මාණ අදියරේදීම වැසි ජල ප්‍රමාණය සහ තත්ත්ව පාලනය සඳහා විධිමත් සැලැස්මක් ඉදිරිපත් කිරීම හා වැසි ජලය රඳවා ගැනීම, පොළොවට උරා ගැනීම වැඩි කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගැනීමට යොමු කිරීම.

ක්‍රමවේදය

මේ සඳහා 50mm වර්ෂාපතනයක් නිසා ඇතිවන ජල ප්‍රමාණය පාලනය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග ඉදිරිපත් කළ යුතුයි.

- දැනට පවතින, පොළොවට ජලය උරාගන්නා ප්‍රමාණය 50%කට අඩු නම්, ගොඩනැඟිලි ඉදිකිරීමෙන් පසු භූමියෙන් ගලායන ජල ප්‍රමාණය, ගොඩනැඟිලි ඉදිකිරීමට ප්‍රථමව පැවති තත්ත්වයෙන්ම පවත්වා ගැනීම.

- දැනට පවතින ජලය උරාගැනීම 50%ට වැඩි නම්, ගොඩනැඟිලි ඉදිකිරීමෙන් පසුව භූමියෙන් ගලායන ජල ප්‍රමාණය 25%කින් අඩු කිරීම.

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. මූලිකවැසි ජල සැලසුම් අධ්‍යයන වාර්තාවක්		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. සුදුසුකම්ලත් තැනැත්තෙක් මගින් සහතික කළ ඡායාරූප ඇතුළත් වැඩබිම් වාර්තා සමග සම්පූර්ණ වාර්තාවක්		
2. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

අභිප්‍රාය

මිනිස්, වනජීවී වාසස්ථාන සහ ක්ෂුද්‍ර දේශගුණයට වන බලපෑම හැකිතාක් අවම කිරීම සඳහා උෂ්ණත්වය (සංවර්ධනය වූ සහ සංවර්ධනය නොවූ ප්‍රදේශ අතර තාප අනුක්‍රමණ වෙනස) අඩු කිරීම.

සංකල්ප සැලසුම්අදියරේදී සුදුසු පරිසර සැකසීම සහ සුදුසු සූර්ය පරාවර්තන දර්ශකයන්ට (Solar Reflectance Index - SRI) අනුකූල ද්‍රව්‍යය භාවිතය සහතික කිරීම පැතලි හරිත පියසි භාවිතය උනන්දු කරවීම.

ක්‍රමවේදය

i. දෘඩ භූ දර්ශන (Hard Landscape) සහ හරිත ආවරණ භාවිතය දිරිමත් කිරීම.

ගොඩනැඟිලි පරිශ්‍රය ආශ්‍රිත දෘඩ භූ දර්ශන ස්ථාන (පයින් ගමන් කළ හැකි පාරවල් , මැද මිදුල්, ප්ලාසා සහ වාහන ගාල් කිරීමේ ස්ථාන) වලින් 50%ක් සඳහා පහත උපායමාර්ග වලින් ඕනෑම එකක් භාවිතා කිරීම.

- සෙවන සඳහා සුදුසු ශාක රෝපණය
- අවම වශයෙන් සූර්යපරාවර්තන දර්ශකය 29ක් වන ඇතුරුම් ද්‍රව්‍යය භාවිතා කිරීම.

ලකුණු 01

ii. පියසි ආවරණ භාවිතය

මෙහිදී ආනතිය අංශක 10ට අඩු නම්, අඩු ආනතිය සහිත වහලයක් ලෙස සලකනු ලැබේ.

a. වහලයේ මුළු ප්‍රමාණයෙන් 75%ක් සඳහා අඩු සහ තියුණු ආනතිය සහිත පියසි වල සූර්ය නිරාවරණ දර්ශකය (SRI) පිළිවෙලින් 78% හා 29% වන පියසි ආවරණ භාවිතය.

b. හරිත පියසි සහ අනිත් පියසි ඇති විට

$$\frac{\text{සූර්යය පරාවර්තන දර්ශකය වැසි ජල ප්‍රමාණය}}{0.75} + \frac{\text{හරිත වහල ප්‍රමාණය}}{0.5} > \text{මුළු වහල ප්‍රමාණය}$$

- අවම වශයෙන් 75%ක පියසි ක්ෂේත්‍රඵලයක් සහිතව අඩු සහ තියුණු ආනතිය සහිත පියසිවල සූර්ය පරාවර්තන දර්ශකය (Solar Reflectance Index - SRI)පිළිවෙලින් 78 හා 29 වන පියසි සකසන ද්‍රව්‍යය භාවිතය.

- අවම වශයෙන් පියසි අවරණ ක්ෂේත්‍රඵලයෙන් 50%ක සුදුසු විශේෂ ශාක සහිත ආවරණයක් ඇති කිරීම. පියසි ආවරණ සඳහා සුදුසු විශේෂ ශාක තෝරාගත යුතුය.

ලකුණු 01

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. යෝජිත හරිත ආවරණ **(Greenery)** සහ දෘඩ භූ දර්ශන සැලැස්ම **(Hardscape)** පෙන්නුම් කරන පියසි සැලැස්ම සහ පරිශ්‍රයේ සැලැස්ම (පරිමාණයට)		
2. පරිමාණයට අඳින ඉදිකරන ලද හරිත පියැසේ හරස් කැපුම දැක්වෙන සැලැස්ම - **(Roof cross – section)**		
3. දේශීය සහ අනුවර්තී වෘක්ෂලතා සහ ඒවායේ අවේනික ලක්ෂණ සහිත ලැයිස්තුව		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. භාවිතා කළ ද්‍රව්‍යය සහ ඒවායේ සූර්ය පරාවර්තන දර්ශකයේ **(Solar Reflectance Index - SRI)**අගය ඇතුළත් ලැයිස්තුව, ඉදිකර ඇති ආකාරයට අඳින ලද සැලැස්ම සහ පියැස්සේ හරස් කැපුම		
3. පියැස්ස සහ ඒ සඳහා යොදාගත් ද්‍රව්‍යය වල ඡායාරූප		
4. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

SM13 ගොඩනැඟිලි භාවිතාකරන්නන් සඳහා අත්පොත ලකුණු 01

අභිප්‍රාය

භාවිතා කරන්නන්ට තොරතුරු ලබාදීම සහ භාවිතයේදී කාර්ය සාධනය පවත්වා ගැනීමට මඟපෙන්වීම සඳහා හරිත ගොඩනැඟිලි සැලසුම් අංග සහ ක්‍රමෝපායන් ඇතුළත් ලේඛනයක් අත්පොතක් ලෙස සකස් කිරීම.

ක්‍රමවේදය

ගොඩනැඟිල්ල භාවිතාකරන්නන් සඳහා අත්පොත සැකසීම.

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ගොඩනැඟිල්ල භාවිතාකරන්නන් සඳහා අත්පොත සහ එහි අන්තර්ගත රාමුව සංවර්ධනය කිරීමට දායක වීම		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ගොඩනැඟිල්ල භාවිතාකරන්නන්ගේ අත්පොත		
2. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

MR ගොඩනැඟිලි ද්‍රව්‍යය සහ සම්පත්

අනිවාර්යයෙන්ම අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

1. ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා යොදා ගන්නා සියළුම දැව නීත්‍යානුකූල ලෙස නෙලාගත් දැව විය යුතු අතර, ඒ පිළිබඳව රාජ්‍ය දැව සංස්ථාව සහතික කළ යුතුය.
2. ගොඩනැඟිල්ලේ වහල හෝ සිවිලිම සඳහා ඇස්බැස්ටස් අඩංගු වහල ආවරණ භාවිතා නොකළ යුතුය.
3. ගොඩනැඟිල්ල තුළ එක්රැස් වන කසල අදාළ ප්‍රමිතීන්ට අනුව බෙදා වෙන්කිරීම සිදු කළ යුතුය.
4. ගොඩනැඟිලි නිර්මාණය සඳහා දැව භාවිතයේදී සෑම විටම නීත්‍යානුකූල දැව භාවිතා කිරීම.

MR1 ද්‍රව්‍යය නැවත භාවිතය සහ තෝරා ගැනීම — ලකුණු 02

අභිප්‍රාය

ගොඩනැඟිලි ද්‍රව්‍යය නිෂ්පාදනයේදී අමුද්‍රව්‍යය වශයෙන් යොදා ගන්නා ස්වභාවික සම්පත් සඳහා ඇති ඉල්ලුම අවම කර ගැනීම සඳහා, ප්‍රතිභාවිත ද්‍රව්‍යය හැකිතරම් ගොඩනැඟිලි ද්‍රව්‍යය ලෙස භාවිතා කිරීම කෙරෙහි නිර්මාණකරුවන් උනන්දු කරවීම.

ක්‍රමවේදය

ව්‍යාපෘති සඳහා භාවිතා කරන සම්පූර්ණ ගොඩනැඟිලි ද්‍රව්‍යය වියදමෙන් ≥ 2%ක් ප්‍රතිභාවිත ද්‍රව්‍යය සඳහා වීම. **ලකුණු 01**

හෝ

ව්‍යාපෘති සඳහා භාවිතා කරන සම්පූර්ණ ගොඩනැඟිලි ද්‍රව්‍යය වියදමෙන් ≥ 5%ක් ප්‍රතිභාවිත ද්‍රව්‍යය සඳහා වීම. **ලකුණු 02**

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ව්‍යාපෘතිය සඳහා භාවිතයට යෝජිත ප්‍රති භාවිත ද්‍රව්‍යය ලැයිස්තුව		
2.ප්‍රතිභාවිත කිරීමට යොදාගනු ලබන ද්‍රව්‍යයන්ගේ ඇස්තමේන්තුගත පිරිවැය		
3. ව්‍යාපෘතිය සඳහා යොදාගනු ලබන සම්පූර්ණ ගොඩනැඟිලි ද්‍රව්‍යය ඇස්තමේන්තු කරන ලද පිරිවැය		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන(CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ඉදිකිරීම් කාලසීමාවේදී යොදාගනු ලැබූ ප්‍රතිභාවිත ද්‍රව්‍යවල ඡායාරූප		
2. ගොඩනැඟිල්ල අවසන් කිරීමෙන් පසු ප්‍රතිභාවිත ද්‍රව්‍යය ස්ථාන ගත කරන ලද ස්ථාන සහ ව්‍යාපෘතිය සඳහා යොදාගනු ලැබූ ප්‍රතිභාවිත ද්‍රව්‍යය වල ලැයිස්තුව		
3. ප්‍රතිභාවිතය සඳහා යොදාගත් ද්‍රව්‍යයන්හි පිරිවැය හෝ ද්‍රව්‍ය ප්‍රතිස්ථාපන වියදම		
4. ව්‍යාපෘතිය සඳහා යොදාගනු ලැබූ ගොඩනැඟිලි ද්‍රව්‍යය වල සම්පූර්ණ පිරිවැය		
5. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

MR2 ප්‍රතිචක්‍රීකරණය කරන ලද දෑ අඩංගු ද්‍රව්‍යය ලකුණු 02

අභිප්‍රාය

ගොඩනැඟිලි ද්‍රව්‍යය නිෂ්පාදනයේදී අමුද්‍රව්‍යය වශයෙන් යොදා ගන්නා ස්වභාවික සම්පත් සඳහා ඇති ඉල්ලුම අවම කර ගැනීම සඳහා, ප්‍රතිචක්‍රීකරණය කළ ද්‍රව්‍යය හැකිතරම් ගොඩනැඟිලි ද්‍රව්‍යය ලෙස භාවිතා කිරීම කෙරෙහි නිර්මාණකරුවන් උනන්දු කරවීම.

ක්‍රමවේදය

1. ගොඩනැඟිල්ලේ මුළු ද්‍රව්‍යය සඳහා වන පිරිවැයෙන් ≥2%ක ප්‍රමාණයක් ප්‍රතිචක්‍රීකරණය කරන ලද දේ අඩංගු ද්‍රව්‍යය යෙදවීම. **ලකුණු 01**

2. ගොඩනැඟිල්ලේ මුළු අමුද්‍රව්‍යය සඳහා වන පිරිවැයෙන්≥5%ක ප්‍රමාණයක් ප්‍රතිචක්‍රීකරණය කරන ලද දේ අඩංගු ද්‍රව්‍යය යෙදවීම. **ලකුණු 02**

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. යොදා ගන්නා එක් එක් ද්‍රව්‍යයන්හි ඇති ප්‍රතිචක්‍රීකරණය කරන ලද අන්තර්ගතය ගණනය කළ ලේඛන		
2. ප්‍රතිචක්‍රීකරණය කරන ලද ද්‍රව්‍යය අන්තර්ගතයේ පිරිවැය ප්‍රතිශතයක් ලෙස දැක්වීම. ගොඩනැඟිල්ල පාවිච්චි කිරීමට පෙර (පෙරභාවිතය) සහ නිර්මාණයට යොදාගත් පසු (පසු භාවිතය)		
3. ප්‍රතිචක්‍රීකරණය කරන ලද අන්තර්ගතය සහිත ද්‍රව්‍යයන්හි ප්‍රභවයන් / සැපයුම්කරුවන් පිළිබඳ විස්තර		
4. ව්‍යාපෘතිය සඳහා යොදාගනු ලබන ද්‍රව්‍යයන්හි ඇස්තමේන්තුගත මුළු වටිනාකමට එරෙහිව ප්‍රතිචක්‍රීකරණය කරන ලද අන්තර්ගතය සහිත ද්‍රව්‍යයන්හි ඇස්තමේන්තුගත වටිනාකම ඉදිරිපත් කළ ලේඛනය		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන(CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ඉදිකිරීම් අදියර තුළ යොදා ගත් නැවත ප්‍රතිචක්‍රීකරණය කරන ලද ද්‍රව්‍යයන් අඩංගු ද්‍රව්‍යයන්හි ඡායාරූප ඇතුළත් විස්තර සහිත ලේඛනය		
2. යොදා ගත් එක් එක් ද්‍රව්‍යයන්හි අන්තර්ගත ප්‍රතිචක්‍රීකරණය කරන ලද ද්‍රව්‍යය ප්‍රමාණය ගණනය කිරීම		
3. යොදා ගත් ප්‍රතිචක්‍රීකරණය කරන ලද අන්තර්ගතය සහිත ද්‍රව්‍යයන්හි ප්‍රභවයන් / සැපයුම්කරුවන් පිළිබඳ විස්තර		
4. ව්‍යාපෘතියේ ද්‍රව්‍යය සඳහා වන වියදමට එරෙහි ප්‍රතිචක්‍රීකරණය කරන ලද අන්තර්ගතය සහිත ද ද්‍රව්‍යයන්හි ප්‍රතිශතය ගණනය කිරීම. පෙර භාවිත හෝ පසු භාවිත ප්‍රතිවක්‍රීකරණය කරන ලද ද්‍රව්‍යය ප්‍රතිශතය හා පිරිවැය ඇතුලත් ලේඛනය		
5. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

MR3 ගොඩනැඟිලි නැවත භාවිතය ලකුණු 02

අභිප්‍රාය

ගොඩනැඟිලිවල ජීව කාලය දීර්ඝ කිරීම සඳහා ගොඩනැඟිලි සංරක්ෂණය, සම්පත් සංරක්ෂණය කිරීම, සංස්කෘතිකමය වටිනාකම් පවත්වාගෙන යාම , කසල ජනනය අවම කිරීම අපේක්ෂා කෙරේ. එමෙන්ම ගොඩනැඟිලි නැවත ඉදිකිරීමට අමුද්‍රව්‍යය භාවිතයේදී සහ ප්‍රවාහනයෙන් සිදුවන පරිසර හානිය අවම කිරීම සඳහා සංරක්ෂණය කිරීමේදී හා නැවත සංවර්ධනයේදී පවත්නා ගොඩනැඟිලි වලින් වැඩි ප්‍රතිශතයක් නැවත භාවිතා කිරීම.

ක්‍රමවේදය

- පවත්නා ගොඩනැඟිල්ලේ වර්ග ප්‍රමාණයෙන්30% - 49% ක් නැවත භාවිතා කිරීම
  ලකුණු 01

- පවත්නා ගොඩනැඟිල්ලේ වර්ග ප්‍රමාණයෙන් 50%ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් නැවත භාවිතා කිරීම
  ලකුණු 02

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. සංවර්ධන ව්‍යාපෘතියට යොදාගත් පවත්නා ගොඩනැඟිල්ලේ මුල් සැලසුම්		
02. ගොඩනැඟිල්ල නැවත භාවිතය සඳහා යෝජිත ආකාරය හා නැවත භාවිතා කරන කොටස් වර්ණ කර දක්වන සැලසුම්		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ගොඩනැඟිල්ල නැවත භාවිතා කරන ලද ආකාරය හා කොටස් දක්වන ඉදිකළ ආකාරය දක්වන සැලසුම්		

MR4 ගොඩනැඟිලි සඳහා කලාපීය ද්‍රව්‍යය භාවිතය ලකුණු 03

අභිප්‍රාය

ගොඩනැඟිලි ද්‍රව්‍යය ප්‍රවාහනය කිරීමේදී ඇතිවන පාරිසරික ගැටලු අවම කිරීම සඳහා, සංරක්ෂණය කිරීමේදී හා නැවත සංවර්ධනයේදී හෝ නව ගොඩනැඟිලි නිර්මාණය කිරීමේදී, කලාපීය වශයෙන් ද්‍රව්‍යය ලබා ගැනීමට උනන්දු කරවීම.

ක්‍රමවේදය

- ගොඩනැඟිලි ද්‍රව්‍යය හෝ ඒ සඳහා යොදාගන්නා අමුද්‍රව්‍යය ගොඩනැඟිල්ල ඉදිකරන ප්‍රදේශයෙන් ලබා ගැනීම, අවම වශයෙන් 10%ක ප්‍රමාණයක් (ගොඩනැඟිලි ද්‍රව්‍යය වල මුළු වියදමින්) - එම ප්‍රාදේශික දුර ප්‍රමාණය 200kmකඇතුළත විය යුතුය. **ලකුණු 01**

- ගොඩනැඟිලි ද්‍රව්‍යය හෝ ඒ සඳහා යොදාගන්නා අමුද්‍රව්‍යය ගොඩනැඟිල්ල ඉදිකරන ප්‍රදේශයෙන් ලබා ගැනීම, අවම වශයෙන් 20%ක ප්‍රමාණයක් (ගොඩනැඟිලි ද්‍රව්‍යය වල මුළු වියදමින්) - එම ප්‍රාදේශික දුර ප්‍රමාණය 200kmකඇතුළත විය යුතුය. **ලකුණු 02**

- ගොඩනැඟිලි ද්‍රව්‍යය හෝ ඒ සඳහා යොදාගන්නා අමුද්‍රව්‍යය ගොඩනැඟිල්ල ඉදිකරන ප්‍රදේශයෙන් ලබා ගැනීම, අවම වශයෙන් 30%ක ප්‍රමාණයක් (ගොඩනැඟිලි ද්‍රව්‍යය වල මුළු වියදමින්) - එම ප්‍රාදේශික දුර ප්‍රමාණය 200kmකඇතුළත විය යුතුය. **ලකුණු 03**

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. සංවර්ධන ව්‍යාපෘතියට යොදාගන්නා ප්‍රාදේශීය අමුද්‍රව්‍යය සහ ගොඩනැඟිලි ද්‍රව්‍යය පිළිබඳ විස්තර ලැයිස්තුව		
02. පහත දෑ සැපයිය යුතුය. • නිෂ්පාදනයේ නම • නිෂ්පාදන පිරිවැය (වියදම) සහ නිෂ්පාදනකරු සහ ව්‍යාපෘති භූමිය අතර දුර		
3. අමුද්‍රව්‍ය/ ද්‍රව්‍යය සඳහා වන ඇස්තමේන්තු ගත සමස්ත පිරිවැය		
4. භාවිතයට යෝජිත කලාපීය අමුද්‍රව්‍යය හෝ ද්‍රව්‍යය සමස්ත පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වීම		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ප්‍රාදේශිය වශයෙන් නිපදවන ලද ගොඩනැඟිලි ද්‍රව්‍යය වල විස්තර පහත සඳහන් අන්තර්ගත සමග ලබා දිය යුතුයි • අමුද්‍රව්‍යය ලබාගත් දුර ප්‍රමාණය • එම අමුද්‍රව්‍යය යොදා නිපදවන ලද ගොඩනැඟිලි ද්‍රව්‍යය, මුළු ද්‍රව්‍යය වියදමෙන් ප්‍රතිශතයක් ලෙස ඉදිරිපත් කිරීම		
3. අමුද්‍රව්‍යය/ ද්‍රව්‍යය සඳහා වැය වූ සමස්ථ පිරිවැය තීරණය කිරීම		
4. භාවිතා කළ කලාපීය ද්‍රව්‍යයන්හි පිරිවැය සමස්ත අමුද්‍රව්‍යය/ ද්‍රව්‍යයන් පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස		
5. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

MR5 තිරසර දැව — ලකුණු 03

අභිප්‍රාය

ගුණාත්මක සහ වේගවත් වර්ධනයක් සහිත වන වගා ප්‍රමාණය වැඩි කර , එම දැව විද්‍යාත්මකව නිවැරදිව පරිහරණය කිරීම තුළින්, දැව වල ආයු කාලය වැඩි කිරීම සහ ස්වභාවික වනාන්තර කෙරෙහි ඇති විනාශකාරී බලපෑම අඩු කිරීම.

ක්‍රමවේදය

දැව භාවිතා කරන අවශ්‍යතාවය අනුව ගුණාත්මක තත්ත්වය පිළිබඳ සහතික කරනලද දැව සහ දැව නිෂ්පාදන 100%ක් භාවිතා කිරීම.
ඉහත අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන දැව සංස්ථාව මගින් හරිත ගොඩනැඟිලි සඳහා වන දැව භාවිතය සඳහා සකස් කරන ලද වර්ගීකරණයට අනුකූලව,

3 වෙනි ශ්‍රේණිය දැව භාවිතා කිරීම	ලකුණු 01
2 වෙනි ශ්‍රේණිය දැව භාවිතා කිරීම	ලකුණු 02
1 වෙනි ශ්‍රේණිය දැව භාවිතා කිරීම	ලකුණු 03

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ව්‍යාපෘතිය සඳහා නිශ්චිත සියළු නව දැවමය නිෂ්පාදන ලැයිස්තුව පිරිවිතරයන් සමඟ ඉදිරිපත් කිරීම සහ එම දැව යොදාගැනීමට යෝජිත ස්ථාන පැහැදිලිව දැක්වීම.		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන(CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. භාවිත කරන ලද දැව සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ දැව සංස්ථාවේබලපත්‍ර ඉදිරිපත්කිරීම සහ වර්ගීකරණයට අදාළ සහතිකය		
2. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

MR6 වැඩි හරිත අගයකින් යුත් ගොඩනැඟිලි ද්‍රව්‍යය භාවිතා කිරීම ලකුණු 02

අභිප්‍රාය

ගොඩනැඟිලි ද්‍රව්‍යය භාවිතයෙන් පරිසරයට සහ පරිභෝජනය කරන ජනතාවට ඇතිවන හානිය අවම කිරීම සඳහා, සංවර්ධන ව්‍යාපෘති සඳහා වැඩි හරිත අගයකින් යුතු ගොඩනැඟිලි ද්‍රව්‍යය භාවිතා කිරීම කෙරෙහි උනන්දු කරවීම.

ක්‍රමවේදය

CIDA ආයතනයේ ගොඩනැඟිලි ද්‍රව්‍යය හරිත තත්වය මැන බැලීමේ ක්‍රමවේදයට අනුව,
ව්‍යාපෘතිය සඳහා හරිත අගය ≥ 2.5% දක්වා ඇති ද්‍රව්‍යය
මුළු ද්‍රව්‍යය පිරිවැයෙන් 20% - 40% අතර ප්‍රමාණයක් භාවිතා කිරීම

ලකුණු 01

ව්‍යාපෘතිය සඳහා හරිත අගය ≥ 2.5% දක්වා ඇති ද්‍රව්යය
මුළු ද්‍රව්‍යය පිරිවැයෙන් 40% - 60% අතර ප්‍රමාණයක් භාවිතා කිරීම

ලකුණු 02

ව්‍යාපෘතිය සඳහා හරිත අගය ≥ 2.5% දක්වා ඇති ද්‍රව්‍යය
මුළු ද්‍රව්‍යය පිරිවැයෙන් ≥ 60% ප්‍රමාණයක් භාවිතා කිරීම ලකුණු 03

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ගොඩනැගිල්ල සඳහා යොදාගැනීමට යෝජිත හරිත අගය 2.5ට වැඩි ගොඩනැඟිලි ද්‍රව්‍යය ලැයිස්තුව		
2. හරිත අගය ගණනය කර විස්තර පත්‍රිකාව පහත සඳහන් අන්තර්ගතය සමග **a. අමුද්‍රව්‍යය විස්තර** **b. බලශක්ති පරිභෝජනය සහ Co_2 මුදාහැරීම** **c. රසායනික ක්‍රියාදාමය සහ අමුද්‍රව්‍යය සංයුතිය** **d. නඩත්තු කිරීමේ අවශ්‍යතා** **e. භාවිතයේදී රසායනික ද්‍රව්‍යය නිකුත් වීම** **f. අවසාන වටිනාකම**		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ඉදිකිරීම සඳහා යොදාගත් හරිත අගය **2.5**ට වැඩි ගොඩනැඟිලි ද්‍රව්‍යය ලයිස්තුව		
2. යොදාගත් ද්‍රව්‍යය වල හරිත අගය ගණනය කර විස්තර පත්‍රිකාව පහත සඳහන් අන්තර්ගතය සමග **a.** අමුද්‍රව්‍යය විස්තර **b.** බලශක්ති පරිභෝජනය සහ Co_2 මුදාහැරීම **c.** රසායනික ක්‍රියාදාමය සහ අමුද්‍රව්‍යය සංයුතිය **d.** නඩත්තු කිරීමේ අවශ්‍යතා **e.** භාවිතයේදී රසායනික ද්‍රව්‍යය නිකුත් වීම **f.** අවසාන වටිනාකම		
3. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

MR7 ඉදිකිරීම් අපද්‍රව්‍යය කළමනාකරණය ලකුණු 02

අභිප්‍රාය

ඉදිකිරීම් අපද්‍රව්‍යය අවම කිරීම හා ප්‍රතිචක්‍රීකරණය කිරීම සහ බැහැරලීම, බිම් පිරවුම් බවට පරිවර්තනය කිරීම ආදිය සඳහා ඉදිකිරීම් අපද්‍රව්‍යය කළමනාකරණ වැඩපිළිවෙලක් සකස් කිරීමට උනන්දු කරවීම.

ක්‍රමවේදය

1. උපද්‍රවකාරී නොවන ඉදිකිරීම් සුන්බුන් ද්‍රව්‍ය පරිමාවෙන් ≥25%ක් ප්‍රතිචක්‍රීකරණය කිරීමට යොමු කිරීම හෝ මුදාගත් (salvaged) ද්‍රව්‍යය බවට පත් කිරීම.

   ලකුණු 01

2. උපද්‍රවකාරී නොවන ඉදිකිරීම් සුන්බුන් ද්‍රව්‍ය පරිමාවෙන් ≥ 50%ක් ප්‍රතිචක්‍රීකරණය කිරීමට යොමු කිරීම හෝ මුදාගත් (salvaged) ද්‍රව්‍යය බවට පත් කිරීම.

   ලකුණු 02

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිඛිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. වෙනත් ද්‍රව්‍යයක් බවට පත් කිරීම / ප්‍රතිචක්‍රීකරණය / බිම් පිරවුම් සඳහා යොදා ගැනීමට අපේක්ෂිත අපද්‍රව්‍යයන් වගුගත කිරීම සහ එම අපද්‍රව්‍යයන්හි ප්‍රමාණය ගණනය කිරීම		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන(CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ඉදිකිරීම් අපද්‍රව්‍යය කළමනාකරණ සැලැස්මෙහි පිටපත මගින් තහවුරු කරන ලද සම්පූර්ණ අපද්‍රව්‍යයන්හි ප්‍රමාණයට එරෙහි වෙනත් ද්‍රව්‍යයන් බවට පරිවර්තනය කරන ලද / ප්‍රතිචක්‍රීකරණය කළද / බිම් පිරවුම් සඳහා යොදාගනු ලැබූ අපද්‍රව්‍යය ප්‍රමාණය තහවුරු කළ හැකි වාර්තා		
2. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

MR 8 ශීතකාරක හා පිරිසිදුකාරක ලකුණු 03

අභිප්‍රාය

ශූන්‍ය ඕසෝන් ප්‍රහීනකාරක විභවයකින් හා හැකිතාක් දුරට අවම ගෝලීය උණුසුම් විභවයන් සහිත ද්‍රව්‍යය භාවිතය අනිවාර්යය කිරීම හා එම ද්‍රව්‍යය හඳුනා ගැනීම.

ක්‍රමවේදය

1. යොදාගනු ලබන ශීතකාරක ,පිරිසිදුකාරකයන් ශූන්‍ය ඕසෝන් ප්‍රහීනකාරක විභවයකින් සහ ගෝලීය උණුසුම් විභවය 2000ට අඩු එහෙත් 700ට වැඩි විභවයන් සහිත නිෂ්පාදන භාවිත කිරීම.

ලකුණු 01

2. කෘතිමව සංශ්ලේෂණය නොකරන (ස්වභාවික) ලද ශූන්‍ය ඕසෝන් ප්‍රහීනකාරක විභවයකින් සහ ගෝලීය උණුසුම් විභවය 700ට අඩු අගයකින් යුතු ශීතකාරක / පිරිසිදුකාරක භාවිතා කිරීම.

ලකුණු 02

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. භාවිතා කිරීම සඳහා යෝජිත ශීතකාරක හා පිරිසිදුකාරක සහ / හෝ භාවිතා කරන ශීතකාරක හෝ පිරිසිදුකාරක වර්ග සහ විස්තර (specification)		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. භාවිතා කළ උපකරණ වල අන්තර්ගත ශීතකාරක හා පිරිසිදුකාරක ලැයිස්තුව හා විස්තර (specification)		
2. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

EQ ගොඩනැඟිලි ඇතුළත පරිසරයේ ගුණාත්මක භාවය

EQ1 කාබන්ඩයොක්සයිඩ් (CO_2) අධීක්ෂණය හා පාලනය ලකුණු02

අභිප්‍රාය

ගොඩනැඟිල්ල තුළට වාතාශ්‍රය අවශ්‍ය ප්‍රමාණයට ලබා දීම මඟින් ගොඩනැඟිල්ල භාවිතා කරන්නන්ගේ ශරීර සුවතාවය තහවුරු කිරීම. ඒ සඳහා ප්‍රධාන මිනුම ලෙස කාබන්ඩයොක්සයිඩ් (CO_2) සාන්ද්‍රනය මැන බැලීම.

ක්‍රමවේදය

කාබන්ඩයොක්සයිඩ් (CO_2) මැන බැලීමට අදාළ උපකරණ ගොඩනැඟිල්ලේ ස්ථාපනය කිරීම. අවම වශයෙන් එක් උපකරණයක් ගොඩනැඟිල්ලේ ඇතුළත වාතය පිටතට යොමු කරන ස්ථානයේ ස්ථාපිත කිරීම. කාබන්ඩයොක්සයිඩ් (CO_2) සාන්ද්‍රනය < 1000 ppmවල පවත්වා ගත යුතුය.

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. කාබන්ඩයොක්සයිඩ් (CO_2)මට්ටම නිරීක්ෂණය හා පාලනය සඳහා ස්ථාපනය කිරීමට යෝජිත සංවේදක හා උපකරණ පිළිබඳ විස්තර		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ගොඩනැඟිල්ලේ ස්ථාපනය කර ඇති (CO_2)සංවේදක සහ පාලනය කරන උපකරණ වල විස්තර		
2. කාබන්ඩයොක්සයිඩ් පාලනය සහ නිරීක්ෂණය අදාළ උපකරණ වල ස්ථානගත කිරීම්, එම උපකරණ වල ප්‍රමාණයන් හා ක්‍රියාත්මක කිරීමේ පියවර පිළිබඳව සාරාංශ විස්තර		
3. (CO_2) පාලනය හා නිරීක්ෂණය භාවිතා කරන ලද උපකරණවල තොරතුරු හා නිෂ්පාදකයාගේ විස්තර		
4. ඉහත ක්‍රියාමාර්ග ස්ථානගත කර ඇති ස්ථාන පිළිබඳ ඡායාරූප		
5. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

EQ2 ගෘහස්ථ වායු දූෂක ලකුණු02

අභිප්‍රාය

වාෂ්පශීලී කාබනික සංයෝග(VOC) හා ෆොමැල්ඩිහයිඩ් අවම වශයෙන් අන්තර්ගත ගොඩනැඟිලි ද්‍රව්‍යය භාවිතා කිරීම තුළින් පදිංචිකරුවන්ගේ සෞඛ්‍යයට වන හානිකර බලපෑම් අවම කිරීම.

ක්‍රමවේදය

මේ සඳහා තීන්ත ආලේපන සහ අනෙකුත් ආලේපන, කාපට්, බිම් ඇතුරුම් ආදිය සලකා බලනු ලැබේ.

- VOC අඩු වශයෙන්අඩංගු වන (Low VOC) තීන්ත ආලේපන සහඅඩු වශයෙන් VOC අඩංගු වන කාපට් සහ බිම් ඇතුරුම්සම්පූර්ණගොඩනැඟිල්ල සඳහා භාවිතාකිරීම.

  ලකුණු 01

- ගොඩනැඟිල්ල සඳහායූරියා ෆොමැල්ඩිහයිඩ් අඩංගු වන ගොඩනැඟිලි ද්‍රව්‍යය භාවිතා නොකිරීම. ලකුණු 01

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. භාවිතා කිරීමට අපේක්ෂිත තීන්ත ආලේපන සහ අනෙකුත් ද්‍රව්‍යය සඳහා වාෂ්පශීලී කාබනික සංයෝග සහ ෆොමැල්ඩිහයිඩ් අඩංගු නොවන බවට පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ගොඩනැඟිල්ල සඳහා භාවිතා කළ අවම වාෂ්පශීලී අන්තර්ගත ද්‍රව්‍යය හෝ නිෂ්පාදන සලකුණු කරනු ලබන සැලසුම		
2. ලකුණු ලබා ගැනීම සඳහා ගොඩනැඟිල්ලේ ස්ථාපනය කරනු ලැබූ අවම වාෂ්පශීලී සංයෝග අඩංගු නිෂ්පාදන පිළිබඳ විස්තර හා එම දත්ත ලැයිස්තුව		
3. ලකුණු සඳහා අනුගත වීම පෙන්නුම් කරනු ලබන භාවිතා කරන ලද අවම වාෂ්පශීලී ද්‍රව්‍යය අඩංගු අමුද්‍රව්‍යය නිෂ්පාදනකරුගේ තොරතුරු අඩංගු දත්ත වාර්තා. සහතික හා පරීක්ෂණ වාර්තා		
4. අවම වාෂ්පශීලී සංයෝග අඩංගු අමුද්‍රව්‍යය භාවිතයෙන් ස්ථාපනය කරන ලද එක් එක් අංශයන්ගේ ඡායාරූප		
5. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

EQ3 ප්‍රශස්ත උෂ්ණත්ව පාලන සැලසුම් හා පද්ධතීන් නිර්මාණය කිරීම ලකුණු02

අභිප්‍රාය

ගොඩනැඟිලි නිර්මාණයේදී ගොඩනැඟිල්ලේ ඇතුළත තාප තත්වය ප්‍රශස්ත මට්ටමෙන් පවත්වාගෙන යාමෙන් ගොඩනැඟිල්ල භාවිතා කරන්නන් සඳහා සුවපහසු මෙන්ම ඵලදායිතා සහ පැවැත්මට අදාළ වනඋෂ්ණත්ව මට්ටමක් පවත්වා ගෙන යාම.

ක්‍රමවේදය

ගොඩනැඟිල්ලේ අභ්‍යන්තර උෂ්ණත්වය ප්‍රශස්ත මට්ටමේ පවත්වා ගැනීම සඳහා ගොඩනැඟිල්ලේ HVAC පද්ධතිය හා ගොඩනැඟිල්ලේ බාහිර ආවරණය ASHRAE තත්ත්ව 55 – 2004, (මිනිස් භාවිතය සඳහා උෂ්ණත්ව පහසුව දක්වා ඇති කොටසට අනුකූලකොටස) තත්ත්වයන් ළඟා කර ගැනීම හා ප්‍රශස්ත උෂ්ණත්වය මැනීමේ හා පාලනය කරන උපකරණ සවි කිරීම. **ලකුණු 02**

LIBRARY
MINISTRY OF ENVIRONMENT

සැලසුම් ඇගයීම සඳහා අවශ්ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ගොඩනැඟිල්ල ASHRAE තත්ත්ව 55 – 2004, මිනිස් භාවිතය සඳහා උෂ්ණත්ව පහසුව අනුකූල තත්ත්වයන් ළඟා කර ගැනීම හා ප්‍රශස්ත උෂ්ණත්වය මැනීමේ හා පාලනය කරන උපකරණ සවි කිරීම සඳහා නිර්මාණය කළ ආකාරය දක්වන වාර්තාව		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ගොඩනැඟිල්ල ASHRAE තත්ත්ව55 – 2004, මිනිස් භාවිතය සඳහා උෂ්ණත්ව පහසුව අනුකූල තත්ත්වයන් ළඟා කර ගැනීම හා ප්‍රශස්ත උෂ්ණත්වය මැනීමේ හා පාලනය කරන උපකරණ සවි කිරීම සඳහා ඉදිකළ ආකාරය දක්වන වාර්තාව		
2. පැය 72ක් තුලදී ලබා ගන්නා ලද උෂ්ණත්ව දත්ත		
3. තනි පුද්ගල හා සමූහ වශයෙන් භාවිත කරන අවකාශ වල උෂ්ණත්ව දත්ත වාර්තා.		
4. සවිකරන ලද සංවේදක පාලන වර්ගයන්හි ඡායාරූප		
5. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

EQ4 වෙනස් වන වාතයේ සඵලතාවය ලකුණු01

අභිප්‍රාය

ගොඩනැඟිල්ලට පිරිසිදු වාතය සැපයීම සඳහා ගොඩනැඟිල්ලෙන් මුදා හල වාතය හා සැපයුම් වාතය අතර මිශ්‍ර වීම වැළැක්වීම.

ක්‍රමවේදය

ගොඩනැඟිල්ලේ සම්පූර්ණ වර්ග ප්‍රමාණයෙන් 90%ක ප්‍රමාණයක් සඳහා ඇතුළත වාතය පහත සඳහන් තත්වයන් කරා ළඟා වීම. ගොඩනැඟිල්ල තුළට වාතාශ්‍රය සපයන පද්ධතිය ACE > 0.95 වන ලෙස නිර්මාණය කිරීම.
(* ACE – Air Change Effectiveness) ASHRAE 129– 1997ට අනුකූලව). ACE මනිනු ලබන්නේ පොළොවේ සිට මීටර් 01ක උසකිනි. ලකුණු 01

සටහන :වාතාශ්‍ර හුවමාරු සඵලතාවය

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. සංවර්ධනයේදී එක් එක් අවකාශ සඳහා වාතයේ තත්ත්වය ප්‍රශස්ත කිරීම සඳහා තෝරාගනු ලබන නිර්මාණ නිර්මාපක සාරාංශ වාර්තාව		
2. ලකුණු ලබා ගැනීම සඳහා වාතාශ්‍ර පද්ධතිය සැලසුම් කරන අයුරු විස්තර කිරීම		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. වාතාශ්‍ර පද්ධතිය (Ventilation System) ස්ථාපනය කළ ආකාරය දැක්වෙන සැලසුම / සටහන		
2. ඉදිකිරීමේදී එක් එක් අවකාශ සඳහා වාතයේ තත්ත්වය ප්‍රශස්ත කිරීම සඳහා ස්ථාපනය කරනු ලැබූ නිර්මාණ ක්‍රම පිළිබඳ සාරාංශ වාර්තාව		
3. ලකුණු අවශ්‍යතා සපුරාලීම සඳහා අනුකූල වන මිනුම් වාර්තා		
4. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

EQ5 දිවා ආලෝකය ලකුණු02

අභිප්‍රාය

විසරිත දිවා ආලෝකය ගොඩනැඟිලි අභ්‍යන්තරය තුළ භාවිතය සඳහා දිරිගැන්වීම.

ක්‍රමවේදය

- බිම් මට්ටමේ සිට මිලිමීටර් 800 උසකදී වැඩ තලය මත මනින ලද දිවා ආලෝක සාධකය 2.0% ලෙස පවත්වා ගැනීමට ගොඩනැඟිල්ලේ මුළු වර්ග ප්‍රමාණයෙන් ≥30%කට දිවා ආලෝකය ලබා ගැනීම. **ලකුණු 01**

හෝ

- දිවා ආලෝක සාධකය 2.0% ලෙස පවත්වා ගනිමින් බිම් මට්ටමේ සිට මිලිමීටර් 800 උසකට දිවා ආලෝකය ≥ 50% ගොඩනැඟිලි අභ්‍යන්තරය තුළට ලබා ගැනීම. **ලකුණු 02**

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. සූර්යාලෝකයේ දීප්තිය (Glare) පාලනය කිරීම සඳහා යෝජිත උපායමාර්ග සහිතව ගොඩනැඟිල්ල දිවා ආලෝකය ලබා ගැනීමට නිර්මාණය කරනආකාරය දක්වන රූප සටහන් සහිත සාරාංශ වාර්තාව		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ඉදිකළ ආකාරය දක්වන සැලසුම් වලට අනුව නිර්මාණය කරන ලද දිවා ආලෝකය ලබා ගැනීමේ පද්ධතිය ස්ථාපනය කරන ලද ආකාරය දැක්වෙන සටහන		
2. දිවා ආලෝක සාධකය මැනීමෙන් ලද ප්‍රතිඵල දක්වන ලද දළ බිම් සැලසුම		
3. පවතින ගොඩනැඟිලි වල උස හා සැලසුම් කළ ගොඩනැඟිලි පිහිටීම අනුව ගොඩනැඟිලි වල සූර්ය ආලෝකයේ බලපෑම රූප සටහන් හා හිරු එළිය වැටෙන මාර්ගය (Solar diagram &Sub path) අන්තර්ගත වැඩබිම් සැලසුම		
4. දිවා ආලෝක සාධකයේ ප්‍රතිඵල පිළිබඳ සාරාංශය		
5. සවිකරන ලද එක් එක් උපකරණයෙහි ඡායාරූප		
6. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

EQ6 ලබා ගන්නා හිරු එළියේ අධික දීප්තිය පාලනය කිරීම ලකුණු01

අභිප්‍රාය

දිවා සූර්යාලෝකයේ දැඩි දීප්තිය හේතුකොට ගෙන සිදුවන අපහසුතා පාලනය කිරීම සඳහා පද්ධතියක් හෝ ක්‍රමවේදයන් ස්ථාපනයට දිරිමත් කිරීම.

ක්‍රමවේදය

පහත ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් ප්‍රධාන ගොඩනැඟිල්ලේ පිටත පෘෂ්ඨයේ වීදුරු මත ආවරණ හෝ වැස්ම මගින් ස්වභාවික දැඩි හිරු එළියේ දීප්තිය හේතුවෙන් සිදුවන අපහසුතාවය අවම කිරීම.

1. සෘජු හිරු කිරණ ඇතුළත අවකාශ වලට පතිත වීම වළක්වා lux 2000ට අඩු තිරස් දීප්තියක් වැඩ තලයේ පවත්වා ගැනීම.
2. තිරස් තලයේ සිට අංශක 15 – 60 අතර දෘශ්‍ය කෝණයකදී, ගොඩනැඟිල්ල භාවිතාකරන්නන් මත විපරිත හිරු කිරණ වළක්වා ගැනීම. (මනිනු ලබන්නේ පොළොව මට්ටමේ සිට මීටර් 1.2ක උස මට්ටමේදීය).
මේ සඳහා හිතකර පරිසරයක් ගොඩනැඟිල්ල අවට සකස් කර ගැනීමට සුදුසු ශාක වර්ග යොදා ගැනීම.
3. සෘජු සූර්ය කිරණ පතිත වීම වළක්වා අවම වශයෙන් දිවා ආලෝක සාධනයේ ≥2%ක් සම්පූර්ණ ගොඩනැඟිලි ක්ෂේත්‍රඵලයෙන් 75%කට ලබා ගැනීම.

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. යෝජිත සූර්යාලෝක පාලන යාන්ත්‍රණය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයන්		
2. සූර්යාලෝකයේ දීප්තිය පාලනය කිරීමේ පද්ධතිය ක්‍රියාත්මත වූ විට පෙනීම හා දිවා ආලෝකය ලැබීම පිළිබඳ සහතිකවීමේ සංක්ෂිප්ත වාර්තාව		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ගොඩනැඟිල්ල නිර්මාණ සැලසුම් හා විස්තර අනුව ඉදිකර ඇති බව සනාථ කිරීමට ඉදිකර ඇති ආකාරය දැක්වෙන නිර්මාණාත්මක සැලසුම් හා විස්තර		
2. ඉදිකිරීමෙන් පසු හිරු එළියේ දීප්තිය පාලනය කිරීමේ පද්ධතිය ක්‍රියාත්මත වූ විට පෙනීම හා දිවා ආලෝකය ලැබීම පිළිබඳ සහතිකවීමේ සංක්ෂිප්ත වාර්තාව		
3. ස්ථාපනය කරන ලද පාලන පද්ධතියක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර		
4. එක් එක් වර්ගවලට අයත් ස්ථාපනය කරන ලද හිරු එළියේ දීප්තිය පාලනය කිරීම් පද්ධතියේ ඡායාරූප		
5. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

EQ7 විද්‍යුත් ආලෝක මට්ටම ලකුණු 01

අභිප්‍රාය

කාර්යාලීය විද්‍යුත් පද්ධතිය නිර්මාණය කිරීමේදී මනා සඵලතාවයකින් යුක්ත නිර්මාණ ඉදිරිපත් කිරීම දිරිගැන්වීම.

ක්‍රමවේදය

සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් නිකුත් කරන ආලෝකප්‍රමිති මට්ටම්වල අවසාන සංස්කරණය අනුව විය යුතුය.

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ලකුණු ලබා ගන්නා ආකාරය පැහැදිළි කරන ආලෝක නිර්මාණය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවන්		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ආලෝක වින්‍යාස සැලසුම (Lighting Layout Plan) පෙන්වීම සඳහා ඉදි කරන ලද ආකාරය දැක්වෙන සටහන		
2. ලකුණු අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා, ආලෝක මට්ටම පැහැදිළි කරනු ලබන දීප්ත මාපක මිනුම්		
3. ස්ථාපනය කරන ලද ආලෝක පද්ධතියේ ඡායාරූප		
4. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

EQ8 අවට දර්ශන / බාහිර දර්ශන ලකුණු 01

අභිප්‍රාය

ගොඩනැඟිල්ල භාවිතාකරන්නන්ගේ ශාරීරික හා මානසික සුවතාවය රැකෙන පරිදි ඇසට දැනෙන පීඩනය (Eyestrain) අවම කිරීම සහ ඉහිල්වීමසඳහා ගොඩනැඟිල්ල පදිංචිකරුවන් හෝ භාවිතා කරන්නන් සඳහා අවට පරිසරයේ දක්නට ලැබෙන ස්වභාවික දර්ශනය ආරක්ෂා කිරීම. ගොඩනැඟිල්ල නිර්මාණය කිරීමේදී බාහිර දර්ශන සුදුසු පරිදි තෝරා ගැනීම.

ක්‍රමවේදය

අවම බිත්ති ප්‍රමාණයකින් හා ඇතුළත කොටස් වෙන් කෙරෙන බිත්ති අඩු කිරීමෙන් කාර්යාල අවට විවෘත ප්‍රදේශයට දර්ශනයෙන් සම්බන්ධ කිරීම මඟින් ගොඩනැඟිලි ස්ථාපනයේදී දර්ශන පථයන් හැකි තරම් දුරට ඇතුළත් වන පරිදි සකස් කිරීම වැනි ක්‍රම මඟින්

- ගොඩනැඟිල්ලේ මුළු බිම් ප්‍රමාණයෙන් 60%ක් සඳහා බාධා රහිතව දර්ශන නිරීක්ෂණය කිරීමට හැකිවන පරිදි පෙළොවේ 1.2mක උසකින් සෘජු දර්ශන පථයක් නිරාවරණය කිරීම.

සැලසුම් ඇඟයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. සාමාන්‍ය බිම් සැලැස්ම තුළින් හඳුනා ගෙන ඇති බාහිර දර්ශන පෙන්වන එක් එක් ස්ථාන ලකුණු කර දැක්වීම		
2. ගොඩනැඟිල්ලේ ඇතුළත සැලැස්ම සැකසීමේදී පිටත දර්ශනීයත්වය පෙන්වීම සඳහා භාවිතා කෙරෙන සැලසුම් උපක්‍රම		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇඟයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ඉදිකළ ගොඩනැඟිල්ලේ බාහිර අවකාශ පෙන්වන ස්ථාන ලකුණු කරන ලද සැලැස්ම		
2. අවසන් කරන ලද ඇතුළත ගොඩනැඟිලි සැලැස්ම, පිටත දර්ශන, නිරීක්ෂණය වන ආකාරය දක්වන සැලසුම් හා ඡායාරූප		
3. සැලසුම් ඇඟයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

EQ9 අභ්‍යන්තර ශබ්ද මට්ටම ලකුණු 01

අභිප්‍රාය

ගොඩනැඟිල්ල භාවිතා කරන්නන්ගේ සුවපහසුව රැකෙන පරිදි ඇතුළත ශබ්ද මට්ටම පවත්වා ගැනීම.

ක්‍රමවේදය

- අධික ශබ්දය වාසය කරන්නන්ට අසහනයක් ඇති කරවන බැවින් අභ්‍යන්තර පරිසරය පිළිගත හැකි ශබ්ද මට්ටමක පවත්වාගෙන යන බවට සහතික කිරීම සඳහා, ගොඩනැඟිල්ලේ මුළු වර්ග ප්‍රමාණයෙන් 90%

සමස්ථ ගොඩනැඟිල්ල තුළ අවකාශ ශබ්ද මට්ටම්GVB4/16 CIBSE Guide B4: Noise and Vibration Control for Building Services Systemහිඅභ්‍යන්තර ශබ්ද ප්‍රමිති මට්ටම්වල අවසාන සංස්කරණය අනුව විය යුතුය.

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. අභ්‍යන්තර ශබ්ද මට්ටම සඳහන් කළ මට්ටම්න්පවත්වාගෙන යාමට යෝජිත උපාය මාර්ග පිළිබඳව වාර්තාව හා සැලැස්ම		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. අදාළ ශබ්ද මට්ටම සම්පූර්ණ කර ඇති බවට මැනීමෙන් ලබා ගන්නා ලද ශබ්ද දත්ත වාර්තාව		
2. ශබ්ද පාලනය සඳහා පහසුකම් සපයන ද්‍රව්‍යවල රූප සටහන්		
3. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

WE ජල කාර්යක්ෂමතාවය

අනිවාර්යයෙන්ම අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

සෑම ගොඩනැඟිල්ලක්ම වසර 02කට වරක් ජල භාවිත විගණනයක් සිදුකර ජල භාවිත කාර්යක්ෂමතාවය පරීක්ෂා කළ යුතුය.

WE1 වැසි ජලය එක්රැස් කිරීම — ලකුණු 02

අභිප්‍රාය

නල ජල භාවිතය අවම කිරීමට වහල මතින් හෝ පොළොව මතින් ගලායන වැසි ජලය උපරිම ලෙස එක්රැස් කිරීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීම.

ක්‍රමවේදය

එක්රැස් කරන ලද වැසි ජලය ගොඩනැඟිල්ලේ මුළු ජල අවශ්‍යතාවයෙන් පහත සඳහන් ප්‍රතිශතයන්ගෙන් භාවිතා කිරීම.

05%ක් හෝ එයට වැඩි ප්‍රමාණයක් වැසි ජලය භාවිතා කිරීම - **ලකුණු 01**
10%ක් හෝ එයට වැඩි ප්‍රමාණයක් වැසි ජලය භාවිතා කිරීම - **ලකුණු 02**

ගොඩනැඟිල්ලේ මූලික ජල අවශ්‍යතාවයට සාපේක්ෂව වැසි ජලය භාවිතා කරන ප්‍රතිශත ගණනය කිරීම ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ගොඩනැඟිල්ලේ එක් එක් කාර්යයන් සඳහා මුළු ජල අවශ්‍යතාවය ගණනය කිරීම		
2. වැසි ජලය එක්රැස් කිරීම් සඳහා යොදා ගන්නා ක්‍රමවේදය		
3. රැස් කළ හැකි වැසි ජල ධාරිතාවය		
4. ගොඩනැඟිල්ල තුළ එම ජලය භාවිතා කරන ආකාරය		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. වැසි ජලය එකතු කිරීම සිදුකිරීමට ස්ථාපනය කරන ලද ක්‍රමවේදයන් හා ගබඩා කිරීමේ ටැංකි පිහිටුවන ලද ස්ථාන දක්වන ඉදිකරන ලද ආකාරය දක්වන සැලසුම්		
2. ස්ථාපනය කරන ලද ක්‍රමවේදයේ ප්‍රධාන උපාංග දැක්වෙන ඡායාරූප		
3. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

WE 2 අප ජලය ප්‍රතිචක්‍රීකරණය හා කාර්යක්ෂම භාවිතය ලකුණු 04

අභිප්‍රාය

අපජලය මුදා හැරීම හේතුවෙන් ඇතිවන පරිසර දූෂණය අවම කිරීම සඳහා අපජල ප්‍රතිචක්‍රීකරණය උනන්දු කරවීම.

ගොඩනැඟිල්ල තුළ නල ජල පරිභෝජනය අවම කිරීමට සනීපාරක්ෂක කටයුතු සඳහා යොදාගත්ජලය ප්‍රතිචක්‍රීකරණය කර නැවත භාවිතය උනන්දු කරවීම, අපජලය ප්‍රතිචක්‍රීකරණයෙන් පසු පරිසරයට මුදාහැරීම සඳහා අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීම හා ප්‍රදේශයේ ජල සම්පාදන ඒකකය මගින් ලබා ගන්නා පිරිපහදු නල ජල සැපයුම් හු දර්ශන කටයුතු සඳහා භාවිතය අවම කිරීම.

ක්‍රමවේදය

භාවිතා කරන ලද ජලය (අළු ජලය / කළු ජලය) නැවත භාවිතා කළ හැකි වන ලෙස පිරිපහදු කිරීමේ ක්‍රම අදාළ භූමියේ ස්ථාපිත කර එම ක්‍රම මගින් පිරිපහදු කළ ජලය හු දර්ශන සඳහා සැපයීම, අවම ජල අවශ්‍යතාවයක් සහිත දේශීය ශාක හෝ භූමියේ තත්ත්වයට අනුවර්තනය විය හැකි ශාක භාවිතා කිරීම, වැසිකිළි සෝදා හැරීම (Flushing) වැනි අවශ්‍යතා සඳහා යොදා ගැනීම මගින්

එමඟින් ගොඩනැඟිල්ලේ මුළු අපජලය පරිමාවෙන් :

≥10% ක ප්‍රමාණයක් ප්‍රතිචක්‍රීකරණය කර නැවත භාවිතය	-	ලකුණු 01
≥30% ක ප්‍රමාණයක් ප්‍රතිචක්‍රීකරණය කර නැවත භාවිතය	-	ලකුණු 02
≥50% ක ප්‍රමාණයක් ප්‍රතිචක්‍රීකරණය කර නැවත භාවිතය	-	ලකුණු 03
මුළු අපජල පරිමාවෙන් ≥50%ක ප්‍රමාණයක් පිරිපහදු කර පසු පරිසරයට මුදාහැරීම	-	ලකුණු 01

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. පිරිපහදු කිරීමට හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීමට යෝජිත අප ජලය ප්‍රතිශතයන් දක්වන මූලික ගණනය කිරීම		
02. අප ජලය ප්‍රතිචක්‍රීකරණය සහ පිරිපහදු පද්ධතිය, ගබඩා කිරීමේ පහසුකම් සහ බෙදාහැරීමේ ක්‍රමවේද පැහැදිළි කරනු ලබන තාක්ෂණික වාර්තාව		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ක්‍රමවේදය ස්ථාපිත කිරීමෙන් අනතුරුව පිරිපහදු කරනු ලබන හෝ ප්‍රතිචක්‍රීකරණය කරනු ලබන අප ජලය ප්‍රතිශත දක්වන අවසන් ගණනය කිරීමේ වාර්තා		
2. අපජලය ප්‍රතිකාර කිරීම් හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රමවේද හා ගබඩා කිරීමේ ටැංකි දක්වන ඉදිකරන ලද ආකාරය දක්වන සැලසුම්		
3. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

WE 3 ජල මාපකය හා කාන්දු හඳුනා ගැනීමේ පද්ධතිය ලකුණු 02

අභිප්‍රාය

අධීක්ෂණය හා කළමනාකරණය සහිත ජල පරිභෝජන පද්ධතියක් සැලසුම් කිරීමට උනන්දු කරවීම.

ක්‍රමවේදය

1. කුලී පදනම මත ලබා දී ඇති ගොඩනැඟිලි පරිශ්‍ර වැනි ඒවායේ ජල කළමනාකරණ සහ අධීක්ෂණය සඳහා උප මාපක (Sub metering) පද්ධති ස්ථාපනය කිරීම.

ලකුණු 01

2. ජල කාන්දු පූර්ව අනාවරණය හා අපතේ යාම සීමා කිරීම සඳහා EMS අධීක්ෂණ පද්ධති ස්ථාන ගත කිරීම හා වසර 2කට වරක් ජල කාන්දු හා භාවිතය පිළිබඳව පරීක්ෂා කිරීම. ලකුණු 01

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. ප්‍රධාන ජල පරිභෝජන පද්ධති සහ උපකරණ සඳහා EMS සම්බන්ධීකරණය සඳහා යෝජිත විධිවිධාන අඩංගු සටහනක්		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. උප මාපක ස්ථාපිත කරන ලද දත්ත ඇතුළත් ලේඛනයක් සකස් කිරීම.		
2. ගොඩනැඟිල්ලේ උප මනු ස්ථානගත කරවූ සැලසුමක් ඉදිරිපත් කිරීම.		
3. සවිකරනු ලැබූ උප මනු වල ඡායාරූප ගොනුවක් දැක්වීම.		
4. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

WE4 ජල කාර්යක්ෂම මෙවලම් ලකුණු 02

අභිප්‍රාය

කාර්යක්ෂම උපාංග භාවිතය මඟින් පානීය නල ජල පරිභෝජනය අවම කිරීමට උනන්දු කරවීම.

ක්‍රමවේදය

ගොඩනැඟිල්ලේ පානීය නලජල භාවිතය අවම කිරීමට හැකියාවක් ඇති ජල කාර්යක්ෂම ජල කුට්ටර, ජල බෙසම්, නාන මල් හෝ පද්ධති භාවිතා කිරීම, කරාම වලින් ජලය අපතේ යාම වැළැක්වීමට, ස්වයංක්‍රීය, ස්වයං වැසුම් හෝ ඉලෙක්ට්‍රෝනික කරාම වැනි ජල කාර්යක්ෂම උපාංග ගොඩනැගිල්ලේ ජල උපාංග අවශ්‍යතාවයෙන් ≥30% ප්‍රමාණයක් භාවිතා කිරීම. **ලකුණු 01**

ගොඩනැඟිල්ලේ පානීය නලජල භාවිතය අවම කිරීමට හැකියාවක් ඇති ජල කාර්යක්ෂම ජල කුට්ටර, ජල බෙසම්, නාන මල් හෝ පද්ධති භාවිතා කිරීම, කරාම වලින් ජලය අපතේ යාම වැළැක්වීමට, ස්වයංක්‍රීය, ස්වයං වැසුම් හෝ ඉලෙක්ට්‍රෝනික කරාම වැනි ජල කාර්යක්ෂම උපාංග ගොඩනැගිල්ලේ ජල උපාංග අවශ්‍යතාවයෙන් ≥50% ප්‍රමාණයක් භාවිතා කිරීම. **ලකුණු 02**

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ලකුණු ලබා ගැනීම සඳහා පද්ධතිය අවශ්‍යතා ළඟාකර ගන්නා ආකාරය දක්වන කෙටි පැහැදිළි කිරීමක්		
2. යෝජිත මෙවලම් වල සටහනක් ඉදිරිපත් කිරීම.		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. ලකුණු ලබා ගැනීමට අවශ්‍යතා සැපිරීම සඳහා පිහිටුවන ලද සියළු ජල කාර්යක්ෂම මෙවලම් සහ ජල පරිභෝජනය අඩු කිරීම් ප්‍රතිශත දැක්වෙන වගුවක් ඉදිරිපත් කිරීම.		
2. ස්ථාපනය කළ මෙවලම් වල නිෂ්පාදිත දත්ත ඇතුලත් සවිස්තර සැලසුමක් ඉදිරිපත් කිරීම.		
3. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

IN - හරිතමය නව්‍යකරණ සොයාගැනීම

IN 1 නව්‍ය සොයාගැනීම් යෙදවීම — ලකුණු 05

අභිප්‍රාය

හරිතමය ඇගයීම් ක්‍රමවේදය යටතේ සැපිරිය යුතු අවශ්‍යතාවයන්ට අමතරව, ව්‍යාපෘතියක් සඳහා සුවිශේෂී සොයාගැනීම් වෙනුවෙන් ඇගයීම් කිරීම සහ එමඟින් හරිතමය ගොඩනැඟිලි නිර්මාණකරණයේ නව සොයාගැනීම් හඳුනාගැනීම.

ක්‍රමවේදය

පහත සඳහන් අංශවලින් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී නව්‍යකරණ ක්‍රමවේදයන් ඉදිරිපත් කිරීම කළ හැක.

- ව්‍යාපෘතිය ඇතුළත නව බලශක්ති ප්‍රභවයන් සාදා ක්‍රමවේදයන් හඳුන්වාදීම.
- ගොඩනැඟිලි අභ්‍යන්තර සහ පිටත හරිතමය වගා ක්‍රමයන් සහ භූ දර්ශන සැලසුම් හඳුන්වා දීම. (Micro Climate)
- ගොඩනැඟිලි වලින් තාප අවශෝෂක ක්‍රමවේදයන් හඳුන්වාදීම.
- වැඩි හරිතමය අගයක් සහිත නව ගොඩනැඟිලි ද්‍රව්‍යය හඳුන්වා දීම.
- ගොඩනැඟිලි ව්‍යූහය හා පිටත පෘෂ්ඨය ස්වයං ලෙස පිරිසිදු විය හැකි ආකාරයේ ක්‍රමවේද හඳුන්වා දීම.
- අවම බලශක්ති යොදා ගැනීමක් මඟින් ක්‍රියාකරවිය හැකි වාතාශ්‍ර හුවමාරු ක්‍රමයක් හඳුන්වා දීම. (Low energy ventilation system)
- නව ව්‍යූහමය සැලසුම් හඳුන්වා දීම.

මෙසේ ගොඩනැඟිල්ලේ හරිතමය තත්ත්වය මැන බලන ප්‍රධාන අංශ 7 ඔස්සේ සිදුකරනු ලබන නව සොයා ගැනීම් තාක්ෂණික කමිටුවේ අධීක්ෂණයෙන් මෙම ලකුණු ලබාදීම සිදු කෙරේ.

නව්‍යකරණයන් හඳුන්වාදීම සැමවිටම මූලික සැලසුම් කරන අවස්ථාවේ සිටම ක්‍රියාවට නැංවීම මඟින් ඵලදායීතාවය උපරිමයකට ළඟා කර ගැනීම සිදුකළ හැක.

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. නව්‍යකරණ සොයාගැනීමට අදාළව සහතික ලද ව්‍යාපෘති වාර්තාව		
02. අදාළ සැලසුම් පත්‍ර, නව්‍යකරණ යෝජනා (විස්තරවන ආකාරයේ) හඳුනාගත හැකි වන පරිදි		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. අවසාන වාර්තාව, සමඟ ව්‍යාපෘතියේ නිරවද්‍යතාවය සහතික කළ හැකි ආකාරයේ ඡායාරූප සටහන් ඉදිරිපත් කිරීම		
2. එදිනෙදා නඩත්තුව පිළිබඳ ලිපි ලේඛන (Maintenance Manuals)		
3. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

SC සමාජීය හා සංස්කෘතිමය අනුකූලතාවය

SC1 සමාජීය හා සංස්කෘතිමය අනුකූලතාවයෙන් යුතු ගොඩනැඟිලි නිර්මාණය හා ඉදිකිරීම් ලකුණු 02

අභිප්‍රාය

යම් සංවර්ධනයක් සිදුකිරීමේදී අවට සංවර්ධනය හා සමාජ වටපිටාව සමඟ ගැලපෙන පරිදි ගොඩනැඟිල්ලක ගෘහ නිර්මාණ ශිල්පීය පාලනයක් ඇති කිරීම. (ඓතිහාසික හා පුරාවිද්‍යා වටිනාකමනික් යුතු කලාප, සුවිශේෂී වූ ගෘහ නිර්මාණ ශිල්පීය පද්ධතියකට අයත් ගොඩනැඟිලි වලින් යුතු කලාප ආවරණය කිරීම).

ක්‍රමවේදය

මූලික සැලසුම් නිරාකරණයේදී මෙය විශේෂිත ගෘහ නිර්මාණ ශිල්පීය පාලන කලාපයකට අයත් වන හෝ නොවන බව සඳහන් කිරීම. (උදා : ගාලු කොටුව, මහනුවර ලෝක උරුම නගරය) හා ගොඩනැගිල්ල අදාල ප්‍රදේශයේ සමාජීය , සංස්කෘතිකමය වටිනාකම් සලකා නිර්මාණය කරන ලද බව තහවුරු කිරීම.

සැලසුම් ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත්කිරීම් / ලිපිලේඛන (DA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
01. අදාළ ගෘහ නිර්මාණ ශිල්පීය පාලන කලාප රෙගුලාසි වලට අනුකූලව නිර්මාණ කරන ලද සැලසුම් සඳහා ලද අනුමැතිය තහවුරු කරන ලද ලේඛනයක් ලබාදීම. (අනුමත සැලසුම් පිටපත/ ලේඛනයන්)		
02. අදාළ ප්‍රදේශයේ ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ වලට හා සමාජීය වටපිටාවට ගැලපෙන ලෙස ගොඩනැඟිල්ල නිර්මාණය කරන ආකාරය දක්වන ව්‍යාපෘති වාර්තාව හා සැලසුම්		

ගොඩනැඟිලි ඉදිකිරීම් අවසන්වීමෙන් පසු නිරවද්‍යතා ඇගයීම සඳහා අවශ්‍ය ඉදිරිපත් කිරීම් / ලිපිලේඛන (CVA)

	ඉල්ලුම්කරු	හරිත අංශය
1. අදාළ රෙගුලාසි වලට අනුකූලව ඉදිකරන ව්‍යාපෘතිය සඳහා ලබාගන්නා ලද අනුකූලතා සහතිකයේ පිටපතක් ඉදිරිපත් කිරීම		
2. අදාළ ප්‍රදේශයේ ගෘහ නිර්මාණ ශිල්පීය ලක්ෂණ වලට හා සමාජීය වටපිටාවට ගැලපෙන ලෙස ගොඩනැඟිල්ල ඉදිකළ ආකාරය දක්වන සැලසුම්		
3. සැලසුම් ඇගයීම සඳහා ඉදිරිපත් කළ දත්ත වලින් සිදු කළ අපගමනයන් හෝ එකතු කිරීම්		

හරිත ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වන ඇගයීම් පද්ධතියට අනුකූලව ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා හඳුනාගත් මාර්ගෝපදේශ සැලැස්ම

හරිත ගොඩනැගිලි පිළිබඳ අභිමතාර්ථය සහ අරමුණු

01. හරිත ගොඩනැගිලි පිළිබඳ මාර්ගෝපදේශ දිගුකාලීනව ක්‍රියාත්මක කිරීම මගින්, **රාජ්‍ය ආයතනවල සියලු ගොඩනැගිලි තිරසර හා පරිසර හිතකාමී මට්ටමට පත්කර පරිහරනය කරන්නන්ට සුවදායී හා සනීපාරක්ෂ ආකාරයට පවත්වාගෙනයාම මෙහි අභිමථාර්ථය වේ.**

02. ඉහත අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා හරිත ගොඩනැගිලි මාර්ගෝපදේශ යොදාගැනීම පිළිබඳ කෙටිකාලීන අරමුණු ලෙස මෙම මාර්ගෝපදේශවල අරමුණු හැඳින්විය හැකිය.

ගොඩනැගිලි, සැලසුම්කරණයේදී වටපිටාවට යෝග්‍ය අයුරින්, ඉදිකිරීමේදී, මෙහෙයවීමේ හා නඩත්තුවේදී , ප්‍රතිසංස්කරණයේදී හෝ වෙනස් කිරීමේ දී හෝ පුළුල් කිරීමේ දී සහ කඩා බිඳ දැමීමේ දී

(අ). බලශක්ති, ජල, භූමි හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම.
(ආ). පුනර්ජනනීය බලශක්තිය හා විකල්ප සම්පත් භාවිතය ප්‍රවර්ධනය කිරීම.
(ඇ). ගොඩනැගිලි හා සම්බන්ධ සියළුම කටයුතු සඳහා පරිසර හිතකාමී ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනයකිරීම.
(ඈ). පරිහරනය කරන්නන්ගේ සුවදායීභාවය හා සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැන්වීම.
(ඉ). පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම හා ආපදාවලට ඔරොත්තුදෙන පරිදි ආශ්‍රිත පරිසර ගැටලු අවම කිරීම.
(ඊ). සංස්කෘතික හා උරුම අනන්‍යතාවයන් තහවුරු කිරීම.

මූලධර්ම

03. ඉහත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මාර්ගෝපදේශ යොදාගැනීමේදී කළයුතු ක්‍රියාකාරකම් ප්‍රශස්ත අන්දමින් ඉටුකිරීම පහත සඳහන් මූලධර්මවලට අනුකූලව සිදුකළ යුතුයි.
(අ). භාවිතය අඩුකිරීම, ප්‍රතිභාවිතය, ප්‍රතිචක්‍රීකරණය ආදිය ඇතුලත් ප්‍රතිපත්ති මූලධර්ම
(ආ). යහපාලන මූලධර්ම (වගවීම, විනිවිදභාවය, සහභාගීත්වය, ඒකමතිකභාවය, වගකීම් සහිත බව, සඵල හා කාර්යක්ෂමතාවය, නීතියේ ආධිපත්‍යය අනුගමනය කිරීම, සමානාත්මතාවය සහ සියල්ල අන්තර්ග්‍රහණය වන බව)
(ඇ). පාරිසරික ප්‍රවේශය පිළිබඳ මූලධර්මය
(ඈ). දේශගුණ විපර්යාසවල බලපෑම් සම්බන්ධ අනුහුරුවීමේ (Adaptation) හා හරිතාගාර වායු පිළිබඳ තාක්කුකරණ (Mitigation) මූලධර්ම
(ඉ). පරිසර දූෂණය වැළැක්වීම සම්බන්ධ "දූෂකයා විසින් ගෙවිය යුතුය" සහ "නිෂ්පාදකයාගේ විස්තීරණය කරන ලද වගකීම" පිළිබඳ මූලධර්ම
(ඊ). පරිසර ආරක්ෂාව හා සංරක්ෂණයට අදාල පූර්වාරක්ෂාකාරී මූලධර්ම

මාර්ගෝපදේශ

04. මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා පොදු ප්‍රතිපත්තියක අවශ්‍යතාවක් පවතින නිසා ඉදිරියේදී සමස්ත "හරිත ක්ෂේත්‍රය" සඳහා ඡත්‍ර (Umbrella) ප්‍රතිපත්තියක් පිළියෙල කර ඒ යටතට හරිත සංකල්පයට අදාල සියලුම ක්ෂේත්‍ර ගොනු කිරීමට සිදුවේ. දැනට මෙවැනි ප්‍රතිපත්තියක් නොමැති නිසා එම හිදැස මගහැරීම පිනිස මෙම මාර්ගෝපදේශ සංග්‍රහයට අභිමතාර්ථයක්, අරමුණු හා මූලධර්ම ආදී මූලික ප්‍රතිපත්ති අංග ඇතුලත් කර ඇත. මාර්ගෝපදේශ පිළියෙල කිරීමේදී තාක්ෂණික මාර්ගෝපදේශවලට අමතරව මාර්ගෝපදේශවලට අදාල පරාසයේ සියලුම ක්ෂේත්‍ර හඳුනාගෙන එම ක්ෂේත්‍ර පහත සඳහන් ආකාරයට වර්ගීකරණය කර ඇත.

(අ). ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ
(ආ). තාක්ෂණික මාර්ගෝපදේශ
(ඇ). නෛතික මාර්ගෝපදේශ
(ඈ). ආර්ථිකමය මාර්ගෝපදේශ
(ඉ). සමාජ-ආර්ථික, සංස්කෘතික, සෞඛ්‍යමය මාර්ගෝපදේශ

05. මාර්ගෝපදේශ වර්ගීකරණය සඳහා පැහැදිලි සීමා මායිම් සොයාගැනීම තරමක් අපහසු වුවත් රාජ්‍ය අංශයේ ප්‍රතිපත්තිවලට අදාල පොදු මාර්ගෝපදේශ, ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ ලෙසද, තාක්ෂණික ක්ෂේත්‍රය සඳහා ඉතා කිට්ටු සම්බන්ධතාවයක් ඇති මාර්ගෝපදේශ තාක්ෂණික මාර්ගෝපදේශ ලෙසද, දැනටමත් අනපනත් රෙගුලාසි මගින් පාලනය කරන ලද කරුණු වලට අදාල හා අනාගතයේදී නෛතික ආවරණයක් අවශ්‍ය මාර්ගෝපදේශ නෛතික මාර්ගෝපදේශ ලෙසද, හරිත ගොඩනැගිලි සංකල්පය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආර්ථික උපාංග හා පාලනය කිරීමේ උපාංග පිළිබඳ අදාල වන මාර්ගෝපදේශ ආර්ථිකමය මාර්ගෝපදේශ ලෙසද සහ සමාජ-ආර්ථික, සංස්කෘතික, උරුම, සෞඛ්‍ය හා අනෙකුත් සියලු ක්ෂේත්‍රවලට අදාල මාර්ගෝපදේශ සමාජ ආර්ථික, සංස්කෘතික, හා සෞඛ්‍යමය මාර්ගෝපදේශ ලෙසද වර්ගීකරණය කර ඇත.

06. මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති මාර්ගෝපදේශ විවිධ ප්‍රමාණවලින් විවිධ ආයතනවලට අදාල වන නිසා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවේ සියලු සාමාජිකයන්ගේ දායකත්වයෙන් එක් එක් ක්ෂේත්‍රයේ මාර්ගෝපදේශ සඳහා වෙනවෙනම ප්‍රමුඛතා හඳුනාගන්නා ලදී. ඉදිරියේදී මෙම මාර්ගෝපදේශ සඳහා ක්‍රියාත්මක සැලසුම් පිළියෙල කිරීමේදී අදාල මාර්ගෝපදේශ තෝරාගැනීමේදී සහ හරිත ගොඩනැගිලිවල ගුණාත්මක තත්ත්වය මැන බැලීමේ ක්‍රමවේදය ස්ථාපනය කිරීමේදී මෙම ප්‍රමුඛතාගත කිරීම ඉතා වැදගත්වේ.

07. හරිත ගොඩනැගිලි සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා ගොඩනැගිලි ජීවන චක්‍රයේ පහත සඳහන් ආකාරයට අනුපිළිවෙලකින් යුත් අදියර 04ක් හඳුනාගෙන ඇත. අවශ්‍යතාවය අනුව ගොඩනැගිලි ඉදිකිරීම, ප්‍රතිසංස්කරණය, වෙනස් කිරීම හෝ පුළුල් කිරීම යන එකම අදියරක සංචරක වලින් එකක් තෝරාගත යුතුයි. මෙම ලේඛනයේ සඳහන් එක් එක් මාර්ගෝපදේශ මෙම අදියර වලින් කිනම් අදියරකට අයත්දැයි දැනගැනීම සඳහා යොදන සංකේත අදාල අදියර අවසානයේ වරහන් තුළ සඳහන් කර ඇත.

(අ). වටපිටාව සමග සැලසුම් කිරීම (01)
(ආ). ඉදිකිරීම (2.1)/ ප්‍රතිසංස්කරණය කිරීම (2.2) /වෙනස් කිරීම හෝ පුළුල් කිරීම (2.3)
(ඇ). මෙහෙයවීම හා නඩත්තුව (03)
(ඈ). කඩා බිඳ දැමීම (04)

08. එක් එක් මාර්ගෝපදේශ ලැයිස්තුව ඉහත සඳහන් අදියර අනුව හැකිතාක් දුරට පෙළගැස්වීමට උත්සාහකර ඇත. අදියර අනුව මාර්ගෝපදේශ පිළිබඳ දැනගැනීමට යොදා ඇති සංකේත භාවිතා කර ඇත. ඉහත අදියර අනුව වර්ග කිරීමට අපහසු නමුත් අදියර එකකට වඩා වැඩි ගණනක් සඳහා ගැලපෙන මාර්ගෝපදේශ ඉදිරියේ අදාල සියලු සංකේත යෙදීමට බලාපොරොත්තු වන අතර අදියර සියල්ලම ගැලපෙන මාර්ගෝපදේශ සඳහා පොදු යන්න (05)න් සංකේතවත් කර ඇත. කිසිදු අදියරක් සඳහා පැහැදිලිව වර්ගීකරණය කළ නොහැකි මාර්ගෝපදේශ (06) ලෙස දක්වා ඇත.

ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ

i. නාගරික ප්‍රදේශවල රාජ්‍ය ගොඩනැගිලි නිර්මාණයේදී භූමියේ කාර්යක්ෂම පරිහරණය සඳහා තනි තට්ටුවේ ගොඩනැගිලි වෙනුවට බලශක්ති කාර්යක්ෂමතාවය හා එහි සීමාවන්ද සැලකිල්ලට ගෙන ගොඩනැගිල්ලේ මහල් ගණන හැකිතරම් ප්‍රශස්ත මට්ටමේ මහල් ගණනකින් නිර්මාණය කිරීම. (01, 2.1, 2.3)

ii. රාජ්‍ය ආයතන වල ගොඩනැගිලි සඳහා වහල සහ සිවිලිම සඳහා ඇස්බැස්ටෝස් තහඩු භාවිතය උපරිම ලෙස පාලනය කර 2018 වන විට සම්පූර්ණයෙන්ම නවතා දැමීම. (2.1, 2.2, 2.3)

iii. අධික ලෙස තර්ජනයට ලක් වී ඇති ජීව විශේෂ සහිත ස්ථානවල ගොඩනැගිලි ඉදිකිරීම හැකිතාක් දුරට සිදුනොකළ යුතුයි. (01, 2.1)

iv. ලක්ෂ්‍ය ආවේණික ජීව විශේෂ සහිත හෝ ඉතාමත් සුළු ස්ථාන ගණනක විසිරී ඇති ආවේණික ජීව විශේෂ සහිත භූමියන්හි ගොඩනැගිලි ඉදිකිරීම් සිදුනොකළ යුතුයි. (01, 2.1)

v. අති දුර්ලභ හා දුර්ලභ පරිසර පද්ධතීන්හි ගොඩනැගිලි ඉදිකිරීම සිදු නොකළ යුතුයි. (2.1)

vi. ගොඩනැගිලි ඉදිකිරීමේ භූමිය වැදගත් පාරිසරික සේවාවක් හෝ ආර්ථික සේවාවක් ඉටුකරන කෘෂිකාර්මික ඉඩමක් නොවිය යුතුයි. (2.1)

vii. නායයෑම වැනි ස්වභාවික ආපදා ගොඩනැගිලි ඉදිකිරීම නිසා තීව්‍ර වියහැකි බැවින් එම ස්වභාවික ආපදා සහිත භූමි ප්‍රදේශවල ගොඩනැගිලි ඉදිකිරීම හැකිතාක්දුරට අවම කළ යුතුයි. (2.1)

viii. ගොඩනැගිලි ඉදිකිරීම සෑමවිටම කලින් ඉදිකිරීම් සඳහා සංවර්ධනය කළ ස්ථාන (වැඩබිම්)වල සිදුකිරීම ධෛර්යමත් කළ යුතුයි. (2.1, 2.2)

ix. ගොඩනැගිලි ඉදිකිරීමේදී ස්වභාවික පරිසරයට හානි සිදුකිරීම හැකිතරම් දුරට අඩු කිරීමට කටයුතු කළ යුතුයි (ගොඩනැගිලි පරිශ්‍රයේ සිට උපරිම හානිකිරීමේ දුර මීටර් 15 දක්වා). (01,2.1, 2.3)

x. ගොඩනැගිලිවල සවිකර ඇති හදිසි අවස්ථා විද්‍යුත් පද්ධතීන් (ආලෝකය හා ශබ්ද) හැර අනෙකුත් සියලුම ආලෝක සැපයුම් විශේෂ අවස්ථාවන් හැර කාර්යාල වේලාවෙන් පසුව නිවා දැමීම. (03, 04)

xi. ගොඩනැගිලි නිර්මාණය සඳහා වැලි භාවිතයේදී විකල්ප වැලි ලෙස හොඳින් සෝදා ලුණු ඉවත් කරන ලද අක් වෙරළ වැලි (offshore sand), කලුගල් කුඩු, කුඩුකරන ලද ඉවතලන බිත්ති බදාම ආදී විකල්ප භාවිතය ප්‍රවර්ධනය කිරීම. එමගින් මුහුදු වෙරළින් සහ ගංගාවලින් ලබාගත් වැලි හා පස් සෝදා ලබාගත් වැලි භාවිතා නොකිරීම. (2.1)

xii. ගොඩනැගිලි අලුතින් ඉදිකිරීමේ අවශ්‍යතාවය අවම කිරීම සඳහා පවතින ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය හෝ නැවත ගොඩනැගීමේ ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාව ලබාදී ඒවායේ ඉඩකඩ ප්‍රසාරණය කර ගැනීමට අවස්ථාව ලබාදීම. (2.2, 2.3)

xiii. ප්‍රාදේශීය වශයෙන් නිපදවන ලද ගොඩනැගිලි ද්‍රව්‍ය හා නිෂ්පාදන හැකිතරම් වැඩි ප්‍රමාණයක් භාවිතා කිරීම. (2.1)

xiv. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා නිකලැල් භූමි යොදා ගැනීම අඩුකිරීම සඳහා පාරිසරිකව දූෂිත වූ ක්ෂේත්‍ර (දුඹුරු ක්ෂේත්‍ර) හෝ භාවිතයෙන් අතහැර දමා ඇති ගොඩනැගිලි භූමි නැවත සංවර්ධනය කරමින් පරිසරය වැඩිදියුණු වන ආකාරයට ගොඩනැගිලි ඉදිකිරීම සඳහා යොදාගැනීම ධෛර්යමත් කළ යුතුයි. (2.1)

xv. සෑම ගොඩනැගිල්ලක් සඳහාම බලශක්ති විගණනයක් සහ කාබන් පියසටහන් ගණනයක් (Calculation of Energy Audit and Carbon Foot Print) වසර 03ක් පාසා සිදුකර බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැන්වීම. (03)

xvi. සෑම ගොඩනැගිල්ලක් සඳහාම ජල භාවිත විගණනයක් වසර 03ක් පාසා සිදුකර ජල භාවිතය කාර්යක්ෂම කිරීම. (03)

xvii. රජයේ ගොඩනැගිලි තැනීමේ දී අධික ලෙස දැව භාවිතයට ගැනෙන හෙයින් ස්වභාවික වන සම්පතට මින් දැඩි බලපෑම් සිදුවේ. එහෙයින් ඉදිරියේදී ගොඩනැගිලි නිර්මාණයේදී පරිසර හිතකාමී ලෙස දැව පදම් කිරීම (Timber treating) හා දැවාරක්ෂිත යෙදීම් වැනි ක්‍රම යොදා ගනිමින් දැවවල ආයු කාලය දීර්ඝ කිරීම සහ අවම වශයෙන් වසර 20ක පමණ කාලයක් දක්වා ඉදිකිරීම් ආයතනයන්ගෙන් ඔවුන් යොදනු ලබන දැව සඳහා වගකීම් සහතිකයක් ලබාගැනීම. (2.1)

xviii. කෙටිකාලීනව පුනර්ජනනය කළ හැකි ගොඩනැගිලි ද්‍රව්‍ය හා නිෂ්පාදන හැකිතරම් වැඩි ප්‍රමාණයක් (ප්‍රතිශතයක්) යොදාගැනීම. (2.1, 2.3)

xix. බලශක්ති සංරක්ෂණය සඳහා යාන්ත්‍රිකව සුසංගනය කළ හා නොපිළිස්සූ ගඩොල් භාවිතය ප්‍රවර්ධනය කිරීම. (2.1, 2.3)

xx. ගොඩනැගිලි අමුද්‍රව්‍ය හා ගොඩනැගිල්ලට අවශ්‍ය උපකරණ, ගෘහභාණ්ඩ ලබාගැනීම ආදී සමස්ත ක්‍රියාවලිය හරිත ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුලින් සිදුකිරීම. (2.1, 2.3)

xxi. ප්‍රවාහනය නිසා සිදුවන පරිසර දූෂණය හා ඉඩම් සංවර්ධන බලපෑම් අවම කිරීම සඳහා ප්‍රධාන ප්‍රවාහන ධාරාවලට ප්‍රවේශවීමේ අවම දුර සහිතව හා අවම හෝ බෙදාගැනීමේ පදනම් මත යාබද ගොඩනැගිලි සමග හුවමාරු කරගතහැකි පරිදි (Sharing basis) සැලසුම් කිරීම සහ වෙන වෙනම වාහන සඳහා බිත්ති යොදා වෙන් කිරීම් සිදු නොකරමින් වාහන නැවතුම් පහසුකම් සහිතව ගොඩනැගිලි ඉදිකිරීම. (01, 2.1)

xxii. මූලික මාවත්, ඇවිදින මංපෙත්, ප්‍රධාන සේවා සැපයුම් මාර්ග ආදියේ සිට ස්වභාවික පරිසරයට හානිකරන දුර හැකිතාක් අවම කළ යුතුයි (මීටර් 1.5). (01, 2.1, 2.3)

xxiii. ආයතනයේ විදුලිබලයෙන් ක්‍රියාත්මක කරවන වාහනවල බැටරි හැකිතාක් දුරට පුනර්ජනනීය බලශක්ති උත්පාදන මගින් නිපදවන විදුලිබලයෙන් පමණක් නැවත ආරෝපණය කිරීම ප්‍රවර්ධනය කිරීම. තවද හැකිතාක් දුරට ගොඩනැගිල්ල පරිහරනය කරන්නන්ට සිය වාහන විද්‍යුත් ආරෝපණය කිරීම සඳහා අවස්ථාව ලබාදීම. (03)

xxiv. ගොඩනැගිල්ල තුල හා පරිශ්‍රයේ එකතුවන දිරාපත්වන කැලිකසල ක්‍රමවත්ව බැහැර කිරීම සඳහාද සහ පුනර්ජනනීය බලශක්තිය උපද්දවා ගැනීම සඳහාද ආපනශාලා වැනි සේවා ස්ථානවලට බලශක්තිය (ජීව වායුව මගින්) ලබාගැනීම ප්‍රවර්ධනය කිරීම. (03)

xxv. බලශක්තිය නාස්තිවීම මගහැරීම සඳහා විදුලිය අනවශ්‍ය සෑම අවස්ථාවකම යාන්ත්‍රිකව නවතාලිය හැකි අංගයක් (Timer) සහිත පේනු සහ ඉලෙක්ට්‍රොනික සංවේදක පද්ධති (Electronic Sensor System) භාවිතා කිරීම. (03)

xxvi. ජලය නාස්තිවීම වළක්වාලීම සඳහා හැකි සෑම අවස්ථාවකදීම අත ළංකළ විට පමණක් ජලය ගලන සංවේදී උපාංගයක් සහිත කරාම භාවිතා කිරීම. (2.1, 03)

තාක්ෂණික මාර්ගෝපදේශ

i. ආයතනයේ වහල හැකිතාක් දුරට සූර්යකෝෂ වලින් නිර්මිත වහලක් ලෙස සකස් කිරීම මගින් ඇස්බැස්ටෝස් වැනි අහිතකර පියසි ආවරණ භාවිතය අවම කිරීම. (2.1, 2.2, 2.3)

ii. ගොඩනැගිලිවල වහල සඳහා ඇස්බැස්ටෝස් භාවිතය අවම කිරීම පිණිස හා ගොඩනැගිල්ල ඉදිකරන භූමිභාගයට සමාන ඉඩක එළිමහන් ප්‍රදේශයක් ලෙස භාවිතය සඳහා ඉඩකඩ ලබාගැනීමට වහල සඳහා සමතලා කොන්ක්‍රීට් ස්ලැබ් එකක් හඳුන්වාදීම ප්‍රවර්ධනය කිරීම. මේනිසා ගොඩනැගිල්ල තුල සිදුවන උෂ්ණත්වයේ ඉහලයෑම වැළැක්වීමට සමතලා කොන්ක්‍රීට් වහල මත හරිත ආවරණය වැනි සුදුසු ක්‍රමවේදයක් හඳුන්වාදීම හා ගොඩනැගිල්ල තුල සුදුසු වාතාශ්‍රයක් පවත්වා ගැනීම සිදුකළ යුතුය.(01, 2.1, 03)

iii. වායුසමනය භාවිතය අවම කිරීම සඳහා උපරිම ලෙස ස්වභාවික වාතාශ්‍රය ගොඩනැගිල්ලට ඇතුළුවන ලෙස සුළඟේ දිශානතියට අනුරූපව ගොඩනැගිල්ල නිර්මාණය කිරීම සහ ජනේල සහ වාකවුළු සැකසීම. (01)

iv. ගොඩනැගිලිවල මධ්‍යයේ වැසි ආවරණ සහිත අහසට විවෘත වූ කොටසක් මගින් ගොඩනැගිල්ල තුල රත්වන වාතය ඉහළට ගමන් කිරීම නිසා අවට වාතය ගොඩනැගිල්ලට ලබාදීම මගින් ස්වභාවික සිසිලසක් ඇතිකරවන සේ ගොඩනැගිලි සැලසුම් කිරීම. (01, 2.2)

v. ගොඩනැගිලි නිර්මාණය වන ප්‍රදේශයට අදාලව වර්තමාන පාරිසරික ප්‍රශ්නයක් වූ දේශගුණ විපර්යාසවල බලපෑම නිසා ඇතිවන හංවතුර, නියඟ, සුළිසුළං හා මුහුදු මට්ටම ඉහළයෑම වැනි බලපෑම් සඳහා අනුහුරුවීමේ තත්ත්වයන් යටතේ ගොඩනැගිලි සැලසුම් කිරීම. (01, 2.3)

vi. ගොඩනැගිලි නිර්මාණයේදී ගොඩනැගිල්ල ඇතුලත වායු තත්ත්වය උපරිම ප්‍රමිතියකින් පවත්වා ගත යුතුය. එබැවින් ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය තෝරාගැනීමේ දී එම ද්‍රව්‍ය වලින් පසුකාලීනව සෞඛ්‍යයට අහිතකර යම් යම් විෂ රසායනික, දූවිලි ආදිය පරිසරයට මුදා නොහැරෙන අමුද්‍රව්‍ය තෝරාගැනීමට ඉදිකිරීම් ආයතන වගබලා ගත යුතුය. (05)

vii. හිරු එළිය උපරිම ලෙස යොදාගත හැකි ප්‍රදේශ ආශ්‍රිතව කාර්යාල නිලධාරීන්ගේ දෛනික මෙහෙයුම් කටයුතු සඳහා වැඩි වශයෙන් භාවිතා කිරීම (උදා: පාලන අංශ, ගිණුම් අංශ ආදී කාර්ය මණ්ඩල ස්ථානගත කිරීම). (01, 03)

viii. ගොඩනැගිලි තුල කසල වර්ගකර එකතු කිරීමේ සහ බැහැර කිරීමේ නිසි පරිසර හිතකාමී ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. ඒ සඳහා කසල වර්ගීකරණය කර එකතු කිරීමේ ස්ථාන ගොඩනැගිලි ව්‍යූහය තුල ස්ථානගත කිරීම. එක්රැස් කරනු ලබන කසල භාජන පහසුවෙන් රැගෙන යා හැකි ස්ථානයන්හි තැන්පත් කිරීම සඳහා ස්ථාන සැලසුමට අන්තර්ගත කිරීම. (01, 2.3, 03)

ix. සියලු නව ගොඩනැගිලි නිර්මාණයේදී සූර්ය බලශක්තිය/ වෙනත් පුනර්ජනනීය බලශක්ති මූළු බලශක්ති අවශ්‍යතාවයෙන් අවම වශයෙන් 25%ක් සපුරා ගත යුතුය. ඒ සඳහා මුළු පියස්සටම හෝ එහි කොටසක් (25% වැඩි ප්‍රදේශයක්) සූර්ය බලශක්ති පද්ධතියෙන් ආවරණය කිරීමට කටයුතු කල යුතුය. බලශක්ති අවශ්‍යතාවය අඩු රාජ්‍ය ආයතනවලද අවම වශයෙන් පියස්සේ 25% ආවරණය වන ලෙස විදුලි කෝෂ යෙදීම අනිවාර්ය විය යුතුය. එමගින් විදුලි පරිභෝජන අවශ්‍යතාවය අඩු ගොඩනැගිලි වලින් නිපදවෙන විදුලිය ජාතික විදුලි පද්ධතියට ලබාදීමේ අවකාශ වැඩිකර ගත හැක. (2.1, 2.3, 03)

x. සියළු රාජ්‍ය ආයතනවල සූර්යකෝෂ භාවිතයෙන් එකතුකර ගන්නා පුනර්ජනනීය බලශක්තිය ශුද්ධ මනුකරණ ක්‍රමය (Net metering) මගින් ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කල යුතුය. (03)

xi. වායුසමනය සඳහා යොදාගන්නා එක් වායුසමනයක ධාරිතාව BTU 24,000 දක්වා වන සියළු උපකරණ අනිවාර්යයෙන් ශූන්‍ය ඕසෝන් ප්‍රහීනකාරක විභවයකින් (Zero Ozone Depleting Potential) සහ ගෝලීය උණුසුම් විභවය 700ට අඩු (<700 Global Warming Potential) අගයකින් යුත් ශීතකාරක මගින් ක්‍රියාත්මක විය යුතුය. වායුසමන ධාරිතාව BTU 24,000ට වැඩි වායුසමන පද්ධතීන් යොදාගැනීමේදී ඒවායේ ශීතකාරක අනිවාර්යයෙන්ම ශූන්‍ය ඕසෝන් ප්‍රහීනකාරක විභවයකින් හා හැකිතාක්දුරට අවම ගෝලීය උණුසුම් විභවයක් සහිත ශීතකාරක යොදාගැනීමට වගබලා ගත යුතුය. (03)

xii. මධ්‍යම වායුසමන පද්ධතීන් යොදාගන්නේනම් පරිභෝජන අවශ්‍යතාවය අනුව ධාරිතාව සකස්කළ හැකි පරිදි ක්‍රමවේදයන් අනුගමනය කිරීම. (2.1, 03)

xiii. ගොඩනැගිලිවල වැසිකිළි, කැසිකිළි පද්ධතීන්හී සෝදාහැරීම් (flushing) අවශ්‍යතා සඳහා වැසි ජල අස්වනු තාක්ෂණයෙන් ලබාගත් ජලය උපරිම පරිදි යොදාගැනීමේ ක්‍රමවේද සකස් කල යුතුය. (01, 03)

xiv. ජල භාවිතය අවම එහෙත් කාර්යක්ෂමතාවයකින් යුත් වැසිකිළි උපාංග භාවිතය ප්‍රවර්ධනය කිරීම. (2.1, 03)

xv. භූ දර්ශනයට ජලය සැපයීම සඳහා පානීය ජලය භාවිතය අඩුකිරීම පිණිස හා වෙනත් අවශ්‍යතාවයන් ඉටුකිරීම සඳහා ඉහළ කාර්යක්ෂමතාවයක් සහිත වාරිමාර්ග තාක්ෂණයන් යොදාගෙන, එකතුකර ගත් වැසි ජලය හෝ ප්‍රතිකාර කරන ලද අපජලය පමණක් භාවිතා කිරීම. (03)

xvi. උරා නොගන්නා භූමි ආවරණය අඩුකිරීම, කාන්දුවීම් ප්‍රවර්ධනය කිරීම, සහ වැසි ජලය රඳවා ගැනීම හා ප්‍රතිකාර කිරීම වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනයෙන් 70%ක් දක්වා වර්ධනය කිරීම පිණිස වැසි ජල කළමනාකරණ සැලසුමක් ක්‍රියාත්මක කිරීම. නායයාම් පවතින ප්‍රදේශවල ජල කාන්දුවීම් ප්‍රවර්ධනය කිරීම අවදානම් සහිතය. (2.1, 2.2)

xvii. වාර්ෂික සාමාන්‍ය සම්පූර්ණ අවලම්බික සත දුව්‍ය ප්‍රමාණයෙන් 50% ඉවත් කිරීම (තැන්පත් කරවීම) සඳහා වැසි ජල ප්‍රතිකාර පද්ධතියක් ස්ථාපිත කිරීම. (2.1, 2.3)

xviii. ජලය පොළවට කාන්දු නොවීමේ ප්‍රමාණය 50%කට වැඩිවන විට වර්ෂා ජලයේ ගලායෑමේ ප්‍රමාණය හා වේගය 25%කට අඩු කරලීම සහ එකතුවන වැසි ජල ප්‍රමාණයෙන් ආපදාවක් නොවීම සඳහා තද සුළං සහිත වර්ෂාවකට මුහුණදීම සඳහා කළමනාකරණ සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීම. (03)

xix. ගොඩනැගිලිවල බිත්ති කපරාරු නොකර සිමෙන්ති ගල්/ගඩොල් බැඳීම උසස් නිමාවකින් සිදුකර හෝ තාක්ෂණික ශක්‍යතාවයක් සහිතව අවම බදාම ස්ථරයක් මගින් ගඩොල් ආවරණය කර විස බැරලෝහ රහිත පරිසර හිතකාමී සුදුසු තීන්ත වර්ගයක් එම බිත්තිවල ආලේප කිරීම මගින් වැලි භාවිතය අවම කිරීම. (2.1, 2.3)

xx. ගොඩනැගිලි ඉදිකිරීමේ කාල පරිච්ඡේදයේදී දුවිලි විසිරීම, අපද්‍රව්‍ය ජනනයවීම, අපජලය ගලායෑම සහ ශබ්ද දූෂණය අවම විය යුතුයි. (2.1,2.2,2.3, 4)

xxi. පොදු විනෝද හා විවේක ස්ථාන ගොඩනැගිලි පරිහරනය කරන්නන් සඳහා සංවර්ධනය කළයුතුයි. (01, 2.1)

xxii. සෘජු සූර්යාලෝකය වළක්වා අවම වශයෙන් දිවා ආලෝක සාධකයේ 2%ක් සම්පූර්ණ ගොඩනැගිලි ක්ෂේත්‍රඵලයෙන් 75%කට ලබාගැනීම. (01, 2.1)

xxiii. ගොඩනැගිල්ලේ ආලෝකකරණය සඳහා හැකිතාක් දුරට පෙරණයක් සහිත LED (ආලෝකය විමෝචනය කරන ඩයෝඩ ආකාරයේ) බල්බ භාවිතා කිරීම. (2.1, 03)

xxiv. ගොඩනැගිලි ඉදිකිරීමේ කාල පරිච්ඡේදයේදී පාංශු බාදනය හා ජල මාර්ගවල රොන්මඩ තැන්පත්වීම අවම විය යුතුයි. (2.1)

xxv. පාරිභෝගික භාවිතයෙන් පසු හා පසු කර්මාන්ත ද්‍රව්‍ය අඩංගු වූ ප්‍රතිචක්‍රීයකරණය කරන ලද ද්‍රව්‍ය ඉහළ ප්‍රතිශතයකින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා භාවිතා කිරීම. (01, 2.1)

xxvi. ගොඩනැගිලි ඉදිකිරීමේ, කඩාදැමීමේ සහ භූමිය සැකසීමේ අපද්‍රව්‍ය හැකිතාක් දුරට අවම කිරීම සඳහා ප්‍රතිභාවිතය කිරීම සහ/හෝ ඉතිරි කිරීම ප්‍රවර්ධනය කිරීම. (2.1, 03)

xxvii. විශේෂයෙන්ම පාසල් සහ විශ්‍රාමශාලා ආදී දිගටි හැඩයෙන් යුත් ගොඩනැගිලි තුලට දිවා කාලයේ සූර්ය රශ්මිය (අව්ව) වැටීම වැළැක්වීම සඳහා ජනෙල් කවුලු නොමැති මුදුන් බිත්ති ශාලාව දෙපස සිටින සේ ගොඩනැගිල්ල නැගෙනහිර-බස්නාහිර දිශාවට පිහිටන සේ ඉදිකිරීම. පන්ති කාමරවල උෂ්ණත්වය තවදුරටත් අඩුකිරීම සඳහා ගොඩනැගිල්ලේ දිගටි පැතිවල ආලින්ද සහිත ආකාරයේ වහල නිර්මාණය ප්‍රවර්ධනය කළ යුතුයි. (01, 2.1)

xxviii. ඉවතලන, ප්‍රතිනිර්මාණ හෝ ප්‍රතිභාවිත ද්‍රව්‍ය, නිෂ්පාදන සහ අභ්‍යන්තර අලංකරණ ද්‍රව්‍ය හැකිතරම් ගොඩනැගිලි ද්‍රව්‍ය ලෙස භාවිතා කිරීම. (03)

xxix. සියලුම ආකාරයේ භාවිතයන් සඳහා පුද්ගලිකත්වය හා සුරක්ෂිතභාවය පිණිස ගොඩනැගිලි සැලසුම් කිරීමේදී අවධානය යොමු කළ යුතුයි. (01)

xxx. භූ දර්ශනය නිර්මාණ සඳහා ආක්‍රමණික ශාඛ හා සතුන්, විෂ අඩංගු ශාඛ, විවිධ අහිතකර සතුන් ආකර්ෂණය කරන ශාඛ අදිය යොදා නොගත යුතුය. (01, 2.1, 03)

xxxi. භූ දර්ශන නිර්මාණය කිරීමේදී පත්‍රවල තියුණු තුඩ සහිත ශාඛ හැකිතරම් ගොඩනැගිලි වලින් හා ගොඩනැගිලි පරිහරනය කරන්නන් වැඩිපුර ගැවසෙන ස්ථානවලින් ඈත්කර සිටුවීම (අකුණු අනතුරු අඩුකර ගැනීම සඳහා). (2.1, 03)

xxxii. භූ දර්ශන නිර්මාණය සඳහා සංරක්ෂණ උපාය මාර්ගයෙක් ලෙස අධික තර්ජනයට ලක්වී ඇති ශාඛ, ලක්ෂීය ආවේණික ශාඛ හා විශේෂ පරිසර සේවාවන් සහිත සත්ව සංරක්ෂණය හා බැඳුණු ශාඛ ආදිය හැකි තරම් යොදා ගත යුතුය. (01, 2.1, 03)

xxxiii. භූ දර්ශනය නිර්මාණය සඳහා යොදාගන්නා ශාඛ, එකවර විශාල ප්‍රමාණයක මල් පිපෙන හා අධික පරාග ප්‍රමාණයක් විසුරවන ශාඛ නොවිය යුතුය (පරාග අඩු කිරීම සඳහා). (01, 2.3)

xxxiv. භූ දර්ශනය නිර්මාණය කිරීමේදී, ප්‍රදේශයේ සංස්කෘතික හා උරුමයන් විදහා දක්වන ආකාරයට, ශාඛ තෝරාගැනීම හා මෘදු හා දෘඪ භූ දර්ශන දෙක සඳහාම යොදාගැනීම ධෛර්යමත් කළ යුතුය. (01, 2.3)

xxxv. ගොඩනැගිල්ලෙන් පිටත ආලෝකකරණය අවශ්‍ය ආරක්ෂාව හා පහසුකරවීම සඳහා පමණක් ආලෝක ශක්ති සනත්වයෙන් 80% ඉක්මවා නොයෑම සහ ගොඩනැගිල්ල ඉදිරිපස හා භූ දර්ශන කලාපය සඳහා ඉහත අගය 50% ඉක්මවා නොයාම. (01, 2.1, 2.2, 2.3, 03, 04)

xxxvi. දූෂක ගොඩනැගිලි තුලට ඇතුලුවීම සහ පසුව සිදුවන නිත්‍ය ගොඩනැගිලි පරිහරනයකරන්නන්ගේ ප්‍රදේශ සඳහා හරස් - පරිසර දූෂණය සිදුවීම අවම කිරීම හා පාලනය කිරීම. (2.2, 2.3, 03)

xxxvii. ගොඩනැගිලි පරිහරනය කරන්නන් සඳහා ඇවිදීමේ හා බයිසිකල් පැදීමේ පහසුකම් සංවර්ධනය කළ යුතුයි. (01, 03)

xxxviii. ගොඩනැගිලි අවට කලාපයේ ක්ෂේත්‍රයෙන් 25% දක්වා ගොඩනැගිල්ලේ සංවර්ධන පියසටහන (ගොඩනැගිලි පියසටහන-ගොඩනැගිලි වර්ගඵලය) අවම කළ යුතුයි. ස්ථානීය කලාපකරණය නොමැති ගොඩනැගිලිවල (විශ්ව විද්‍යාල, හමුදා කඳවුරු) ආසන්න විවෘත ප්‍රදේශයේ ක්ෂේත්‍ර ඵලය ගොඩනැගිලි පියසටහනට සමාන විය යුතුයි. (01, 2.3)

xxxix. අවම වශයෙන් 75ක පියසි ක්ෂේත්‍ර ඵලයක් සහිතව අඩු සහ තියුණු ආනතිය සහිත පියසිවල සූර්ය පරාවර්තන දර්ශකය පිළිවෙලින් 78 හා 29 වන පියසි සකසන ද්‍රව්‍ය භාවිතා කිරීම. (2.1, 2.3)

xl. පියසි ආවරණ ක්ෂේත්‍රඵලයේ 50%ක ශාඛමය ආවරණයක් ඇති කිරීම. (01, 2.1, 03)

xli. ගෘහස්ථ වායු තත්ත්ව කළමනාකරණ සැලසුමක්, ඉදිකිරීමේ අවස්ථාවේ හා ඉන්පසු අවස්ථා සඳහා ක්‍රියාත්මක කිරීම. (2.1, 03)

xlii. හරස් වාතාශ්‍රයට අවහිර කරන ගොඩනැගිලි අවකාශය බෙදා වෙන්කිරීම (Partition) අත්‍යවශ්‍ය ස්ථානවල හැර හැකිතාක් අවම කිරීම හෝ හැකිතාක් උස අවම වූ බෙදා වෙන්කිරීම් යෙදීම. (01, 2.1, 2.3)

xliii. රටට දරාගත හැකි දැව භාවිත ප්‍රමාණයන් ඉක්මවීම වැළැක්වීම සඳහා දැව භාවිතය අවම කරන ගොඩනැගිලි සැලසුම් සකස් කිරීම සහ දැව වෙනුවට විකල්ප අමුද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීම.(01, 2.1, 03)

xliv. බලශක්ති විගණනය, කාබන් පියසටහන ගණනය යනාදි ගොඩනැගිලි හරිත නිර්නායක පිළිබඳ කටයුතු කිරීමට තිරසරභාවය පිළිබඳ කළමනාකරුවෙකු සෑම ආයතනයක් (ගොඩනැගිල්ලක් හෝ අවශ්‍යතාවයට අදාල ගොඩනැගිලි සමූහයක් සඳහා) සඳහාම පත් කිරීම. (03)

xlv. ගොඩනැගිල්ලක ඒකක බිම් වර්ගඵලයක් සඳහා ගොඩනැගිල්ලේ මෙහෙයවීම හා නඩත්තු කිරීම සඳහා වැයවන මුළු බලශක්ති ප්‍රමාණය (ගොඩනැගිලි බලය) හැකිතාක්දුරට (දළ උපරිමය වර්ග මීටරයකට වොට් 70) අඩුම අගයක් විය යුතුයි. (2.1)

ආර්ථිකමය මාර්ගෝපදේශ

i. හරිත ගොඩනැගිලි ඉදිකිරීම හා පවත්වාගෙනයාම සඳහා වූ අත්‍යවශ්‍ය සහ දේශීය වශයෙන් ලබාගත නොහැකි ආනයනික අමුද්‍රව්‍ය, උපකරණ ආදිය සඳහා බදු සහන ලබාදීම. (06)

ii. විකල්ප වැලි, ප්‍රතිචක්‍රීකරණය කරනලද ගොඩනැගිලි ද්‍රව්‍ය යනාදියේ භාවිතය දිරිගැන්වීම සඳහා සහනාධාර මිල ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. (06)

iii. හරිත ගොඩනැගිලි පවත්වාගෙන යන රාජ්‍ය සමාගම් බදුවලින් නිදහස් කිරීමේ ක්‍රමවේදයක් ඇති කිරීම. (06)

iv. හරිත ගොඩනැගිලි පිළිබඳ දීප ව්‍යාප්ත තරඟයක් පවත්වා මූල්‍යමය ත්‍යාග හා සම්මාන පිරිනැමීමේ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම. (06)

v. හරිත ගොඩනැගිලි පිළිබඳ වූ ව්‍යාපෘති සඳහා කාබන් වෙළඳාම පිළිබඳ ආර්ථික ක්‍රමවේද යන ආදිය සහ අදාළ ගෝලීය මුල්‍ය පහසුකම් ලබාගැනීම ප්‍රවර්ධනය කිරීම. (06)

නෛතික මාර්ගෝපදේශ

i. ගොඩනැගිලි නිර්මාණය සඳහා දැව භාවිතයේදී සෑමවිටම රක්ෂිතවලින් හෝ නීත්‍යානුකූල නොවන අකාරයට නෙලාගත් දැව භාවිතය අත්හැරීම හා සහතික කරන ලද දැව පමණක් භාවිතා කිරීම. (2.1, 2.2)

ii. රජයේ ගොඩනැගිලි වර්ණ ගැන්වීමේදී සෞඛ්‍යාරක්ෂිත සහ පරිසර හිතකාමී තීන්ත වර්ග භාවිතා කිරීම. මෙහිදී භාවිතා කරන තීන්ත, ඊයම්, රසදිය, ආසනික්, කැඩ්මියම් වැනි විෂ සහිත බැරලෝහ වලින් තොරවීම. (2.1)

iii. ගොඩනැගිලි, ප්‍රකාශයට පත්කර ඇති අදාල වනජීවී ප්‍රදේශ හෝ ප්‍රේරණ කලාප තුල (විශේෂ අවස්ථාවක් හැර) ඉදිකිරීම් නොකළ යුතුයි. (01, 2.1)

iv. ප්‍රකාශයට පත්කළ හෝ හඳුනාගෙන ඇති වැදගත් තෙත්බිමක ගොඩනැගිලි ඉදිකිරීම නොකළ යුතු අතර කිනම් ආකාරයක හෝ තෙත්බිමක් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පිරවීම සිදුනොකළ යුතුයි. (01, 2.1)

v. වෙරළ කලාපයේ ඉදිකරන ගොඩනැගිල්ලක් හැමවිටම වෙරළ සංරක්ෂණ පනතේ වගන්තිවලට අනුකූලව සිදුකළ යුතුයි. (01, 2.1)

vi. වැදගත් සංස්කෘතික හෝ ආගමික හෝ උරුමයට අදාළ හෝ පාරිසරික හෝ වෙනත් සුවිශේෂ දර්ශනීය සම්පතක් පුර්ණ හෝ අර්ධ වශයෙන් හෝ ආවරණය වන පරිදි ගොඩනැගිලි ඉදිකිරීම සිදු නොකළ යුතුයි. (01, 2.1)

vii. ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම් තුල මදුරුවන් බෝවන ස්ථාන සහ අනෙකුත් බෝවන රෝග කාරකයින් ප්‍රවර්ධනය වන ස්ථාන නොතිබිය යුතුයි. (2.1)

viii. ගොඩනැගිලි ඉදිකිරීමේදී කොරල්පර හා බෙලිකටු පුළුස්සා ලබාගන්නා හුණු භාවිතය තහනම් කිරීම. (2.1)

ix. රජයේ ගොඩනැගිලි නිර්මාණයේදී සම්මත ගිනි සහ අකුණු ආරක්ෂණ පද්ධතියක් පිහිටුවිය යුතුය. (01)

x. ඇමෝනියා, හයිඩ්‍රොකාබන් වැනි ස්වභාවික ශීතකාරක මගින් ක්‍රියාත්මක වන වායුසමන යන්ත්‍ර යොදාගන්නේ නම් නියමිත ආරක්ෂිත ප්‍රමිතීන් අනුගමනය කිරීම. (03)

xi. ගොඩනැගිලි ඉදිකිරීමේ භූමිය සාමාන්‍ය භංවතුර මට්ටමට වඩා ඉහළින් පිහිටිය යුතුය. ඉඩම එම මට්ටම දක්වා පිරවීම කෙසේවත් නොකළ යුතුයි. (01, 2.1, 2.3)

xii. ජාතික ප්‍රමිති මට්ටම දක්වා ගොඩනැගිලි පරිශ්‍රය තුලදී අප ජලය 100%කින් ප්‍රතිකාර කිරීම. (03)

xiii. ගොඩනැගිල්ලට සහ එහි ඇතුලත අවශ්‍ය සෑම ස්ථානයකම සියලුම ආකාරයේ ආබාධිත හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට පහසුවෙන් ප්‍රවේශවීම සඳහා අවශ්‍ය සියලු පහසුකම් සහිතව ගොඩනැගිල්ල නිර්මාණය කළ යුතුයි. (01, 2.1, 2.3)

xiv. 'උරුම ගොඩනැගිලි' ලෙස හඳුනාගෙන ඇති ගොඩනැගිලි හරිත ගොඩනැගිලි ලෙස සංවර්ධනය කිරීම සඳහා නිසි අවසරයකින් තොරව කිසිම වෙනස් කිරීමක් සිදු නොකළ යුතුයි. (2.2, 2.3)

xv. පුරාවිද්‍යා රක්ෂිත ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශවල ගොඩනැගිලි, මංමාවත් ආදිය ඉදිකිරීම අවසරයකින් තොරව සිදු නොකළ යුතුයි. (01, 2.1)

xvi. ස්වභාවික ආපදා අවදානම සහිත ප්‍රදේශවල ගොඩනැගිලි ඉදිකිරීමේදී ගොඩනැගිලි සැලසුම් සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගත යුතුය.

සමාජ, ආර්ථික, සංස්කෘතික හා සෞඛ්‍යමය මාර්ගෝපදේශ

i. ඩෙංගු රෝග මර්ධනය සඳහා ගොඩනැගිලිවල පළමුවන හා දෙවන මහල සඳහා පීලි භාවිතා නොකිරීම. පීලි භාවිතය අත්‍යවශ්‍ය වන විශේෂිත අවස්ථාවලදී පමණක් පහත සඳහන් වෙනස්කම් සිදුකර පීලි භාවිතා කිරීම.
   (අ). පහතට ජලය ගෙනයන නල ගනන වැඩිකර එම නල දෙකක් අතර පලල ඉතා කුඩා ආනතියක් සහිතව සවි කිරීම හෝ
   (ආ). මැසි මදුරුවන් යා නොහැකි වනසේ සහ කුණුරොඩු ඇතුල්විය නොහැකි වනසේ පිල්ලට දැලක් සහිත ආවරණයක් යෙදීම. (2.1, 2.3)

ii. රසදිය සහිත ප්‍රතිදීප්ත බල්බ භාවිතය අවම කර ක්‍රමයෙන් භාවිතය නතර කිරීම. (03)

iii. ගොඩනැගිලි හා පරිශ්‍ර තුල සේවය කරන සේවකයින් ජල භාවිතයේ නාස්තිය හැකිතරම් අඩුකිරීමට කටයුතු කිරීම. (03)

iv. ගොඩනැගිල්ල තුල ප්ලාස්ටික් ජල බෝතල් භාවිතය අවම කිරීම සඳහා සුදුසු ජල පෙරණයක් සවිකිරීම හෝ වීදුරු බෝතල්වල ඇසුරු පානීය ජලය භාවිතා කිරීම සහ පොලිතීන් ගොඩනැගිල්ල තුලට රැගෙනඒම හැකිතාක් දුරට පාලනය කිරීම. (03)

v. ගොඩනැගිලි, සැලසුම් ප්‍රදේශයේ සංස්කෘතික අනන්‍යතාවය විදහා දක්වන හා උරුම ගොඩනැගිලි ආරක්ෂාවන ආකාරයට සකස් කළ යුතුයි. (01, 2.1)

vi. දේශීය කෘෂිකාර්මික උරුමය හා ග්‍රාමීය ජීවන රටාව සහ සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් පිළියෙල කර ගැනීම ප්‍රවර්ධනය සඳහා හැකි සෑම අවස්ථාවකදීම එළවළු වැනි බෝග වගා කළ හැකි කොටසක් සඳහා ඉඩකඩ සලසා දිය යුතුයි. (01, 2.1)

මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම

09. අදාල එක් එක් ආයතනවල වාර්ෂික සැලසුම්වලට හා ආයතනයේ කාර්ය පථයට රාජ්‍ය ගොඩනැගිලි සඳහා වූ හරිත ගොඩනැගිලි මාර්ගෝපදේශ යොදාගැනීම ඇතුලත් කළ යුතුයි. අදාල ආයතනවල අණපනත්, රෙගුලාසිවලට මෙම මාර්ගෝපදේශ යොදාගැනීම/ක්‍රියාත්මක කිරීම හා තනැක්සීම (Monitoring) සඳහා වගන්තිවල අවශ්‍යතාවය අනුව ඇතුලත් කර බලාත්මක කළ යුතුයි. අවශ්‍යතාවය අනුව සහ ක්‍රියාත්මක සැලැස්ම සමාලෝචනය කිරීම තුලින් ලබාගත් නිර්දේශ මත රාජ්‍ය ආයතන ගොඩනැගිලි සඳහා වූ හරිත ගොඩනැගිලි මාර්ගෝපදේශ යොදාගැනීම වඩාත් බලගැන්වීම සඳහා නව පනතක් අවශ්‍යවේනම් එය පිළියෙල කළ යුතුයි.

10. වාර්ෂික අයවැය සකස් කිරීමේදී මෙම මාර්ගෝපදේශ යොදාගැනීම පිළිබඳ විමර්ශනය කර එහි ප්‍රශස්ත යොදාගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ආදිය සලසා ගැනීම තුලින් මාර්ගෝපදේශ ජාතික සංවර්ධන ක්‍රියාදාමයට අනුගත කළ යුතුයි.

පරිශීලන

1. රාජ්‍ය ආයතන සඳහා වන හරිත ගොඩනැඟිලි මාර්ගෝපදේශ සංග්‍රහයේ මුල් අවස්ථාවේදී හඳුනාගත් එම මාර්ගෝපදේශ 99 සහිත සැලැස්ම
2. Indian Green Building Council, 2007. *LEED, India, Abridged Reference Guide for New Construction and Major Renovations Version 1.0*. Hyderabad, India. IGBC
3. https://www.bca.gov.sg/GreenMark/green_mark_criteria.htm - Singapore Green Building Rating System (Green Mark)
4. www.greenbuildingindex.org – Malaysian Green Building Rating System (Green Building Index)
5. BRE Global Limited, 2008. *BREEAM SD5055*. Hertfordshire, UK:BRE Global Limited
6. American Society of Heating, Refrigerating and Air- Conditioning Engineers. ASHRAE Official Website Available at: www.ashrae.org
7. American Society of Heating, Refrigerating and Air- Conditioning Engineers, 2004. *ASHRAE/IESNA 90.1-2004: Energy standard for Buildings expect Low-rise Residential Buildings* .Atlanta, GA:ASHRAE
8. American Society of Heating, Refrigerating and Air- Conditioning Engineers, 2004. *Advance Energy Design Guide for small Office Buildings.* Atlanta, GA:ASHRAE
9. American Society of Heating, Refrigerating and Air- Conditioning Engineers, 2004. *ANSI/ASHRAE 62.1-2004: Ventilation for Acceptable Indoor Air Quality.* Atlanta, GA:ASHRAE
10. American Society of Heating, Refrigerating and Air- Conditioning Engineers, 1999 *ANSI/ASHRAE 52.2-1999: Method of Testing General Ventilation Air-cleaning Devices for Removal Efficiency by particle Size.* Atlanta, GA:ASHRAE
11. American Society of Heating, Refrigerating and Air- Conditioning Engineers, 2004. *ANSI/ASHRAE 55-2004: Thermal Environmental Conditions for Human Occupancy.* Atlanta, GA:ASHRAE
12. American Society of Testing and Materials, 1996. *ASTM E903: Standard Test Method for Solar Absorptance, Reflectance, and Transmittance of Materials Using Integrating Spheres.* West Conshohocken, PA:ASTM
13. GVB4/16 CIBSE Guide B4: Noise and Vibration Control for Building Services System
14. American Society of Testing and Materials, 1998. *ASTM E1980: Standard Practice for Calculating Solar Reflectance Index of Horizontal and Low-Sloped Opaque Surfaces.* West Conshohocken, PA:ASTM
15. American Society of Testing and Materials, 2003. *ASTM E779: Standard Test Method for Determining Air leakage Rate by Fan Pressurization.* West Conshohocken, PA:ASTM

16. American Society of Testing and Materials, 2004. *ASTM C1371: Standard Test Method for Determining of Emittance of Materials Near Room Temperature Using Portable Emissometers.* West Conshohocken, PA:ASTM
17. American Society of Testing and Materials, 2006. *ASTM E1918: Standard Test Method for Measuring Solar Reflectances of Horizontal and Low-Slopped Surface in the Fields.* West Conshohocken, PA:ASTM
18. American Society of Testing and Materials, 2008. *ASTM E408: Standard Test Method for Total Normal Emittance of Surfaces in the Field.* West Conshohocken, PA:ASTM
19. American Society of Testing and Materials, 2009. *ASTM C1549: Standard Test Method for Determining of Solar Reflectance Near Ambient Temperature Using a Portable Solar Reflectometer.* West Conshohocken, PA:ASTM
20. Carbon Trust, 1998. *Carbon Trust Good Practice Guide 237*: Carbon Trust
21. Chartered Institution of Building Services Engineers, 2005. *CIBSE Applications Manual 10: 2005, Natural Ventilation in Non-domestic Buildings.* London, UK: CIBSE
22. Chartered Institution of Building Services Engineers. CIBSE Official Website Available at: www.cibse.org
23. Department of Archaeology, Sri Lanka, Department of Archaeology Official Website Available at: www.archaeology.gov.lk
24. Illuminating Engineering society of North America , 1999./*IESNA RP-33: Lighting for Exterior Environments* .NY:IESNA
25. International Performance Measurement & Verification Protocol, 2003. *Concepts and Options for Determining Energy Saving in New Construction –Volume III* :IPMVP
26. Ministry of Environment, Sri Lanka. Ministry of Environment Official Website Available at: www.environmentmin.gov.lk/
27. Sheet Metal and Air Conditioning National Contractors Association, 1995 .*IAQ Guidelines for occupied Buildings under Construction* .Virginia, USA:SMACNA
28. Sri Lanka Institute Sri Lanka Standards Institution, 2009.*SLS 745-2; 2009: Sri Lanka Standard code of practice for the design and construction of septic tanks and associated effluent disposal system- Part 2.* Colombo 08, Sri Lanka : SLSI
29. Sri Lanka Sustainable Energy Authority, 2009. *Code of Practice on Energy Efficient Buildings in Sri Lanka* .Colombo 07,Sri Lanka :SEA
30. Sri Lanka Sustainable Energy Authority. Sri Lanka Sustainable Energy Authority Official Website Available at: http://www.energy.gov.lk/
31. දැව සංස්ථාව මගින් හරිත ගොඩනැඟිලි සඳහා වන දැව භාවිතය සඳහා සකස් කරන ලද වර්ගීකරණය

32. State Timber Cooperation, Ministry of Environment and Natural Resources, Sri Lanka. State Timber Corporation Official Website. Available at: www.timco.lk
33. CIDA ආයතනයේ ගොඩනැඟිලි ද්‍රව්‍යය හරිත තත්වය මැන බැලීමේ ක්‍රමවේදය
34. Sri Lanka Institute of Architects. SLIA Official Website Available at: http:/www.slia.lk
35. මධ්‍යම පරිසර අධිකාරිය රාජ්‍ය ආයතනවල ගොඩනැගිලි සඳහා ජෛව විවිධත්වයේ බලපෑම් ඇගයීම සඳහා සකස් කරන ලද වර්ගීකරණය

"පුනරුදය" පරිසර සංරක්ෂණ වැඩසටහන යටතේ ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදේශක මණ්ඩලය

රෝහණ කීර්ති දිසානායක මහතා, ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්

තරංගනී වික්‍රමසිංහ මිය, ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

වෛද්‍ය උපාලි ඉන්ද්‍රසිරි මහතා, ව්‍යාපෘති අධ්‍යක්ෂ (පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන)

මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ උපදේශක මණ්ඩලය

උදය ආර්. සෙනෙවිරත්න මහතා, ලේකම්

ආර්.ඒ.ආර්.ආර්.රූපසිංහ මහතා, අතිරේක ලේකම් (පාලන)

එම්.ජී.ඩබ්.එම්.ඩබ්.ටී.බී. දිසානායක මහතා, අතිරේක ලේකම් (පරිසර ප්‍රතිපත්ති සහ සැලසුම්)

එම්.පී.ඩී.යූ.කේ.මාපා පතිරණ මහතා, අතිරේක ලේකම් (පරිසර ව්‍යාපෘති හා අධ්‍යාපන පුහුණු)

ජී.එම්.ජේ.කේ.ගුණවර්ධන මහතා, අධ්‍යක්ෂ (වායු සම්පත් කළමනා. සහ ජාතික ඕසෝන් ඒකකය)

මහනගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ නාගරික සංවර්ධන අධිකාරියේ උපදේශක මණ්ඩලය

ආචාර්ය ජගත් මුණසිංහ මයා, සභාපති (වරලත් වාස්තු විද්‍යාඥ / නගර නිර්මාණ ශිල්පී)
ඉංජී. සුමේධ රත්නායක මයා, අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු)
නිහාල් ප්‍රනාන්දු මයා, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (වරලත් වාස්තු විද්‍යාඥ / නගර නිර්මාණ ශිල්පී)
වන්දනා කේ.ඊ.කලුපහන මිය, අධ්‍යක්ෂ (පරිසර හා භූ දර්ශන අංශය) (භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පී / පරිසරවේදී)

හරිත ගොඩනැගිලි ඇගයීම් ක්‍රමවේදය ඇතුලත් මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම සඳහා පත් කළ විද්වත් උපදේශක මණ්ඩලය ඇතුලත් උප කමිටු නියෝජිතයින් -

ගාමිනී ගමගේ මයා -	උපදේශක (උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය), මහනගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
මහාචාර්ය චින්තා ජයසිංහ මිය	- මොරටුව විශ්වවිද්‍යාලය
මහාචාර්ය එම්.ටී.ආර්.ජයසිංහ මයා -	මොරටුව විශ්වවිද්‍යාලය
ආචාර්ය රංගික හල්වතුර මයා	- මොරටුව විශ්වවිද්‍යාලය
ආචාර්ය ඉන්ද්‍රිකා රාජපක්ෂ මිය -	මොරටුව විශ්වවිද්‍යාලය
ආචාර්ය අසංක රොද්‍රිගෝ මයා	- මොරටුව විශ්වවිද්‍යාලය
ආචාර්ය උපේන්ද්‍ර රාජපක්ෂ මයා	- මොරටුව විශ්වවිද්‍යාලය
ආචාර්ය අශෝක පෙරේරා මයා	- මොරටුව විශ්වවිද්‍යාලය
සමන්තා මානවඩු මිය -	රත්මලාන තාක්ෂණ විශ්වවිද්‍යාලය
මහාචාර්ය සෙනරත් දිසානායක මයා	- අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
මහාචාර්ය රංජිත් දිසානායක මයා	- විධායක උප සභාපති, හරිත ගොඩනැඟිලි සංසදය
ඉංජී. සී.ඩී.ඩබ්.අලහකෝන් මිය	- අතිරේක ලේකම් (තාක්ෂණ) නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

එල්.ඩබ්ලිව් පාලිත මයා	- අධ්‍යක්ෂ, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය
ආර්.එච්.එම්.පී.අබේකෝන් මිය	- අධ්‍යක්ෂ (ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය) මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
අනුර ජයතිලක මයා	- අධ්‍යක්ෂ (අපද්‍රව්‍ය කළමනාකරණ), මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
ගාමිණී වික්‍රමපාල මයා	- අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති සැලසුම් අංශය), මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
ලුම්බිණී කිරිඇල්ල මිය	- නීති නිළධාරිනී, නීති අංශය - මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
අමල් රණවීර මයා	- සහකාර අධ්‍යක්ෂ(ප්‍රතිපත්ති සැලසුම්), මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
එන්.ඩී.වික්‍රමාරච්චි මිය	- සහකාර අධ්‍යක්ෂ (වන සම්පත්), මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
එම්.එම්.සෙනෙවිරත්න මයා	- ප්‍රධාන තාක්ෂණික නිළධාරී (ජාතික ඕසෝන් ඒකකය) මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
රූපිකා බක්මීදෙණිය මිය	- පරිසර කළමනාකරණ නිළධාරී (ජාතික ඕසෝන් ඒකකය) මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
පියුමි බෙන්තරගේ මිය	- පරිසර කළමනාකරණ නිළධාරී (ජෛවවිවිධත්ව අංශය) මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
මනෝජ් ප්‍රසන්න මයා -	වැඩසටහන් සහකාර (ජාතික ඕසෝන් ඒකකය) මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
රම්‍යා වික්‍රමසිංහ මිය -	ජාතික ඕසෝන් ඒකකය, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය
ඩී.එම්.කේ.එස්.දිසානායක මයා -	අධ්‍යක්ෂ (නාගරික සංවර්ධන) මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
එම්.එස්.බණ්ඩාර මයා	- ජ්‍යෙෂ්ඨ වැඩසටහන් අධ්‍යක්ෂ, නගර සැලසුම් සහ ජල සම්පත් අමාත්‍යාංශය
හර්ෂ වික්‍රමසිංහ මයා -	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
ඩබ්. ඒ.සී. වේරගොඩ මයා -	වන සංරක්ෂක, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
ඩබ්.ඩී.පී.ගෝමස් මයා	- සහකාර වන සංරක්ෂක, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
අජිත් වීරසුන්දර මයා	- අධ්‍යක්ෂ (අපද්‍රව්‍ය කළමනාකරණ), මධ්‍යම පරිසර අධිකාරිය
ගයනී දිසානායක මිය	- සහකාර අධ්‍යක්ෂ (නීති අංශය), මධ්‍යම පරිසර අධිකාරිය
නෙල්කා පෙරේරා මිය	- සහකාර අධ්‍යක්ෂ, මධ්‍යම පරිසර අධිකාරිය
කේ.පී.ඒ. ප්‍රනාන්දු මිය	- නීති නිළධාරිණී, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
මංජුල අමරරත්න මයා	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
මේනක මංගලනාථ මයා	- වාස්තු විද්‍යාඥ, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

කේ.සිරිනිවාස මයා	- සාමන්‍යාධිකාරී, රාජ්‍ය දැව සංස්ථාව
ආචාර්ය නිමල් රුවන්පතිරණ මයා -	නියෝජ්‍ය සාමන්‍යාධිකාරී, රාජ්‍ය දැව සංස්ථාව
ඉංජි. එස්. අමරසේකර මයා	- අධ්‍යක්ෂ (සංවර්ධන), ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
ඉංජි.ඒ.කේ.එම්.පී. සිල්වා	- සහකාර අධ්‍යක්ෂ (ඉදිකිරීම් ආර්ථික), ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
ඉංජි. ජේ.ඒ.සී.ක්‍රිෂාන්ති මිය -	අධ්‍යක්ෂ (සිවිල් ඉංජිනේරු අංශය), ජාතික ඉංජිනේරු හා පර්යේෂණ සංවර්ධන ආයතනය
ජගත් ගුණවර්ධන මයා	- නීතීඥ
ආර්.ඩී.එම්.එස්. වීරතුංග මිය	- නීතීඥ
කේ.පී.කේ.දිසානායක මයා	- නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
අනුජ මෙන්ඩිස් මයා	- සිවිල් ඉංජිනේරු (නගර සැලසුම්), කොළඹ නගර සභාව
ඉංජි. එච්.එම්.එස්.සී. හේරත් මයා -	ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික ඉංජිනේරු, මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය
කේ. ජයන්ත සිරිකුමාර මයා	- සහකාර අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
ඉංජි. ටී.ඩී.රාජසේකරන් මයා	- සාමාන්‍යාධිකාරී, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
එන්.ජේ. ජයකොඩි මිය -	ප්‍රධාන නිර්මිත ඉංජිනේරු,රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
සන්ජා සපුතන්ත්‍රී මිය	- වාස්තු විද්‍යාඥ, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
ටියුඩර් ධර්මසිරි මයා	- කළමනාකරු (මෙහෙයුම්), ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය
එම්.එස්.එම්.රිස්වාන් මයා -	ප්‍රධාන ඉංජිනේරු, ජල සම්පත් හා ජලාපවාහන මණ්ඩලය
ඩයාන් මුණසිංහ මයා	- විද්‍යාඥ, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය
අනෝජා සෙනෙවිරත්න මිය	- අධ්‍යක්ෂ (අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන), ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
කවීන්ද්‍ර හේරත් මයා -	වාස්තු විද්‍යා ශිල්පී, වාස්තු විද්‍යා දෙපාර්තමේන්තුව මොරටුව විශ්වවිද්‍යාලය
ලයනල් නවගමුව මයා	- අධ්‍යක්ෂ, හරිත ගොඩනැඟිලි සංසදය
ඉංජි. ශිරෝමාල් ප්‍රනාන්දු මයා	- ශ්‍රී ලංකා හරිත සංසදය
ඉංජි. දයානි නයන්ත මිය -	ශ්‍රී ලංකා හරිත සංසදය
සුගත් අතපත්තු මයා	- පරිසර යුක්ති කේන්ද්‍රය
ගයනී හේවාවසන් මිය	- නීති අංශ ප්‍රධානී- සීමාසහිත පරිසර පදනම

ගුණාත්මක තත්ත්වය මැන බැලීමේ ක්‍රමවේදය සකස් කිරීම

නාගරික සංවර්ධන අධිකාරියේ විද්වත් කමිටුව

ආචාර්ය ජගත් මුණසිංහ මයා -	සභාපති
	(වරලත් වාස්තු විද්‍යාඥ / නගර නිර්මාණ ශිල්පී)
ඉංජී. සුමේධ රත්නායක මයා -	අධ්‍යක්ෂ ජනරාල්
	(ඉංජිනේරු)
නිහාල් ප්‍රනාන්දු මයා -	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
	(වරලත් වාස්තු විද්‍යාඥ / නගර නිර්මාණ ශිල්පී)
චන්දනා කේ.ඊ.කලුපහන මිය -	අධ්‍යක්ෂ - පරිසර හා භූ දර්ශන අංශය
	(භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පී / පරිසරවේදී)
ඩී. හෙට්ටිආරච්චි මයා -	උපදේශක,පරිසර හා භූ දර්ශන අංශය -
	(භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පී/ නගර නිර්මාණ ශිල්පී)
තුෂාරි තිලකරත්න මිය -	ඒකක ප්‍රධානී (ව්‍යාපෘති) , ව්‍යාපෘති කළමනාකරණ අංශය
	(වරලත් වාස්තු විද්‍යාඥ / නගර නිර්මාණ ශිල්පිනී)
එම්.ජී.තුෂාරි කාරියවසම් මිය -	නියෝජ්‍ය අධ්‍යක්ෂ (භූ දර්ශන), පරිසර හා භූ දර්ශන අංශය
	(වරලත් වාස්තු විද්‍යාඥ / භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පිනී)
කෝසලා තෙන්නකෝන් මෙනවිය -	වරලත් වාස්තු විද්‍යාඥ , පරිසර හා භූ දර්ශන අංශය
	(වරලත් වාස්තු විද්‍යාඥ / භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පිනී)
ජේ.කේ.සී. ජයකොඩි මයා -	සැලසුම් නිලධාරී - පරිසර හා භූ දර්ශන අංශය
ජී.ඩී.දයානි මිය -	පාරිසරික සැලසුම් නිලධාරී ,පරිසර හා භූ දර්ශන අංශය
ටී.කේ.වීරක්කොඩි මෙනවිය -	පරිසර නිලධාරී - පරිසර හා භූ දර්ශන අංශය
යසන්ත ප්‍රදීප් මයා -	සැලසුම් නිලධාරී - බලාත්මක අංශය

පරිපාලන සහාය

ඩී.ඩී.ඩී.අයි. ශ්‍රියාලතා මිය -	පරිපාලන නිලධාරිනී - පරිසර හා භූ දර්ශන අංශය
	නාගරික සංවර්ධන අධිකාරිය

පරිගණක යතුරු ලියනය

දිල්රුක්ෂි කරුණාරත්න මිය -	පරිගණක යන්ත්‍ර ක්‍රියාකරු-
	පරිසර හා භූ දර්ශන අංශය - නාගරික සංවර්ධන අධිකාරිය



පරිණාමකරණයත් සමඟ මානවයා සහ ස්වභාදහම අතර සටියනයක් නිර්මාණයවී ඇත. ලාංඡනයෙන් දැක්වෙන්නේ මෙම දෙපාර්ශවය අතර ගොඩනැංවීමට වෑයම් කරන සහජීවී සම්බන්ධතාවයකි. ශාකපත්‍රයක සිදුවන උපරිම ඵලදායී ක්‍රියාවලිය හරිත යැයි සලකා, එය ගොඩනැගිලි නිර්මාණය සඳහා ආදේශ කිරීම ලාංඡනයෙන් පෙන්නුම් කෙරේ. පත්‍රයේ නාරටි වින්‍යාසයෙන් දැක්වෙන්නේ හරිත ශ්‍රී ලංකා හි සප්ත සංකල්පයන්ය.

ලාංඡන නිර්මාණය

මහේෂිකා ඒකනායක, රුවනි විජේසිංහ, මහේෂි ගම්ලත් , නදීෂා ඉරංගිකා

රසුල් වනිගසේකර, චතුෂ්ක ඒදිරිසිංහ

පිටකවර නිර්මාණය

කෝසලා තෙන්නකෝන්

ප්‍රකාශනය

ජනාධිපති ලේකම් කාර්යාලය

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
නාගරික සංවර්ධන අධිකාරිය